**2021 අප්‍රේල් මස 27 වන දින පැවති**

**තිස් හය වන මහ සභා රැස්වීමේ කෙටුම්පත් වාර්තාව**

**දිනය :-2021.04.27**

**ස්ථානය :- නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව**

**වේලාව :- පෙ.ව 10.00**

**සහභාගී වූ :-**

| | | | |
|---|---|---|---|
| **01.** | ගරු සභාපති | එස්.බී කුමාරදාස මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **02.** | ගරු උප සභාපති | එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **03.** | ගරු මන්ත්‍රී | කේ.ඒ ශාන්ත මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **04.** | ගරු මන්ත්‍රී | බී.ඒ.ජී.එම්.කේ.ජී.ජී කුමාරි මැතිනිය | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **05.** | ගරු මන්ත්‍රී | බී.බී.ඊ ගයාන් චාමර මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **06.** | ගරු මන්ත්‍රී | කේ.ඒ සංජීව මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **07.** | ගරු මන්ත්‍රී | ජේ.ඒ.ඩී විමලසිරි මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **08.** | ගරු මන්ත්‍රී | ජේ.ඒ ජයවර්ධන මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **09.** | ගරු මන්ත්‍රී | පී.එස්.බී සිරිවර්ධන මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **10.** | ගරු මන්ත්‍රී | පී.ටී සිරිසේන මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **11.** | ගරු මන්ත්‍රී | ආර්.එම් කුමාරසිංහ මැතිතුමා | ( එ.ජා.ප) |
| **12.** | ගරු මන්ත්‍රී | එම්.ඒ විමලසුරේන්ද්‍ර මැතිතුමා | ( එ.ජා.ප) |
| **13.** | ගරු මන්ත්‍රී | ආර්.එම්.අයි ජනක ශ්‍රීමාලි මැතිනිය | ( එ.ජා.ප) |
| **14.** | ගරු මන්ත්‍රී | ජී.ඒ නෙළුම් මැතිනිය | ( එ.ජා.ප) |
| **15.** | ගරු මන්ත්‍රී | ඩී.එම්.එන් සුභාෂිණී බංඩාර මැතිනිය | ( එ.ජා.ප) |
| **16.** | ගරු මන්ත්‍රී | එස්.ඒ.කේ.පී ගුණවර්ධන මැතිතුමා | ( ජ.වි.පෙ) |
| **17.** | ගරු මන්ත්‍රී | කේ. හැරිසෙන්ස් මැතිතුමා | ( ජ.වි.පෙ) |
| **18.** | ගරු මන්ත්‍රී | ඩී.පී බන්දුලසේන මැතිතුමා | ( ශ්‍රී.ල නි.ප) |
| **19.** | ගරු මන්ත්‍රී | පී කරුණාරත්න මැතිතුමා | ( ශ්‍රී.ල නි.ප) |

**දන්වා සහභාගී නොවූ:-**

| | | | |
|---|---|---|---|
| **20.** | ගරු මන්ත්‍රී | එච්.ඩබ්.ජී.එන් කුමුදු වසන්ති මැතිනිය | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **21.** | ගරු මන්ත්‍රී | වයි.එම් ගාමිණී බංඩාර මැතිතුමා | (ස්වාධීන කණ්ඩායම) |

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලා හා ගරු මන්ත්‍රීතුමියන්ලා වෙත සුභ උදෑසනක් ප්‍රාර්ථනය කරමින් ඉතාම ආදරයෙන් ගෞරවයෙන් පිළිගනිමින් හා ලැබුවා වූ අළුත් අවුරුද්ද සාමය සතුට පිරි සුභ නව වසරක් වේවායි ප්‍රාර්ථනය කරමින් න්‍යායපත්‍රානුකූලව සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලද අතර පවතින අයහපත් සෞඛ්‍ය තත්වය මත යම් අපහසුතාවයක් සිදු වී ඇත්නම් ඒ සම්බන්ධව සිය කණගාටුව ප්‍රකාශ කරන ලදී.

අ) මහ සභා වාර්ථාව සභා සම්මත කර ගැනීම.

<u>2021.03.19 මහ සභා කෙටුම්පත් වාර්ථාව</u>

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> 2021.03.19 වන දින පැවැත් වූ මහ සභා රැස්වීමේ කෙටුම්පත් වාර්තාව ප්‍රාදේශීය සභා රීතීන්ට අනුව ඔබ වෙත ලැබීමට සළස්වා ඇති බැවින් එම වාර්ථාවේ අඩුපාඩු ඇත්නම් සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කර ගන්නා ලෙස ප්‍රකාශ කරමින් 2021.03.19 මහ සභා කෙටුම්පත් රැස්වීම් වාර්ථාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරීම සුදුසු බවට යෝජනා කරන ලද අතර ගරු සභාපතිතුමා විසින් හඳුනාගත් සංශෝධන කිහිපයක් ඉදිරිපත් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී කේ.ඒ සංජීව මැතිතුමා</u> 2021.03.19 දින පැවති කෙටුම්පත් වාර්ථාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා කල යෝජනාව ස්ථිර කරන ලදී.

<u>සංශෝදන</u>

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ප්‍රාදේශීය සභාව වෙත අමතා එවන ලද සංදේශ පෙත්සම්, පැමිණිලි සහ සන්නිවේදන යටතේ රජයට අයත් නල ළිඳ සංරක්ෂණය කිරීම ලෙස ලිපිය ඉදිරිපත් කර ඇතත්, එය රජයට අයත් පොදු ළිඳ සංරක්ෂණය කිරීම ලෙසට සංශෝධනය විය යුතු බව සඳහන් කරන ලදී.

තවද <u>ගරු මන්ත්‍රී ජේ.ඒ.ඩී විමලසිරි මැතිතුමා</u> 2021.02.10 වන දින මුදල් කමිටුව මගින් ලබා ගත් නිර්දේශ සඳහා මහ සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ස්ථිර කරන ලදී. යන්න <u>ගරු මන්ත්‍රී කේ.ඒ සංජීව මැතිතුමා</u> 2021.03.05 වන දින මුදල් කමිටුව මගින් ලබා ගත් නිර්දේශ සඳහා මහ සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ස්ථිර කරන ලදී. ලෙසට සංශෝධනය විය යුතු බව සඳහන් කරන ලදී.

අවසාන පිටුවේ මහ සභාව අවසන් කරනු ලැබූ බවට සඳහන් ස්ථානයේ 2020.03.19 වන දින පැවැත්වූ මහ සභා රැස්වීම ප.ව 01.20 ට අවසන් කරන ලද අතර යන සටහන 2021.03.19 වන දින පැවැත්වූ මහ සභා රැස්වීම ප.ව 01.20 ට අවසන් කරන ලද අතර ලෙසට සංශෝධනය විය යුතු බව සඳහන් කරන ලදී.

12 වන යෝජනාව තුල ඇතුලත් ව්‍යාපෘතීන් හි අනුරාධපුර කුරුණෑගල මාර්ගය දෙපස වෙළඳ කුටි 20 ක් ඉදි කිරීම යන්න අනුරාධපුර කුරුණෑගල මාර්ගය දෙපස ජංගම වෙළඳ කුටි 20 ක් ඉදි කිරීම ලෙසට සංශෝධනය විය යුතු බව සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා</u> ගිය සභා වාරයේදී තමා මහ සභාව ණය කාරයෙන් කලා යනුවෙන් සිය හඳවත කම්පා වන ප්‍රකාශයක් ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල නමුත් ඒ සම්බන්ධයෙන් සටහනක් මහ සභා වාර්ථාව තුල සටහන් වී නොමැති බව සඳහන් කරන ලදී.

ඒ අනුව ගරු සභාපතිතුමා විසින් ජයබිම උත්සව ශාලාව ඉදි කිරීම වෙනුවෙන් ගරු හිටපු සභාපතිතුමා ලබා ගත් ණය මුදල හේතුවෙන් තවමත් ප්‍රාදේශිය සභාව ණය ගෙවන බවත්, ලැබී ඇති ආදායම් තත්වය සැළකිල්ලට ගැනීමේදී එම ණය ලබා ගැනීම දැඩි අපරාදයක් සේ හැගෙන බවට කල ප්‍රකාශයට ප්‍රති පිළිතුරු වශයෙන් ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා තමා නැ.නු.ප ප්‍රාදේශිය සභාව ණය කාරයෙකු බවට පත් කිරීමට ගත් උත්සහයක් නොවන බවත්, ආදායම් උත්පාදන වැඩ සටහනක් ලෙස දැඩි වෙහෙසක් දරා මහ සභාවේ උන්නතිය වෙනුවෙන් ණය මුදල ලබා ගෙන ජයබිම උත්සව ශාලාව ඉදි කල බවත්, ගරු සභාපතිතුමා

වගකීමෙන් තොරව කරුණු දැක්වීම සම්බන්ධව කණගාටු වන බවට සඳහන් කරන ලදී . යන ප්‍රකාශය සභා වාර්ථාව තුලට ඇතුලත් වී සංශෝධනය විය යුතු බව සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී කේ හැරිසෙන්ස් මැතිතුමා සඳගම මාර්ගය ප්‍රතිසංස්කරණය සම්බන්ධයෙන් සාකච්ඡාවක් මහ සභාවේදී සිදු වීමකින් තොරව එය වාර්තා ගත කර තිබෙන බව සඳහන් කරමින් එලෙස සිදු නොකල ප්‍රකාශ සභා වාර්තාවට ඇතුලත් කිරීම මින් ඉදිරියට සිදු නොකරන ලෙස ප්‍රකාශ කරන ලදී.

ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා තමන් විසින් ගිය වර මහ සභාවේදී විජයපුර මාර්ගය හා නොළුබෑව නගරය යා කෙරෙන පාලම ඉදි කිරීමට අදාල ව මුල් ගල තැබූ බවට සඳහන් කලත් එය තමන් විසින් මීට ඉහතදී සඳහන් කල පාලම් සියල්ල සඳහා මුල් ගල් තැබූ බවට යන්න සඳහන් කර තිබෙන බැවින්, එය සංශෝධනය විය යතු බවත් සඳහන් කරන ලදී.

ඒ අනුව 2021.03.19 වන දින පැවති මහ සභා කෙටුම්පත් වාර්ථාව ඉදිරිපත් වූ සංශෝධනයන්ට යටත්ව සභා සම්මත විය.

ගරු මන්ත්‍රී බී.ඒ.ජී.එම්.කේ.ජී.ජී කුමාරිහාමී මැතිණිය තමන් වෙත අදහස් දැක්වීම සඳහා අවස්ථාවක් ලබා දෙන ලෙසට ඉල්ලා සිටී අතර න්‍යාය පත්‍රයට අනුව ඒ සඳහා අවස්ථාව මේ අවස්ථාවේ ලබා දීමට නොහැකි බවට ගරු සභාපති තුමා ප්‍රකාශ කරන ලදී. , එහිදී ඇතිවූ උණුසුම් තත්වය හමුවේ සිදු කරනු ලැබූ ප්‍රකාශ කිසිවක් පැහැදිළි නොවිණි.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ප්‍රාදේශීය සභා රීතීන්ට අනුව න්‍යාපත්‍රානුකූලව මහ සභාව ඉදිරියට ගෙන යාම සඳහා කටයුතු කරන ලෙසටත්, ගරු සභිකවරුන්ගේ ගෞරවයට හානි නොවන පරිදී නොහැසිරෙන ලෙසත් ගෞරවයෙන් ඉල්ලා සිටින ලදී.

**ආ) සභාපතිතුමන් විසින් කරනු ලබන විශේෂ නිවේදන.**

**01. නිවාඩු දැනුම් දීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ගරු මන්ත්‍රී කුමුදු වසන්ති මැතිණිය හා ගරු මන්ත්‍රී වයි.එම් ගාමිණී බංඩාර මැතිතුමා මහ සභාවට නොපැමිණෙන බවට දන්වා යොමු කර තිබූ නිවාඩු ඉල්ලීම් ලිපි මහ සභාවට නිවේදනය කරන ලදී.

**ඇ) ප්‍රාදේශීය සභාව වෙත අමතා එවන ලද සංදේශ පෙත්සම්, පැමිණිලි සහ සන්නිවේදන**

**01. 238 ඥාණික්කුලම ගැමුණු එක්සත් ග්‍රාම සංවර්ධන සමිති ශාලාව අළුත්වැඩියා කිරීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා 238 ඥාණික්කුලම ගැමුණු එක්සත් ග්‍රාම සංවර්ධන සමිතිය විසින් සිය සමිති ශාලාව දැනට වසර 1 ½ පමණ කාලයක සිට වහලය කැඩී ගොස් ඇති බවටත්, මෙම සමිති ශාලාව ගමේ ග්‍රාම සංවර්ධන සමිතිය, කාන්තා සමිති, සමෘද්ධි සමිති රැස්වීම ඇතුළු පොදු කටයුතු රැසක් සඳහා පරිහරණය කල ශාලාවක් බවත් ප්‍රකාශ කරමින් එම ශාලාව පිළිසකර කර දීම සඳහා උපකාරයක් සිදු කරන ලෙස ඉල්ලා යොමු කර තිබූ ලිපිය මහ සභාවට ඉදිරිපත් කරන ලදී. අතර ඉදිරියේදී ප්‍රතිපාදන ලැබුණු පසු සභාවට යොමු කර ඇස්තමේන්තුවක් සකස් කර අළුවැඩියාවන් සිදු කිරීමට කටයුතු කරන බව සඳහන් කරන ලදී.

**02.** **පෙර පාසල සඳහා අවශ්‍ය උපකරණ ලබා දීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා 274 උතුරු කළුවිල ග්‍රාම නිළධාරී වසමට අයත්, දකුණු කළුවිල , හිදෝගම ලිපිනයේ බෝමළුව විහාරස්ථානයේ පවත්වාගෙන යනු ලබන සමනල පූර්ව ළමාවිය අධ්‍යාපන සංවර්ධන මධ්‍යස්ථානය බුද්ධිමත් දරුවන් බිහි කරන අධ්‍යාපන ආයතනයක් බැවින් දරුවන්ගේ ආරක්ෂාව හා සෞඛ්‍ය තත්වය කෙරේ සලකා බලා පෙර පාසලේ ආරක්ෂිත ගේට්ටුව සඳහා අවශ්‍ය ආමානේ තහඩු 06 ක් හා සිමෙන්ති කොට්ට 04 ක්ද , පෙර පාසලේ පිරිසිදු කිරීම් සඳහා කසල බඳුන 03 ක්ද ලබා දෙන ලෙසට කර ඇති ඉල්ලීම් ලිපිය සභාවට ඉදිරිපත් කරමින් ඒ සඳහාද ඉදිරියේදී ලැබෙන ප්‍රතිපාදන සැළකිල්ලට ගෙන අවශ්‍ය කටයුතු සිදු කිරීමට බලාපොරොත්තු වන බව සඳහන් කරන ලදී.

**03.** **පෙර පාසල සංවර්ධනය කර ගැනීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ගරු මන්ත්‍රී පී.ටී සිරිසේන මැතිතුමා මගින් පාවක්කුලම, හිදෝගම ලිපිනයේ පිහිටි ශාන්තිවාදී සිහිනි උයන මුල් ළමා විය සංවර්ධන මධ්‍යස්ථානයේ ගුරු පාලිකාව විසින් සිය පෙර පාසලේ පවතින අඩුපාඩු කිහිපයක් ඉදිරිපත් කර ඒ සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කර දෙන කර ඇති ඉල්ලීම් ලිපිය මහ සභාවට ඉදිරිපත් කර ඉදිරියේදී ඉටු කිරීමට අවධානය යොමු කරන බව සඳහන් කරන ලදී.

**04.** **ප්‍රජා ශාලාවේ වහලය සකස් කර දීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ගරු මන්ත්‍රී ජී.ඒ නෙළුම් මැතිණිය විසින් 237 ග්‍රාම නිළධාරී තුලානයේ ඉත්තැවැව ග්‍රාමයේ ප්‍රජා ශාලාව ඉදි කර ඇති නමුත් එහි වහලය දැඩි ලෙස අබලන් වී ඇති හෙයින් එහි වහලය සකස් කර දෙන ලෙස කර ඇති ඉල්ලීම් ලිපිය මහ සභාවට ඉදිරිපත් කරමින් ඉදිරියේදී ලැබෙන ප්‍රතිපාදන සැළකිල්ලට ගෙන ඉටු කර දීමට අවධානය යොමු කරන බව සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා ගරු සභාපති තුමා මහ සභාව, ප්‍රාදේශීය සභා රීතීන්ට අනුව සිදු කරනු ලබන බවට සඳහන් කල බැවින්, ප්‍රාදේශීය සභාව වෙත අමතා එවන ලද සංදේශ පෙත්සම්, පැමිණිලි සහ සන්නිවේදන යටතේ ඉදිරිපත් කරනු ලබන කිසිදු කාර්යයක් ඉටු කිරීමේ හැකියාව හෝ ඒ වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කිරීමේ හැකියාව පවතින්නේද යන්න විමසන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා සභාවට ලැබෙන සෑම ඉල්ලීමක්ම ඉටු කිරීමේ හැකියාවක් නොමැති බවත්, මේ යටතේ ඉදිරිපත් කරන ලිපි තුල වූ ඉල්ලීම් ඉටු කිරීමට නොහැකි වුවත්, ප්‍රතිපාදන ලැබුණු පසු නැවත සභාවට යෝජනා යටතේ ඉදිරිපත් කර තීරණයක් ලබා ගන්නා බවත්. එසේ නොමැතිව මෙම ලිපි යෝජනා යටතේ ඉදිරිපත් කල පසු මාස 06 ක් තුල ක්‍රියාත්මක කල යුතු වන සේම, යෝජනා ක්‍රියාත්මක කිරීමේ හැකියාවක් නොමැති වීම මත යෝජනා ක්‍රියාත්මක නොකරන චෝදනාවට ලක් වන බව කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

තවද යෝජනාවක් ඉදිරිපත් කිරීමේදී ඊට අදාල රීති ප්‍රමාණයක් පවතින බවත්, මහ සභාව ආරම්භ වීමෙන් පසු ලැබෙන ලිපි යෝජනා යටතේ ඉදිරිපත් කර තීරණ ගැනීමේ හැකියාවක් නොමැති බවද සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා ජනතාව ඉල්ලීම් කර ඉල්ලීම් යෝජනා යටතේ ඉදිරිපත් කිරීමට තිබියදී, සංදේශ පෙත්සම් යටතේ ඉදිරිපත් කරමින් හිතාමාතාම බල ප්‍රදේශයේ ජනතාව හා ස්වේච්ඡා සංවිධාන නායකයන් නොමඟ යවා ඇති බවත්,මින් ඉදිරියට හෝ මේ කාර්යය නතර කරන ලෙසත් ප්‍රකාශ කරන ලදී.

**ඈ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්ණ**

**01. කවරක්කුලම කඩ කාමර හා ජයබිම උත්සවය ශාලාව බදු දීමට අදාල ගිවිසුම් පත්‍ර සභා ගත කිරීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ගරු මන්ත්‍රීතුමන්ලා විසින් දිගින් දිගටම කරන ලද ඉල්ලීම් සැළකිල්ලට ගෙන කවරක්කුලම කඩ කාමර හා ජයබිම උත්සව ශාලාව බදු දීමට අදාල ගිවිසුම් පත්‍ර සභා ගත කිරීමට කටයුතු කරන බව ප්‍රකාශ කරමින් එම ගිවිසුම් සභා ගත කරන ලදී.

ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා කවරක්කුලම කඩ කාමර සම්බන්ධයෙන් 2018 මැයි මස මහ සභාවේදී 2017 වර්ෂයේ බදු කරුවන් වෙතම 2018 වර්ෂය සඳහාත් ලබා දීම සුදුසු බවට යෝජනාවක් ලබා ගත් නමුත් එය නීත්‍යානුකුලව ගෙන ඇතිද යන්න සම්බන්ධයෙන් පරීක්ෂා කර බැලිය යුතු බව සඳහන් කරමින් කවරක්කලම කඩ කාමර බදු දීමට අදාල ගොණු අධ්‍යනය කිරීම සිදු කරන ලදී.

**ඉ) යථා පරිදී කල් දී ඇති යෝජනා**

**01. නැගෙනහිර නුවරගම් පළාත් ප්‍රාදේශීය සභාවට අයත්, ව්‍යාපාර ස්ථාන දීර්ඝ කාලීන බදු පදනම මත දැනට ව්‍යාපාර පවත්වාගෙන යනු ලබන ව්‍යාපාරිකයන් වෙතම ලබා දිම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා නැගෙනහිර නුවරගම් පලාත ප්‍රාදේශීය සභාවට අයත් ව්‍යාපාර ස්ථාන දීර්ඝ කාලීන බදු පදනම මත දැනට ව්‍යාපාර පවත්වාගෙන යනු ලබන ව්‍යාපාරිකයන් වෙතම ලබා දීමට සුදුසු බවට කරන යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලදී.

- 7 ඇල කඩ කාමර 1995 වර්ෂයේ දී එම ස්ථාන වල තෝරා ගත් ව්‍යාපාරිකයන් පිරිසකට ලබා දී ඇත. එදා මෙදාතුර එම ගිවිසුම යාවත්කාලීන වී නොමැති තත්වය තුල නීතිමය වශයෙන් කටයුතු කිරීමේ දී භූමිය සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභා අයිතිය ගැටළු සහගත තතත්වයකට පත්ව ඇති බැවින් දැනට ව්‍යාපාර කටයුතු කරන අය ව්‍යාපාර බදු ගෙවුව ද එම ගිවිසුම් යථාවත් කිරීමට ඉදිරිපත් නොවේ. මෙයට හේතු වී ඇත්තේ එම මුල් ගිවිසුමේ අදාල දින වකවානු නිසි ලෙස සඳහන් කර නොමැති වීමයි.

- ශ්‍රාවස්තිපුර කඩ කාමර 1990 දී ලබා දී තිබුණද එහිද යාවත්කාලීන කිරීමක් සිදුවී නැත. එම ව්‍යාපාරකයින්ටද නැ.නු.ප ප්‍රාදේශීය සභාව නඩු පැවරීම සඳහා කටයුතු කලද එහිදී ප්‍රාදේශීය සභාවට නීතිමය වශයෙන් අයිතිය නොමැති වීම ගැටළුවක්ව පවතී,මේ වන විට ව්‍යාපාරිකයන් ද කඩ බදු ගෙවමින් පවත්වාගෙන යන නමුත් යාවත්කාලීන වී නොමැත.

- විජයපුර ප්‍රාදේශීය සභා භූමියේ පිහිටි කඩ කාමර ටෙන්ඩර් මඟින් ලබා දීම සිදු කළ ද එම ව්‍යාපාරය ද පවත්වාගෙන යන පිරිස විසින් මෙම බදු දීම තුල තමාට විශාල අසාධාරණයක් සිදුවන බැවින් තම ව්‍යාපාර බිඳ වැටීමෙන් අසරණ වන නිසා දීර්ඝ කාලීන බදු ලබා දෙන ලෙස ඉල්ලා සිටී.

- කවරක්කුලම කඩකාමර ඉදිකර ඇති භූමියද නීත්‍යානුකූලව සභා සතු නොවන බවත්, එම කඩ හිමියන් තමන් මෙම භූමිය පාළු පිටියක් ලෙස තිබුණ දින සිට ව්‍යාපාර වල ආදායමක් නොතිබුණ කාලයේ පටන් ඉතා අපහසුවෙන් ව්‍යාපාර රඳවාගෙනවිත් දියුණු කර ඇත. මුල් අවධියේ ටෙන්ඩර් මඟින් ලබා දීමට ද නොහැකි තත්වයක පැවති ස්ථානයක් බවත් එහි ඉහල මහලය අදටද එම තතවයෙන් ම පවතින බවත් ඒ තුළ අප විසින් විසින් දිගින් දිගටම මෙම ව්‍යාපාර ස්ථාන දීර්ඝ කාලීන බදු පදනම මත ලබා දීමට ඉල්ලීම් කිරීම තුල හිටපු උතුරු මැද පලාත් ප්‍රධාන අමාත්‍යතුමා විසින් වසර තුනක් සඳහා බදු දීමට අනුමැතිය ලබා

දීම පදනම් කර ප්‍රාදේශීය සභාවේ මහ සභාව විසින් එය අනුමත කර ඇති බවත් ඊට පසු හිටපු ලේකම් විසින් වෙනත් අයට බදු දීම තුල ඔවුන් එයින් ඉවත් කිරීම තුල අධිකරණයට ගිය බවත් එහි තීන්දුව ලබා දීමට පෙර දැනට පවත්වාගෙන යන ප්‍රාදේශීය සභා පරිපාලනය විසින් සභාව වෙතින් ඉල්ලීම් කිරීමේ ප්‍රථිපලයක් ලෙස ඔවුන්ට ව්‍යාපාර ඉදිරියට කරගෙන යාමට අවසර ලබා දී ඇත. එතනින් නොනැවතුන මෙම ව්‍යාපාරිකයන් ආණ්ඩුකාර තුමා වෙත දීර්ඝ කාලීන බදු පදනම මත ලබා දෙන ලෙස ඉල්ලීම් කර ඇත. මෙය සැලකිල්ලට ගෙන ආණ්ඩුකාරතුමා විසින් පලාත් පාලන කොමසාරිස්තුමාට මෙය නීත්‍යානුකූලව දීර්ග කාලීන බදු ලබා දෙන ලෙස ඉල්ලා ඇත. ඒ අනුව මෙයට අදාළ ලිපි ලේඛණ සකස් කර පලාත් පාලන කොමසාරිස්තුමා වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව මේ සඳහා සභා තීන්දුවක් ගෙන ගිවිසුම් පිටපත සමඟ ඉදිරිපත් කරන ලෙසට දැනුම් දී ඇත.

මේ සියල්ල සැලකිල්ට ගෙන නැ.නු.ප.ප්‍රාදේශීය සභාව සතු 7 ඇල කඩ කාමර, ශ්‍රාවස්තිපුර කඩ කාමර, විජයපුර ප්‍රාදේශීය සභා භූමියේ කඩ කාමර හා කවරක්කුලම කඩ කාමර දීර්ගකාලීන බදු පදනම මත ලබා දීම සුදුසු බවට මෙයින් යෝජනා කරමි.

තවද මෙහි දී දක්වන තක්සේරු මුදල සැළකිල්ලට ගෙන බදු මුදල සංශෝධනයට යටත් විය යුතු වන අතර වාර්ෂිකව ගිවිසුම් ගත කල යුතු බවත් සඳහන් කරන ලදී. අනතුරුව ගරු සභාපතිතුමා විසින් ප්‍රාදේශීය සභාවට අයත් සියළු කඩ කාමර ආරම්භ කල දින සිට මේ දක්වා වූ විස්තර වාර්ථාව සභාවට ඉදිරිපත් කරන ලදී.

| අනු අංකය | බදු හා කුලී සාමාජිකයාගේ නම | ආරම්භක බදු දුන් දිනය හා ස්ථානය | බදු කාලය | කඩ කාමර සම්බන්ධ ගෙන ඇති තීරණ | වර්ථමාන තත්වය |
|---|---|---|---|---|---|
| | | | | ශ්‍රාවස්තිපුර කඩ කාමර | |
| අංක 01 | ඩී.ජී.සර්ධාර ත්න | 1989.12.ව න මාසයට පෙර සිට | ගිවිසුම් කාලයක් සදහන් කර නොමැත | ගිවිසුම් අත්සන් කර ඇත කාලයක් සදහන් කර නොමැත | පී.ඩී.එම්.තිය ඩෝරා විසින් මෙම කඩ කාමරය පවත්වාගන යනු ලබයි |
| | | | | 1991 ජනවාරි මස සිට රු.150 දක්වා කඩ කුලිය වැඩිකර ඇත(1991.02.18 දිනැති ලිපිය මඟින්) | |
| | | | | 1992 ජනවාරි මස සිට රු.200 දක්වා කඩ කුලිය වැඩිකර ඇත(1992.02.11 දිනැති ලිපිය මඟින්) | |
| | | | | 1996.08.22 දින නව ගිවිසුම් අත්සන් කිරිමට පැමිණෙන ලෙස ලිඛිතව දන්වා ඇත ගිවිසුම් අත්සන් කර නොමැත | |
| | | | | 1996.10.01 දින නව ගිවිසුම් අත්සන් කිරිමට පැමිණෙන ලෙස ලිඛිතව දන්වා ඇත ගිවිසුම් අත්සන් කර නොමැත | |
| | | | | 1997 ජුලි මස සිට රු.300 දක්වා කඩ කුලිය වැඩිකර ඇත(1997.06.23 දිනැති ලිපිය මඟින්) | |
| | | | | 2000 වර්ෂයේදී මහබදුගේ සුමුදු සම්පත් ප්‍රනාන්දු මහතා හට මෙම කඩ කාමරය පවරා දෙන ලෙස ඉල්ලීම් කර ඇත,2000.04.28 දින මුදල් කමිටු කාරක සභාවේදී වෙනම ගිවිසුමක් මගින් එම්.එස්.එස්.ප්‍රනාන්දු යන අයට පවරා දීමට තීරණය කර ඇත | |
| | එම්.එස්.එස්.ප්‍ර නාන්දු | 2001.10.1 6 | ගිවිසුම් කාලයක් සදහන් කර නොමැත | එම් එස් එස් ප්‍රනාන්දු යන අය සමග 2001.10.16 දින නව ගිවිසුමකට එළඹ ඇත | |
| | | | | 2004 ජනවාරි මස සිට රු.500 දක්වා කඩ කුලිය වැඩිකර ඇත(2004.01.19 දිනැති ලිපිය මඟින්) | |
| | | | | 2005.08.04 දින නව ගිවිසුම් අත්සන් කිරිමට පැමිණෙන ලෙස ලිඛිතව දන්වා ඇත ගිවිසුම් අත්සන් | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | කර නොමැත | |
| | | | | 2013.07.23 දින නව ගිවිසුම් අත්සන් කිරිමට පැමිණෙන ලෙස ලිඛිතව දන්වා ඇත ගිවිසුම් අත්සන් කර නොමැත | |
| | | | | 2014 මැයි මස සිට රු.1500 දක්වා කඩ කුලිය වැඩිකර ඇත(2014.06.13 දිනැති ලිපිය මඟින්) | |
| | | | | 2015.06.30 දින නව ගිවිසුම් අත්සන් කිරිමට පැමිණෙන ලෙස ලිඛිතව දන්වා ඇත ගිවිසුම් අත්සන් කර නොමැත | |
| | | | | 2016.05.18 දින නව ගිවිසුම් අත්සන් කිරිමට පැමිණෙන ලෙස ලිඛිතව දන්වා ඇත ගිවිසුම් අත්සන් කර නොමැත | |
| | | | | 2016.10.10 දින එම්.එස්.එස්.පුනාන්දු යන අය විසින් ඔහුගේ මව වන පී.ඩී.එම්.තියඩෝරා යන අයට කඩය පැවරීමට ඉල්ලීම් කර ඇති අතර එම ලිපියේ ඉදිරි කටයුතු කරන ලෙස සටහන් යොදා ඇත | |
| | | | | 2016.11.11 දින මෙම කඩ කාමරය පී.ඩී.එම්.තියඩෝරා හට පවරා දුන් බව සභාව තීරණය කර ඇති බව දන්වා ඇත. | |
| | පී.ඩී.එම්.තිය ඩෝරා | 2016.11.2 9 | 2016.11. 29 සිට 2021.11. 29 දක්වා | 2016.11.29 දින ඉදිරි වසර 05 දක්වා නව ගිවිසුම් පී.ඩී.එම්.තියඩෝරා අත්සන් කර ඇත. | |
| | | | | | |
| අංක 02 කඩ කාමරය | ආර්.එම්.විජයර ත්න | 1988.04.0 1 | ගිවිසුම් කාලයක් සඳහන් කර නොමැත | ගිවිසුම් අත්සන් කර ඇත කාලයක් සඳහන් කර නොමැත | |
| | | | | 1991 ජනවාරි මස සිට රු.150 දක්වා කඩ කුලිය වැඩිකර ඇත(1991.02.18 දිනැති ලිපිය මඟින්) | |
| | | | | 1992 ජනවාරි මස සිට රු.200 දක්වා කඩ කුලිය වැඩිකර ඇත(1992.02.11 දිනැති ලිපිය මඟින්) | |
| | | | | 1996.08.22 දින නව ගිවිසුම් අත්සන් කිරිමට පැමිණෙන ලෙස ලිඛිතව දන්වා ඇත ගිවිසුම් අත්සන් කර නොමැත | |
| | | | | 1996 ඔක්තොබර් මස 01 දින නව ගිවිසුමක් අත්සන් කර ඇත එම ගිවිසුමේ ගිවිසුම් කාලයක් සඳහන් කර නොමැත | ආර්.එම් ජයවර්ධන විසින් මෙම කඩ කාමරය පවත්වාගන යනු ලබයි |
| | | | | 1997 ජුලි මස සිට රු.300 දක්වා කඩ කුලිය වැඩිකර ඇත(1997.06.23 දිනැති ලිපිය මඟින්) | |
| | | | | 2004 ජනවාරි මස සිට රු.500 දක්වා කඩ කුලිය වැඩිකර ඇත(2004.01.19 දිනැති ලිපිය මඟින්) | |
| | | | | 2007.01.20 දින මෙම කඩ කාමරය පවත්වාගන යා නොහැකි ලෙස දන්වා දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කර ඇති අතර එහි ආර්.එම්.ජයවර්ධන යන අයට මෙම කඩය පවරන ලෙස ඉල්ලීම් කර ඇත | |
| | | | | 2007.02.27 දින මහ සභාවේදී බහුතර ඡන්දයෙන් මෙම කඩය ආර්.එම්.ජයවර්ධන හට පවරා දීමට තීරණය වී ඇත | |
| | ආර්.එම්.ජයව ර්ධන | 2007.03.0 7 | ගිවිසුම් කාලයක් සඳහන් කර නොමැත | 2007.03.07 දින නව ගිවිසුම අත්සන් කර ඇත | |
| | | | | 2014 මැයි මස සිට රු.1500 දක්වා කඩ කුලිය වැඩිකර ඇත(2014.06.13 දිනැති ලිපිය මඟින්) | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | 2015.06.30 දින නව ගිවිසුම් අත්සන් කිරිමට පැමිණෙන ලෙස ලිඛිතව දන්වා ඇත ගිවිසුම් අත්සන් කර නොමැත | |
| | | | | 2016.05.18 දින නව ගිවිසුම් අත්සන් කිරිමට පැමිණෙන ලෙස ලිඛිතව දන්වා ඇත ගිවිසුම් අත්සන් කර නොමැත | |
| | | | | 2019.12.02 දින නව ගිවිසුම් අත්සන් කිරිමට පැමිණෙන ලෙස ලිඛිතව දන්වා ඇත ගිවිසුම් අත්සන් කර නොමැත | |
| | | | | 2020.01.08 දින නව ගිවිසුම් අත්සන් කිරිමට පැමිණෙන ලෙස ලිඛිතව දන්වා ඇත ගිවිසුම් අත්සන් කර නොමැත | |
| කඩ කාමර අංක 03 | ඊ.සී.කමලාවතී | 1989.12.ව න මාසයට පෙර සිට | ගිවිසුම් කාලයක් සදහන් කර නොමැත | ගිවිසුම් අත්සන් කර ඇත කාලයක් සදහන් කර නොමැත | |
| | | | | 1991 ජනවාරි මස සිට රු.150 දක්වා කඩ කුලිය වැඩිකර ඇත(1991.02.18 දිනැති ලිපිය මඟින්) | |
| | | | | 1992 ජනවාරි මස සිට රු.200 දක්වා කඩ කුලිය වැඩිකර ඇත(1992.02.11 දිනැති ලිපිය මඟින්) | |
| | | | | 1996.08.22 දින නව ගිවිසුම් අත්සන් කිරිමට පැමිණෙන ලෙස ලිඛිතව දන්වා ඇත ගිවිසුම් අත්සන් කර නොමැත | |
| | | | | 1996.09.01 දින නව ගිවිසුමක් අත්සන් කර ඇත එම ගිවිසුමේ ගිවිසුම් කාලයක් සදහන් කර නොමැත | |
| | | | | 1997 ජූලි මස සිට රු.300 දක්වා කඩ කුලිය වැඩිකර ඇත(1997.06.23 දිනැති ලිපිය මඟින්) | ඊ.සී.කමලාවතී විසින් මෙම කඩ කාමරය පවත්වාගන යනු ලබයි |
| | | | | 2004 ජනවාරි මස සිට රු.500 දක්වා කඩ කුලිය වැඩිකර ඇත(2004.01.19 දිනැති ලිපිය මඟින්) | |
| | | | | 2005.08.04 දින නව ගිවිසුම් අත්සන් කිරිමට පැමිණෙන ලෙස ලිඛිතව දන්වා ඇත ගිවිසුම් අත්සන් කර නොමැත | |
| | | | | 2013.07.23 දින නව ගිවිසුම් අත්සන් කිරිමට පැමිණෙන ලෙස ලිඛිතව දන්වා ඇත ගිවිසුම් අත්සන් කර නොමැත | |
| | | | | 2014 මැයි මස සිට රු.1500 දක්වා කඩ කුලිය වැඩිකර ඇත(2014.06.13 දිනැති ලිපිය මඟින්) | |
| | | | | 2015.06.30 දින නව ගිවිසුම් අත්සන් කිරිමට පැමිණෙන ලෙස ලිඛිතව දන්වා ඇත ගිවිසුම් අත්සන් කර නොමැත | |
| | | | | 2019.12.02 දින නව ගිවිසුම් අත්සන් කිරිමට පැමිණෙන ලෙස ලිඛිතව දන්වා ඇත ගිවිසුම් අත්සන් කර නොමැත | |
| | | | | 2020.01.08 දින නව ගිවිසුම් අත්සන් කිරිමට පැමිණෙන ලෙස ලිඛිතව දන්වා ඇත ගිවිසුම් අත්සන් කර නොමැත | |
| කඩ කාමර අංක 04 | ඒ.ඒ.දිසානාය ක | 1989.12.ව න මාසයට පෙර සිට | ගිවිසුම් කාලයක් සදහන් කර නොමැත | ගිවිසුම් අත්සන් කර ඇත කාලයක් සදහන් කර නොමැත | ඒ.ඒ.දිසානායක විසින් මෙම කඩ කාමරය පවත්වාගන යනු ලබයි |
| | | | | 1991 ජනවාරි මස සිට රු.150 දක්වා කඩ කුලිය වැඩිකර ඇත(1991.02.18 දිනැති ලිපිය මඟින්) | |
| | | | | 1992 ජනවාරි මස සිට රු.200 දක්වා කඩ කුලිය වැඩිකර ඇත(1992.02.11 දිනැති ලිපිය මඟින්) | |
| | | | | 1996.08.22 දින නව ගිවිසුම් අත්සන් කිරිමට පැමිණෙන ලෙස ලිඛිතව දන්වා ඇත ගිවිසුම් අත්සන් කර නොමැත | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | 1996.11.13 දින නව ගිවිසුමක් අත්සන් කර ඇත එම ගිවිසුමේ ගිවිසුම් කාලයක් සඳහන් කර නොමැත | |
| | | | | 1997 ජුලි මස සිට රු.300 දක්වා කඩ කුලිය වැඩිකර ඇත(1997.06.23 දිනැති ලිපිය මඟින්) | |
| | | | | 2004 ජනවාරි මස සිට රු.500 දක්වා කඩ කුලිය වැඩිකර ඇත(2004.01.19 දිනැති ලිපිය මඟින්) | |
| | | | | 2005.08.04 දින නව ගිවිසුම් අත්සන් කිරිමට පැමිණෙන ලෙස ලිඛිතව දන්වා ඇත ගිවිසුම් අත්සන් කර නොමැත | |
| | | | | 2013.07.23 දින නව ගිවිසුම් අත්සන් කිරිමට පැමිණෙන ලෙස ලිඛිතව දන්වා ඇත ගිවිසුම් අත්සන් කර නොමැත | |
| | | | | 2014 මැයි මස සිට රු.1500 දක්වා කඩ කුලිය වැඩිකර ඇත(2014.06.13 දිනැති ලිපිය මඟින්) | |
| | | | | 2015.06.30 දින නව ගිවිසුම් අත්සන් කිරිමට පැමිණෙන ලෙස ලිඛිතව දන්වා ඇත ගිවිසුම් අත්සන් කර නොමැත | |
| | | | | 2016.05.18 දින නව ගිවිසුම් අත්සන් කිරිමට පැමිණෙන ලෙස ලිඛිතව දන්වා ඇත ගිවිසුම් අත්සන් කර නොමැත | |
| | | | | 2019.12.02 දින නව ගිවිසුම් අත්සන් කිරිමට පැමිණෙන ලෙස ලිඛිතව දන්වා ඇත ගිවිසුම් අත්සන් කර නොමැත | |
| | | | | 2020.01.08 දින නව ගිවිසුම් අත්සන් කිරිමට පැමිණෙන ලෙස ලිඛිතව දන්වා ඇත ගිවිසුම් අත්සන් කර නොමැත | |
| කඩ කාමර අංක 05 | එම්.එම්.නන්ද න මුණසිංහ | 1995.05.2 4 | ගිවිසුම් කාලයක් සඳහන් කර නොමැත | ගිවිසුම් අත්සන් කර ඇත කාලයක් සඳහන් කර නොමැත | ප්‍රියන්ත ලමාහේවා විසින් මෙම කඩ කාමරය පවත්වාගන යනු ලබයි |
| | | | | 2004 ජනවාරි මස සිට රු.500 දක්වා කඩ කුලිය වැඩිකර ඇත(2004.01.19 දිනැති ලිපිය මඟින්) | |
| | | | | 2002.02.28 දින මෙම කඩ කාමරය ආර්.අයි.ආරියසේන යන අයටපවරා දෙන ලෙස ඉල්ලීම් කර ඇත. | |
| | ආර්.අයි ආරියසේන | 2005.05.0 2 | ගිවිසුම් කාලයක් සඳහන් කර නොමැත | ආර්.අයි.ආරියසේන යන අය සමඟ 2005.05.02 දින ගිවිසුම් ගතවී ඇත.කාලයක් සඳහන් වී නොමැත. | |
| | | | | 2006.04.03 දින ආර්.අයි.ආරියසේන යන අය මියගොස් ඇති අතර එම කඩය ඔහුගේ පුතකු වන ආර්.ආනන්ද සරත්චන්ද්‍ර මහතා ඉල්ලුම් කරයි. | |
| | ආර්.ඒ.සරත්ච න්ද්‍ර | 2006.11.1 5 | ගිවිසුම් කාලයක් සඳහන් කර නොමැත | 2006.11.15 දින ආර්.ඒ.සරත්චන්ද්‍ර මහ්තා සමඟ ගිවිසුම් ගත වීම. | |
| | | | | 2008.10.29 දින ආර්.ඒ.සරත්චන්ද්‍ර විසින් ප්‍රියන්ත ලමාහේවා යන අයට මෙම කඩ කාමරය පවරා දෙන ලෙස ඉල්ලීම්කර ඇත | |
| | ප්‍රියන්ත ලමාහේවා | 2010.08.0 9 | ගිවිසුම් කාලයක් සඳහන් කර නොමැත | 2010.08.09 දින ප්‍රියන්ත ලමාහේවා යන අය සමග ගිවිසුම් ගත වීම | |
| | | | | 2013.07.23 දින නව ගිවිසුම් අත්සන් කිරිමට පැමිණෙන ලෙස ලිඛිතව දන්වා ඇත ගිවිසුම් අත්සන් කර නොමැත | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | 2014 මැයි මස සිට රු.1500 දක්වා කඩ කුලිය වැඩිකර ඇත(2014.06.13 දිනැති ලිපිය මඟින්) | |
| | | | | 2015.06.30 දින නව ගිවිසුම් අත්සන් කිරිමට පැමිණෙන ලෙස ලිඛිතව දන්වා ඇත ගිවිසුම් අත්සන් කර නොමැත | |
| | | | | 2016.05.18 දින නව ගිවිසුම් අත්සන් කිරිමට පැමිණෙන ලෙස ලිඛිතව දන්වා ඇත ගිවිසුම් අත්සන් කර නොමැත | |
| | | | | 2019.12.02 දින නව ගිවිසුම් අත්සන් කිරිමට පැමිණෙන ලෙස ලිඛිතව දන්වා ඇත ගිවිසුම් අත්සන් කර නොමැත | |
| | | | | 2020.01.08 දින නව ගිවිසුම් අත්සන් කිරිමට පැමිණෙන ලෙස ලිඛිතව දන්වා ඇත ගිවිසුම් අත්සන් කර නොමැත | |
| කඩ කාමර අංක 06 | නන්දා කුරුනේරු | 1997.04.22 | ගිවිසුම් කාලයක් සදහන් කර නොමැත | ගිවිසුම් අත්සන් කර ඇත කාලයක් සදහන් කර නොමැත | නන්දා කුරුනේරු විසින් මෙම කඩ කාමරය පවත්වාගන යනු ලබයි |
| | | | | 1997.07.08 දින නව ගිවිසුම් අත්සන් කිරිමට පැමිණෙන ලෙස ලිඛිතව දැනුම් දී ඇත | |
| | | | | 2004 ජනවාරි මස සිට රු.500 දක්වා කඩ කුලිය වැඩිකර ඇත(2004.01.19 දිනැති ලිපිය මඟින්) | |
| | | | | 2005.08.04 දින නව ගිවිසුම් අත්සන් කිරිමට පැමිණෙන ලෙස ලිඛිතව දන්වා ඇත ගිවිසුම් අත්සන් කර නොමැත | |
| | | | | 2013.07.23 දින නව ගිවිසුම් අත්සන් කිරිමට පැමිණෙන ලෙස ලිඛිතව දන්වා ඇත ගිවිසුම් අත්සන් කර නොමැත | |
| | | | | 2014 මැයි මස සිට රු.1500 දක්වා කඩ කුලිය වැඩිකර ඇත(2014.06.13 දිනැති ලිපිය මඟින්) | |
| | | | | 2015.06.30 දින නව ගිවිසුම් අත්සන් කිරිමට පැමිණෙන ලෙස ලිඛිතව දන්වා ඇත ගිවිසුම් අත්සන් කර නොමැත | |
| | | | | 2016.05.18 දින නව ගිවිසුම් අත්සන් කිරිමට පැමිණෙන ලෙස ලිඛිතව දන්වා ඇත ගිවිසුම් අත්සන් කර නොමැත | |
| | | | | 2019.12.02 දින නව ගිවිසුම් අත්සන් කිරිමට පැමිණෙන ලෙස ලිඛිතව දන්වා ඇත ගිවිසුම් අත්සන් කර නොමැත | |
| | | | | 2020.01.27 දින නව ගිවිසුම් අත්සන් කිරිමට පැමිණෙන ලෙස ලිඛිතව දන්වා ඇත ගිවිසුම් අත්සන් කර නොමැත | |
| කඩ කාමර අංක 07 | වින්සර් කුරුනේරු | 1995.04.22 | ගිවිසුම් කාලයක් සදහන් කර නොමැත | ගිවිසුම් අත්සන් කර ඇත කාලයක් සදහන් කර නොමැත | චන්දිමා විලාසිනි මානවඩු විසින් මෙම කඩ කාමරය පවත්වාගන යනු ලබයි |
| | | | | 2004 ජනවාරි මස සිට රු.500 දක්වා කඩ කුලිය වැඩිකර ඇත(2004.01.19 දිනැති ලිපිය මඟින්) | |
| | | | | 2004.12.15 දින ප්‍රියන්ත ලමාහේවා යන අයට මෙම කඩය පවරා දෙන ලෙස ලිඛිත ඉල්ලීමක් කිරිම. | |
| | | | | 2005.08.04 දින නව ගිවිසුම් අත්සන් කිරිමට පැමිණෙන ලෙස ලිඛිතව දන්වා ඇත ගිවිසුම් අත්සන් කර නොමැත | |
| | | | | 2008.10.28 පැවති මහ සභාවේදි වින්සන් කුරුනේරු යන අයගේ දියණියක් වන චන්දිමා විලාසිනි මානවඩු යන අයට පැවරීමට ඒකමතිකව තීරණය වී ඇත | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | චන්දිමා විලාසිනි මානවඩු | 1995.04.22 | ගිවිසුම් කාලයක් සඳහන් කර නොමැත | 2010.08.09 චන්දිමා විලාසිනි මානවඩු යන අය සමඟ ගිවිසුම්ගතවීම.ගිවිසුම් කාලයක් සඳහන් කර නොමැත | |
| | | | | 2013.07.23 දින නව ගිවිසුම් අත්සන් කිරීමට පැමිණෙන ලෙස ලිඛිතව දන්වා ඇත ගිවිසුම් අත්සන් කර නොමැත | |
| | | | | 2014 මැයි මස සිට රු.1500 දක්වා කඩ කුලිය වැඩිකර ඇත(2014.06.13 දිනැති ලිපිය මගින්) | |
| | | | | 2015.06.30 දින නව ගිවිසුම් අත්සන් කිරීමට පැමිණෙන ලෙස ලිඛිතව දන්වා ඇත ගිවිසුම් අත්සන් කර නොමැත | |
| | | | | 2016.05.18 දින නව ගිවිසුම් අත්සන් කිරීමට පැමිණෙන ලෙස ලිඛිතව දන්වා ඇත ගිවිසුම් අත්සන් කර නොමැත | |
| | | | | 2019.12.02 දින නව ගිවිසුම් අත්සන් කිරීමට පැමිණෙන ලෙස ලිඛිතව දන්වා ඇත ගිවිසුම් අත්සන් කර නොමැත | |
| | | | | 2020.01.27 දින නව ගිවිසුම් අත්සන් කිරීමට පැමිණෙන ලෙස ලිඛිතව දන්වා ඇත ගිවිසුම් අත්සන් කර නොමැත | |
| කඩ කාමර අංක 08 | ඩබ්ලිව්.ඒ.රංජිත් පෙරේරා | 2020.02.13 | 2020.02.13 සිට 2020.12.31 දක්වා | 2019.12.13 දින එච්.ඒ.ගමආරච්චි යන අයගෙන් කඩය පවරා ගැනීම සඳහා ලිඛිතව ලේකම්තුමා මගින් සභාපතිතුමන් දැනුවත් කර ඇත. | |
| | . | | | බදු පදනම මත ටෙන්ඩර් කර ලබා දී ඇත.ඩබ්ලිව්.ඒ.රංජිත් පෙරේරා යන අය විසින් මෙම ටෙන්ඩරය ලබාගන ඇත.2020.02.13 දින ගිවිසුම් ගතවී ඇත. | |
| | | | | ටෙන්ඩර් බදු මුදල රු.24000.00. | |
| | | | 2021.01.01 සිට 2021.12.31 දක්වා | 2021 වර්ශය සඳහා ගිවිසුම පමනක් අළුත් කර ඩබ්ලිව්.ඒ.රංජිත් පෙරේරා යන අයට 20% බදු මුදල වැඩිකර මෙම කඩ කාමරය නැවත ලබා දී ඇත. | ඩබ්ලිව්.ඒ.රංජිත් පෙරේරා විසින් මෙම කඩ කාමරය පවත්වාගන යනු ලබයි |
| | | | | 2021 වර්ශය සඳහා බදු මුදල රු.28800.00,2021.01.01 ගිවිසුම් අත්සන් කර ඇත. | |
| කඩ කාමර අංක 09 | ඩබ්ලිව්.ජී.සුමිත් සමිඳ කුමාරසිරි | 2020.02.10 | 2020.02.10 සිට 2020.12.31 දක්වා | 2019.12.13 දින පී.ඒ.කමලරත්න යන අයගෙන් කඩය පවරා ගැනීම සඳහා ලිඛිතව ලේකම්තුමා මගින් සභාපතිතුමන් දැනුවත් කර ඇත. | |
| | | | | 2020.01.17 දින කඩය පවරාගන ඇත. | |
| | | | | බදු පදනම මත ටෙන්ඩර් කර ලබා දී ඇත.ඩබ්ලිව්.ජී.එස්.එස්.කුමාරසිරි යන අය විසින් මෙම ටෙන්ඩරය ලබාගන ඇත.2020.02.10 දින ගිවිසුම් ගතවී ඇත. | |
| | | | | 2021 වර්ශය සඳහා ගිවිසුම පමනක් අළුත් කර ඩබ්ලිව්.ජී.එස්.එස්.කුමාරසිරි යන අයට 20% බදු මුදල වැඩිකර මෙම කඩ කාමරය නැවත ලබා දී ඇත. | ඩබ්ලිව්.ජී.සුමිත් සමිඳ කුමාරසිරි විසින් මෙම කඩ කාමරය පවත්වාගන යනු ලබයි |
| | | | | 2021 වර්ශය සඳහා බදු මුදල රු.19200.00,2021.01.01 ගිවිසුම් අත්සන් කර ඇත. | |
| කඩ කාමර අංක 10 | කේ.ඒ ගුණසේකර | 1995.04.22 | ගිවිසුම් කාලයක් සඳහන් කර නොමැත | මාසික කඩ කුලිය රු 300 කි. | ටී.රව් ඥාණලතා යන අය 2006.11 දින ඇති කර ගත් ගිවිසුම මත මෙම කඩ කාමරය පවත්වාගෙන |
| | | | | 1997.07.22 දින නඩු පැවරීම සඳහා කටයුතු කර ඇත. | |
| | | | | 2004.01.19 දින කඩ කාමර කුලිය රු 500 ලෙස | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | සංශෝධනය කර ලිඛිතව කේ.ඒ ගුණසේකර යන අයට දන්වාඇත. | යනු ලබයි. |
| | | | | 2005.08.04 දින නව ගිවිසුම් අත්සන් කිරීම සඳහා පැමිණෙන ලෙස දක්න්වා ඇත. | |
| | | 2006.11.01 | ගිවිසුම් කාලයක් සඳහන් කර නොමැත | 2006.11.01 දින නව ගිවිසුමක් මගින් ටීතඑම් ඥාණලතා යන අයට මෙම කඩ කාමරය පවරා දී ඇත. ගිවිසුම් කාලයක් සඳහන් වී නොමැත | |
| | | | | 2013.07.23 දින ගිවිසුම් අළුත් කිරීම සඳහා පැමිණෙන ලෙස දන්වා ඇතඑහෙත් ගිවිසුම් අත්සන් කර නොමැත | |
| | | | | 2014.06.13 දින තක්සේරු දේපාර්තමේන්තුවෙන් සඳහන් කර ඇති පරිදී රු 1500 ලෙස කඩ කාමර කුලිය සංශෝධනය කර ඇති බව දන්වා ඇත. | |
| | | | | 2015.06.30 දින නව ගිවිසුම් අත්සන් කිාරීම සඳහා පැමිණෙන ලෙස දන්වා ඇත. එහෙත් ගිවිසුම් අත්සන් කර නොමැත | |
| | | | | 2016.05.18/2016.06.22 යන දින නව ගිවිසුම් අත්සන් කිරීම සඳහා ගැමිණෙන ලෙස දන්වා ඇත.එහෙත් නව ගිවිසුම් අත්සන් කර නොමැත. | |
| | | | | 2019.12.02 /2020.01.08/2020.01.27 යන දිනයක් නව ගිවිසුම් අත්සන් කිරීම සඳහා පැමිණෙන ලෙස දන්වා ඇත. එහෙත් නව ගිවිසුම් අත්සන් කර ඇත. | |
| අංක 11 | එස්.ඒ ගාමිණි විමලසිරි | 1995.07.22 | ගිවිසුම් කාලයක් සඳහන් කර නොමැත | මාසික කුලිය රු 300.00 කි. | 2008.03.18 හා 2019.2.17 යන දින මහ සභා තීරණය අනුව කේ.ජී.ඒ අනුරුද්ධ කුමාර යන අය විසින් මෙම කඩ කාමරය 2019.12.16 දක්වා පවත්වාගෙන ගොස් ඇති අතර 2019.12.17 දිනෙන් පසු නව ගිවිසුම් අත්සන් කොට ටීතඑම් ක්‍රිශාන්ත නාමල් තෙන්නකෝන් යන අය ගිවිසුම් ගත වී මෙම කඩ කාමරය පවත්වාගෙන යනු ලබයි. |
| | | | | 1995.11.15 දින අවුරුදු 02 ක කාල සීමාවක් සඳහා 95.11.15 සිට 97.11.15 දක්වා මෙම කඩය අතුරු බදු දීම සිදු කර ඇත. | |
| | | | | 1997.06.05 දින අතුරුබදු අවලංගු කර ගිමිණි විමලසිරි | |
| | | | | 2004.01.19 දින කඩ කාමර කුලිය රු 500 ලෙස සංශෝධනය කර ලිඛිතව දන්වා ඇත. | |
| | | | | 2005.08.04 දින නව ගිවිසුම් අත්සන් කිරීමට පැමිණෙන ලෙස දන්වා ඇත. අත්සන් කර නොමැත. | |
| | කේ.ජී.ඒ අනුරුද්ධ කුමාර | 2008.03.18 | ගිවිසුම් කාලයක් සඳහන් කර නොමැත | 2008.03.18 දින කේ.ජී අමිල අනුරුද්ධ කුමාර යන අය විසින් මෙම කඩ කාමරය ලිඛිතව ඔහුට ලබා දෙන ලෙස ඉල්ලීම හා එවකට හිටපු ගරු සභාපතිතුමාන් දෙපාර්ශවයේ කැමැත්ත පරිදී කඩ කාමරය පවරා දීම සහා අනුමැතියට යටත්ව සිදු කරන ලෙස අනුමැතිය ලබා දී ඇත. | |
| | | | | 2008.03.18 දින මෙම කඩ කාමරය 2008.04.17 පැවති මුදල් කමිටුවේදී ඥාති පදනම මත පවරා දීමට ඒකමතිකව අනුමැතිය හිමි වී ඇත. | |
| | | | | 2014.06.13 දින තක්සේරු දෙපාර්තමේන්තුවේ සඳහන් කර ඇති පරිදී රු 1500 ලෙස කඩ කාමර කුලිය සංශෝධනය කර ඇති බව දන්වා ඇත. | |
| | | | | 2015.06.30දින නව ගිවිසුම් අත්සන් කිරීම සඳහා පැමිණෙන ලෙස දන්වා ඇත. එහෙත් නව ගිවිසුම් අත්සන් කර නොමැත. | |
| | | | | 2016.05.18 හා 2016.06.22 යන දින ගිවිසුම් අත්සන් කිරීමට පැමිණෙන ලෙස දන්වා ඇත. එහෙත් නව ගිවිසුම් අත්සන් කර නොමැත. | |
| | | | | 2019.12.02 හා 2020.01.27 දින ගිවිසුම් අත්සන් කිරීමට පරමිණෙන ලෙස දන්වා ඇත. එහෙත් නව ගිවිසුම් අත්සන් කර නොමැත. | |
| | | | | 2019.12.17 මහ සභාව- තීරණ අංක ඊ) 135 යටතේ ශ්‍රාවස්තිපුර අංක 11 හා අංක 12 කඩ කාමර අතුරුබදු කරුවන් වන කේතජී අමිල අනුරුද්ධ කුමාර හා | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | පාලිත ප්‍රදීප් පෝල් සිරිමාන්න යන අයට මෙම කඩ කාමර ලබා දීම ඒකමතිකව සභා සම්මත විය. | |
| | | | | 2020 වර්ෂයේ ගිවිසුම් අත්සන් කර ඇත. දින සඳහන් වී නොමැත (කේ.එන් තෙකන්නකෝන් ) | |
| | | | | 2019.12.16 දින කේ.ජී.ඒ අනුරුද්ධ කුමාර යන අය විසින් ජේ.එම් ක්‍රිෂාන්ත නාමල් තෙන්නකෝන් යන අයට දිවුරුම් ප්‍රකාශයක් මගින් මෙම කඩය පවරා අත. | |
| කඩ කාමර අංක 12 | එල්.ඒ ඩී.එච් රිත්මික විජේතුංග | 1995.4.22 | ගිවිසුම් කාලයක් සඳහන් කර නොමැත. | මාසික කුලිය රු 300 කි. | |
| | | | | 2004.1.19 දින කඩ කාමර කුලිය රු 500 ලෙස සංශෝධනය කර ලිඛිතව දන්වා ඇත. | |
| | | | | 2005.08.04 දින නව ගිවිසුම් අත්සන් කිරීමට පැමිණෙන ලෙස දන්වා ඇත. නව ගිවිසුම් අත්සන් කර නොමැත. | |
| | | | | එල්.ඒ.ඩී .එච් අාර් විජේතුංග යන අය විසින් පාලිත ප්‍රදීල් පෝල් සිරිමාන්න යන අයට 2007.01.01 දින පවරා දෙන ලෙස ඉල්ලා ඇත. 2007.01.31 පැවති මහ සභාවේදී  කඩය පවරා දීම ඒකමතිකව සභා සම්මත වී ඇත. | |
| | පී.පී.පී සිරිමාන්න | 2007.03.07 | ගිවිසුම් කාලයක් සඳහන් කර නොමැත. | 2007.03.07  දින නව ගිවිසුම් අත්සන් කර පාලිත ප්‍රදීප් පෝල් සිරිමාන්න යන අය කඩය පවරාගෙන ඇත.(කුලී පදනම) | |
| | | | | 2013.07.23 දින නව ගිවිසුම් අත්සන් කිරීමට පැමිණෙන ලෙස දන්වා ඇත.ගවිසුම් අත්සන ්කර නොමැත. | |
| | | | | 2014.06.13 දින තක්සේරු දෙපාර්තමේන්තුවේ සඳහන් කර ඇති පරිදී රු 1500.00 ක් ලෙස කඩ කාමර කුලිය සංශෝධනය කර ඇත. | 2020 වර්ෂයට අදාලව අත්සන් කර ඇති ගිවිසුම් ප්‍රකාරව එන්.එම් මානෙල් චන්ද්‍රලතා යන අය විසින් මෙම කඩ කාමරය පවත්වාගෙන යනු ලබයි. |
| | | | | 2015.06.30 දින නව ගිවිසුම් අත්සන කිරීම සඳහා පැමිනෙන ලෙස දන්වා ඇත. ගිවිසුම් අත්සන් කර නොමැත. | |
| | | | | 2016.05.18 හා 2016.06.22 දින ගිවිසුම් අත්සන් කර කිරීම සඳහා පැමිණෙන ලෙස දන්වා ඇති අතර නව ගිවිසුම් අත්සන් කර නොමැත | |
| | | | | 2019.12.02 හා 2020.01.27 දින ගිවිසුම් අත්සන කිරීමට පැමිණෙන ලෙස දන්වා ඇත. ගිවිසුම් අත්සන් කර නැත. | |
| | | | | 2019.12.17 මහ සභාව- තීරණ අංක ඊ) 135 යටතේ ශ්‍රාවස්තිපුර අංක 11 හා අංක 12 කඩ කාමර අතුරුබදු කරුවන් වන කේතජී අමිල අනුරුද්ධ කුමාර හා පාලිත ප්‍රදීප් පෝල් සිරිමාන්න යන අයට මෙම කඩ කාමර ලබා දීම ඒකමතිකව සභා සම්මත විය. | |
| | | | | 2019.12.16 දින පී.පී.පී සිරිමාන්න යන අය විසින්ප එන්.එම් මානෙල් චන්ද්‍රලතා යන අයට දිවුරුම් ප්‍රකාශයක් මගින් මෙම කඩ කාමරය පවරා දී ඇත. | |
| | | | | 2020 වර්ෂයේ ගිවිසුම් පමණක් අත්සන් කර ඇත දින සඳහන් වී නොමැත.(එන්.එම් මානෙල් චන්ද්‍රලතා) | |
| 7 ඇළ කඩ කාමර | | | | | |
| කඩ කාමර අංක 01 | කේ.පී.ජයසූරිය | 1995.05.16 | ගිවිසුම් කාලයක් සඳහන් කර නොමැත | මසකට කුලිට රු:300.00 බැගින් ලබා දී ඇත. | කේ.පී ජයසූරිය විසින් 1995.05.16 දින ගිවිසුම් |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | 2004 ජනවාරි මස සිට රු.500 දක්වා කඩ කුලිය වැඩිකර ඇත.(2004.01.19 දිනැති ලිපිය මඟින්) | අත්සන්කර ඇත.ඔහු විසින්ම මෙම කඩ කාමරය පවත්වාගන යනු ලබයි |
| | | | | 2005.08.04 දින නව ගිවිසුම් අත්සන් කිරිමට පැමිණෙන ලෙස ලිඛිතව දන්වා ඇත ගිවිසුම් අත්සන් කර නොමැත | |
| | | | | 2013.07.13 දින නව ගිවිසුම් අත්සන් කිරිමට පැමිණෙන ලෙස ලිඛිතව දන්වා ඇත ගිවිසුම් අත්සන් කර නොමැත | |
| | | | | 2014 ජනවාරි මස සිට රු:1350.00දක්වා කඩ කුලිය වැඩිකර ඇත.(2014.01.16 දිනැති ලිපිය මඟින්) | |
| | | | | 2016.05.18 දින නව ගිවිසුම් අත්සන් කිරිමට පැමිණෙන ලෙස ලිඛිතව දන්වා ඇත ගිවිසුම් අත්සන් කර නොමැත | |
| | | | | 2019.09.20 සභාතීරණ අංක ඉ 04 යටතේ තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරුව පදනම්ව මාසික කුලිය 2500 ලෙස වැඩිකර ඇත | |
| | | | | 2019.12.02 දින නව ගිවිසුම් අත්සන් කිරිමට පැමිණෙන ලෙස ලිඛිතව දන්වා ඇත ගිවිසුම් අත්සන් කර නොමැත | |
| | | | | 2020.01.08 දින නව ගිවිසුම් අත්සන් කිරිමට පැමිණෙන ලෙස ලිඛිතව දන්වා ඇත ගිවිසුම් අත්සන් කර නොමැත | |
| අංක 02 කඩ කාමරය | ඊ.එම්. සෙනෙවිරත්න | 1995.07.16 | ගිවිසුම් කාලයක් සදහන් කර නොමැත | 1995.07.16 දින ඊ.එම්. සෙනෙවිරත්න යන අය සමඟ ගිවිසුම් ගත වී කඩ කාමරය කුලී පදනම මත ලබා දී ඇත | |
| | | | | 1996.10.7 දින කේ.පී.මෛත්‍රීපාල යන අයට මෙම කඩය පවරා දෙන ලෙස ඊ.එම්. සෙනවිරත්න විසින් ලිඛිතව ඉල්ලීම් කර ඇති අතර,එවකට හිටපු සභාපතිතුමන් විසින් අතුරු ගිවිසුමක් මඟින් මෙම කඩය කේ.පී.මෛත්‍රීපාල වෙත ලබා දෙන ලෙස දන්වා ඇති අතර,නැවත 1996.10.25 දින මෙම කඩ කාමරය පැවරීමක් කල නොහැකි බවත් කඩ කාමරය සභාවට භාර දෙන ලෙසත් දන්වා ඇත | |
| | කේ.පී.මෛත්‍රී පාල | 1997.07.27 | ගිවිසුම් කාලයක් සදහන් කර නොමැත | 1997.07.27 දින නව ගිවිසුමක් මගින් කේ.පී.මෛත්‍රීපාල හට අතුරු බදු දී ඇත. | කේ.පී මෛත්‍රීපාල යන අය විසින් 1997.07.27 දින අත්සන්කරන ලද ගිවිසුමට අනුව මෙම කඩ කාමරය පවත්වාගන යනු ලබයි |
| | | | | 2004 ජනවාරි මස සිට රු.500 දක්වා කඩ කුලිය වැඩිකර ඇත.(2004.01.19 දිනැති ලිපිය මඟින්) | |
| | | | | 2005.08.04 දින නව ගිවිසුම් අත්සන් කිරිමට පැමිණෙන ලෙස ලිඛිතව දන්වා ඇත ගිවිසුම් අත්සන් කර නොමැත | |
| | | | | 2013.07.13 දින නව ගිවිසුම් අත්සන් කිරිමට පැමිණෙන ලෙස ලිඛිතව දන්වා ඇත ගිවිසුම් අත්සන් කර නොමැත | |
| | | | | 2014 ජනවාරි මස සිට රු:1350.00දක්වා කඩ කුලිය වැඩිකර ඇත.(2014.01.16 දිනැති ලිපිය මඟින්) | |
| | | | | 2016.05.18 දින නව ගිවිසුම් අත්සන් කිරිමට පැමිණෙන ලෙස ලිඛිතව දන්වා ඇත ගිවිසුම් අත්සන් කර නොමැත | |
| | | | | 2016.06.22 දින රජයේ විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් දැනුම් දී ඇති පරිදි අත්සන් කරන ලද ගිවිසුම අවයිමත් බැවින් නැවත ගිවිසුම් ගත වන ලෙස දන්වා යවා ඇත. | |
| | | | | 2019.09.20 සභාතීරණ අංක ඉ 04 යටතේ තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරුව පදනම්ව මාසික කුලිය 2500 ලෙස වැඩිකර ඇත | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | 2019.12.02 දින නව ගිවිසුම් අත්සන් කිරිමට පැමිණෙන ලෙස ලිඛිතව දන්වා ඇත ගිවිසුම් අත්සන් කර නොමැත | |
| | | | | 2020.01.08 දින නව ගිවිසුම් අත්සන් කිරිමට පැමිණෙන ලෙස ලිඛිතව දන්වා ඇත ගිවිසුම් අත්සන් කර නොමැත | |
| අංක 03 කඩ කාමරය | ටී.ජී.සුගතපාල | 1995.10.08 | ගිවිසුම් කාලයක් සදහන් කර නොමැත | මසකට කුලිට රු:300.00 බැගින් ලබා දී ඇත. | කේ.පී ජයසූරිය විසින් 1995.10.08 දින ගිවිසුම් අත්සන් කර ඇත.ඔහු විසින්ම මෙම කඩ කාමරය පවත්වාගන යනු ලබයි |
| | | | | 2004 ජනවාරි මස සිට රු.500 දක්වා කඩ කුලිය වැඩිකර ඇත.(2004.01.19 දිනැති ලිපිය මඟින්) | |
| | | | | 2005.08.04 දින නව ගිවිසුම් අත්සන් කිරිමට පැමිණෙන ලෙස ලිඛිතව දන්වා ඇත ගිවිසුම් අත්සන් කර නොමැත | |
| | | | | 2013.07.13 දින නව ගිවිසුම් අත්සන් කිරිමට පැමිණෙන ලෙස ලිඛිතව දන්වා ඇත ගිවිසුම් අත්සන් කර නොමැත | |
| | | | | 2014 ජනවාරි මස සිට රු:1350.00දක්වා කඩ කුලිය වැඩිකර ඇත.(2014.01.16 දිනැති ලිපිය මඟින්) | |
| | | | | මෙම කඩ කාමරය එහුගේ බිරිඳ විසින් ඇයට පවරා දෙන ලෙස ඉල්ලා ආරවුලක් ඇතිවී ඇති අතර එම ප්‍රශ්ණය සභාව විසින් විසදන ලදී. | |
| | | | | 2015.09.03 දින එන්තර වාසි ලිපි යොමුකර ඇත | |
| | | | | 2016.05.18 දින නව ගිවිසුම් අත්සන් කිරිමට පැමිණෙන ලෙස ලිඛිතව දන්වා ඇත ගිවිසුම් අත්සන් කර නොමැත | |
| | | | | 2019.09.20 සභාතීරණ අංක ඉ 04 යටතේ තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරුව පදනම්ව මාසික කුලිය 2500 ලෙස වැඩිකර ඇත | |
| | | | | 2019.12.02 දින නව ගිවිසුම් අත්සන් කිරිමට පැමිණෙන ලෙස ලිඛිතව දන්වා ඇත ගිවිසුම් අත්සන් කර නොමැත | |
| | | | | 2020.01.08 දින නව ගිවිසුම් අත්සන් කිරිමට පැමිණෙන ලෙස ලිඛිතව දන්වා ඇත ගිවිසුම් අත්සන් කර නොමැත | |
| අංක 04 කඩ කාමරය | පී.ටී.සුනිල් ප්‍රේමචන්ද්‍ර | 1996.10.01 | ගිවිසුම් කාලයක් සදහන් කර නොමැත | මසකට කුලිට රු:300.00 බැගින් ලබා දී ඇත. | එම්.සෝමා වීරසිංහ විසින් 2012.03.08 දින ගිවිසුම් අත්සන් කර ඇත.ඔහු විසින්ම මෙම කඩ කාමරය පවත්වාගන යනු ලබයි |
| | | | | 2004 ජනවාරි මස සිට රු.500 දක්වා කඩ කුලිය වැඩිකර ඇත.(2004.01.19 දිනැති ලිපිය මඟින්) | |
| | | | | 2005.08.04 දින නව ගිවිසුම් අත්සන් කිරිමට පැමිණෙන ලෙස ලිඛිතව දන්වා ඇත ගිවිසුම් අත්සන් කර නොමැත | |
| | | | | 2011.10.24 දින මෙම කඩ කාමරය පවත්වාගෙන යැමට නොහැකි බැවින් සහෝදරියක වන එම් සෝමා වීරසිංහ හට පවරන ලෙස දන්වා ඇත.ඒ අනුව 2011.10.26 දින පැවති මහසභාවේ තීරණ අංක 3-125 යටතේ අනුමැතිය ලැබී ඇත | |
| | සෝමා වීරසිංහ | 2012.03.08 | ගිවිසුම් කාලයක් සදහන් කර නොමැත | ඒ අනුව සෝමා වීරසිංහ යන අය සමග ගිවිසුම් ගත වී ඇති අතර ගිවිසුම් කාලයක් සදහන් කර නොමැත. | |
| | | | | 2014 ජනවාරි මස සිට රු:1350.00දක්වා කඩ කුලිය වැඩිකර ඇත.(2014.01.16 දිනැති ලිපිය මඟින්) | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | 2015.06.30 දින නව ගිවිසුම් අත්සන් කිරිමට පැමිණෙන ලෙස ලිඛිතව දන්වා ඇත ගිවිසුම් අත්සන් කර නොමැත | |
| | | | | 2015.09.03 දින එන්තර වාසි ලිපි යොමුකර ඇත | |
| | | | | 2016.05.18 දින නව ගිවිසුම් අත්සන් කිරිමට පැමිණෙන ලෙස ලිඛිතව දන්වා ඇත ගිවිසුම් අත්සන් කර නොමැත | |
| | | | | 2017.09.20 දින මෙම කඩ කාමරය අතුරු බදු දී ඇති බව දැනගැනීම සහ 2017.10.02 දින ඒ පිළිබඳ සොයා බලා සභාවට මෙම කඩ කාමරය භාරදෙන ලෙස දන්වා යැවීම. | |
| | | | | 2019.09.20 සභාතීරණ අංක ඉ 04 යටතේ තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරුව පදනම්ව මාසික කුලිය 2500 ලෙස වැඩිකර ඇත | |
| | | | | 2019.12.02 දින නව ගිවිසුම් අත්සන් කිරිමට පැමිණෙන ලෙස ලිඛිතව දන්වා ඇත ගිවිසුම් අත්සන් කර නොමැත | |
| | | | | 2020.01.08 දින නව ගිවිසුම් අත්සන් කිරිමට පැමිණෙන ලෙස ලිඛිතව දන්වා ඇත ගිවිසුම් අත්සන් කර නොමැත | |
| අංක 05 කඩ කාමරය | ඩබ්ලිව්.එම්.සිරිනන්ද | 1995.05.16 | ගිවිසුම් කාලයක් සඳහන් කර නොමැත | මසකට කුලිට රු:300.00 බැගින් ලබා දී ඇත. | |
| | | | | 2004 ජනවාරි මස සිට රු.500 දක්වා කඩ කුලිය වැඩිකර ඇත.(2004.01.19 දිනැති ලිපිය මඟින්) | |
| | | | | 2005.08.04 දින නව ගිවිසුම් අත්සන් කිරිමට පැමිණෙන ලෙස ලිඛිතව දන්වා ඇත ගිවිසුම් අත්සන් කර නොමැත | |
| | | | | 2010.06.15 දින කේ.ඒ.ජී.සුරංගනී වත්සලා කුමාරි යන අයට පවරා දීමට ඉල්ලා සිටීම හා එයට 2010.06.29 දින පැවති මහ සභාවේදි සභා තීරණ අංක 3.4 යටතේ අනුමැතිය හිමිවීම | |
| | කේ.ඒ.ජී.සුරංගනී වත්සලා | 2010.08.09 | ගිවිසුම් කාලයක් සඳහන් කර නොමැත | 2010.08.09 දින කේ.ඒ.ජී.එස්.ඩබ්ලිව් කුමාරි සමග ගිවිසුම් ගතවීම.ගිවිසුම් කාලයක් සඳහන්ව නොමැත | කේ.ඒ.ජී. සුරංගනී වත්සලා විසින් 2010.08.09 දින ගිවිසුම් අත්සන් කර ඇත.ඔහු විසින්ම මෙම කඩ කාමරය පවත්වාගන යනු ලබයි |
| | | | | 2013.07.23 දින නව ගිවිසුම් අත්සන් කිරිමට පැමිණෙන ලෙස ලිඛිතව දන්වා ඇත ගිවිසුම් අත්සන් කර නොමැත | |
| | | | | 2014 ජනවාරි මස සිට රු:1350.00දක්වා කඩ කුලිය වැඩිකර ඇත.(2014.01.16 දිනැති ලිපිය මඟින්) | |
| | | | | | |
| | | | | 2016.05.18 දින නව ගිවිසුම් අත්සන් කිරිමට පැමිණෙන ලෙස ලිඛිතව දන්වා ඇත ගිවිසුම් අත්සන් කර නොමැත | |
| | | | | 2017.09.20 දින මෙම කඩ කාමරය අතුරු බදු දී ඇති බව දැනගැනීම සහ 2017.10.02 දින ඒ පිළිබඳ සොයා බලා සභාවට මෙම කඩ කාමරය භාරදෙන ලෙස දන්වා යැවීම. | |
| | | | | 2019.09.20 සභාතීරණ අංක ඉ 04 යටතේ තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරුව පදනම්ව මාසික කුලිය 2500 ලෙස වැඩිකර ඇත | |
| | | | | 2020.01.08 දින නව ගිවිසුම් අත්සන් කිරිමට පැමිණෙන ලෙස ලිඛිතව දන්වා ඇත ගිවිසුම් අත්සන් කර නොමැත | |

| ප්‍රාදේශීය සභා භූමියේ පිහිටි කඩ කාමර | | | | | |
|---|---|---|---|---|---|
| කඩ කාමර අංක 01 | කේ.ඒ පෙරේමරත්න | 2003.05.02 | ගිවිසුම් කාලයක් සඳහන් කර නොමැත<br><br>2013.07. 23 දින යවන ලද ලිපියක ගිවිසුම් කාලය අවුරුදු 05 ක් ලෙස සටහන් වී ඇත. | මාසික කුලිය 750 සිට 1250 දක්වා වැඩි කර ඇති බව 2014.01.16 දිනැති ලිපියෙහි සඳහන් වී ඇත. | දැනට මෙම කඩ කාමරය සභාව භාරයට ගෙන එහි ජල පිරිපහදු ජල ව්‍යාපෘතිය පවත්වාගෙන යනු ලබයි. |
| | | | | 2016.05.18 දින යවන ලද ලිපියක නව ගිවිසුම වර්ෂ 03 කට වරක් අළුත් කල යුතු බවට දන්වා ඇත. | |
| | | | | 2016.06.15 දින වසර 03 සඳහා ගිවිසුම් ගත වී ඇත. | |
| | | | | 2019.05.17 සභා තීරණ අංක ඉ)60 යටතේ ගිවිසුම 2019.06.15 දින අවසන් වන බැවින් ඉදිරි මාස 06 සඳහා දේශපාලන හිතවත්කම් නොමැතිව 12 වන මස අවසන් වන තෙක් ප්‍රසිද්ධියේ ටෙන්ඩර් කර ලබා දෙන ලෙසත්, 2019 දෙසැම්බර් මස අවසානයේ පත්තර දැන්වීමක් පල කර ටෙන්ඩර් කිරීමට තීරණය වී ඇත | |
| | | | | 2019.06.15 කේ.ඒ පේ◌්රමරත්න යන සමඟ තිබූ ගිවිසුම් අවසන් වී ඇත. | |
| | | | | 2019.08.05 දින ජී.ඩී ඉලංගසිංහ යන අය ටෙන්ඩරය මගින් මෙම කඩය බදු පදනම මත ලබා ගෙන ඇත. | |
| | | | | 2019.08.05 දින නව ගිවිසුම ජී.ඩී ඉලංගසිංහ යන අය සමඟ එළඹුනද එහි ගිවිසුම් කාලයක් සඳහන් වී නොමැත. | |
| කඩ කාමර අංක 02 | ඒ.එස් කස්තුරිආරච්චි | 2004.02.10 | ගිවිසුම් කාලයක් සඳහන් කර නොමැත<br><br>2013.07. 23 දින යවන ලද ලිපියක ගිවිසුම් කාලය අවුරුදු 05 ක් ලෙස සටහන් වී ඇත. | මාසික කුලිය රු 750 සිට 1250 දක්වා වැඩි කර ඇති බව 2014.01.16 දිනැති ලිපියෙන් සඳහන් වී ඇත. | ඒ.එස් කස්තුරිආරච්චි යන අය විසින් මෙම කඩ කාමරය ගිවිසුම් ගතව පරිහරණය කරන අතර 2021.06.15 දින ගිවිසුම් අවසන් වනු ඇත. |
| | | | | 2016.05.18 දින යවන ලද ලිපියක සඳහන් වී ඇත්තේ නව ගිවිසුම වර්ෂ 03 කට වරත් අළුත් කල යුතු බවකී. | |
| | | | | 2016.06.15 දින වසර 05 ක් සඳහා ගිවිසුම් ගත වී ඇත. | |
| කඩ කාමර අංක 03 | එස්.බී.ඒ.පී කුමාරදාස | 2003.05.02 | ගිවිසුම් කාලයක් සඳහන් කර නොමැත | එස්.බී.ඒ .පී කුමාරදාස යන සමඟ පළමුව ගිවිසුම් ගත වී ඇත. | ඒ ඉලංගසිංහ යන අය විසින් මෙම කඩ කාමරය ගිවිසුම් ගතව ඇති පරිදි 2021.06.15 දින තෙක් කුලී පදනම මත පාවිච්චි කරනු ඇත. |
| | | | | 2013.12.12 දින මෙම ගිවිසුම එස්.බී.ඒ .පී කුමාරදාස යන අය විසින් අවලංගු කර දෙන ලෙස ඉල්ලා ඇත. | |
| | | | | 2013.12.13 තීරණ අංක 06 මහ සභා තීරණය අනකුව මෙහි හිඟය ගෙවීමෙන් අනවතුරුව ගිවිසුම අවලංගු කර 2013 වර්ෂය අවසන් වීමට පෙර ටෙන්ඩර් මඟින් වෙනත් අයෙකුට ගිවිසුම් ගතව ලබා දීමට සුදුස බවට යෝජනා වී ඇත. | |
| | | | | 2013 .12.13 දින මෙම ගිවිසුම අවලංගු කර ඇත. | |
| | ඒ ඉලංගසිංහ | 2014.01.30 | ගිවිසුම් කාලයක් සඳහන් | 2014.01.30 දින නැවත ටෙන්ඩර් කර ඇත.එම ටෙන්ඩරය මඟින් ඒ ඉලංගසිංහ යන අය මෙම කඩ කාමරය ලබා ගෙන ඇත. මාසික කුලිය රු 1250 | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | කර නොමැත | ලෙස 2014.02.17 දින ලිඛිතව දන්වා ඇත. | |
| | | | | 2016 .05.18 දින යවන ලද ලිපියක සඳහන්ව ඇත්තේ, ගිවිසුම වසර 03 කට වරක් අළුත් කල බවයි. 2016.06.15 දින වසර 05 ක් සඳහා ගිවිසුම් ගත වී ඇත. | |
| කඩ කාමර අංක 04 | ඊ.එම් විජේසේකර | 2014.03.10 | ගිවිසුම් කාලයක් සඳහන් කර නොමැත | මාසික කුලිය රු 750 සිට 1250 දක්වා වැඩි කර ඇති බව 2014.01.16 දිනැති ලිපියෙන් සඳහන් වී ඇත. | ඊ.එම් විජේසේකර යන අය විසින් මෙම කඩ කාමරය ගිවිසුම් ගත වී දැනට 2021.06.15දින තෙක් පවත්වාගෙන යනු ලබයි. |
| | | | | 2016.05.18 දින යවන ලද ලිපියක සඳහන් වී ඇත්තේ නව ගිවිසුම වර්ෂ 03 කට වරත් අළුත් කල යුතු බවකී. | |
| | | | | 2016.06.15 දින වසර 05 ක් සඳහා ගිවිසුම් ගත වී ඇත. | |
| කඩ කාමර අංක 05 | යූ.එම් රත්න මැණිකේ | 2004 පෙබරවාරි මස | ගිවිසුම් කාලයක් සඳහන් කර නොමැත | පළමුව යූ.ඒ රත්නමැණිකේ යන අය මෙම කඩ කාමරය ලබා ගෙන මාස 02 ක කාලයක් ඇයගේ නමින් කඩ කාමර වාරික මුදල් ගෙවා ඇති අතර 2004.05.12 දින ලිඛිතව ඇයගේ පුතාගේ නමට පවරා දෙන ලෙස ඉල්ලීමක් කර ඇත. | කේ.ඒ.ජේ.පී කරසිංහ යන අය විසින් ගිවිසුම් අත්සන් කර ඇති පරිදී දැනට 2021.06.15 දින තෙක් පවත්වාගෙන යනු ලබයි. |
| | | | | මාසික කුලිය රු 750 සිට 1250 දක්වා වැඩි කර ඇති බව 2014.01.16 දිනැති ලිපියෙන් සඳහන් වී ඇත. | |
| | කේ.ඒ.ජේ.පී කරසිංහ | 2004.02.10 | | 2016.05.18 දින යවන ලද ලිපියක සඳහන් වී ඇත්තේ නව ගිවිසුම වර්ෂ 03 කට වරත් අළුත් කල යුතු බවකී. | |
| | | | | 2016.06.15 දින වසර 05 ක් සඳහා ගිවිසුම් ගත වී ඇත. | |
| කඩ කාමර අංක 06 | එච්.පී හීන්මැණිකේ | 2004.03.10 | ගිවිසුම් කාලයක් සඳහන් කර නොමැත | මාසික කුලිය 750 සිට 1250 දක්වා වැඩි කර ඇති බව 2014.01.16 දිනැති ලිපියේ සඳහන් වී ඇත. | එන්.එස්.කේ සිල්වා විසින් බදු ගැණුම්කරු ලෙස 2021 වර්ෂයේ මෙම කඩ කාමරය පවත්වාගෙන යනු ලබයි. |
| | | | | පළමුව එච්.එම් හීන්මැණිකේ යන අය විසින් මෙම කඩ කාමරය ,ලබා ගෙන ඇති අතර 2013.11.16 දින ඇය අභාවප්‍රාප්ත වී ඇති හෙයින් ඇයගේ දියණිය විසින් එම කඩ කාමරය ඇයගේ නමින් ගිවිසුම් ගත වී පවත්වාගෙන යාම සඳහා අවසර ඉල්ලා ඇත. (ආර්.එම් නාලනී කුමාරි 2014.03.06 දිනැති ලිපිය මගින් ) | |
| | | | | 2015.09.03 දින එච්.එම් හීන්මැණිකේ යන අයට එන්තරවාසි ලිපි යවා ඇත. | |
| | ආර්.එම් නාලනී කුමාරි | 2016.06.15 | වසර 05 (2021.06 .15 දක්වා) | 2016.06.15 දින නව ගිවිසුමකට ආර්.එම් නාලනී කුමාරි සමග එළඹ ඇත. එය වසර 05 ක කාලයක් ලෙස ගිවිසුමේ සඳහන් වී ඇත. | |
| | | | | 2020 දින නාලනී කුමාරි යන අය විසින් කුලි නිසියාකාරව නොගෙවීම මත මෙම කඩය සභාව වෙත පවරාගෙන ප්‍රාදේශීය ටෙන්ඩරයක් මගින් අතුරු බදු ගැණුම්කරුවෙකු වශයෙන් යන අයට 2020.09.15 දින සිට 2020.12.31 දින දක්වා බදු පදනම මත ලබා දී ඇත. | |
| | | | | 2020.01.16 දින සාම විනිසුරු සහතිකයක් මගින් 2015 දෙසැම්බර් අතුරු බදු ගැණුමකරුවකු ලෙස ක්‍රියාකර ඇති බව දන්වා ඇති අතර මෙම කඩ කාමරය තව දුරටත් අතරු බදු ගැණුම්තරුවකු ලෙස ඇති අයිතිවාසිකම් අහෝසි කර බදු ගැණුම්කරුවකු ලෙස රැදී සිටීමට අවශ්‍ය බව ලිඛිතව දන්වා ඇත. | |
| | එන්.එස්.කේ සිල්වා | 2020.09.15 | 2020.09. 15 | 2020.07.23 දින සභා තීරණ අංක ඉ)54 යටතේ ප්‍රාෙද්ශීය ලංසුපත් කැදවා ටෙන්ඩර් කිරීමට | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | සිට2020. 12.31 දක්වා | තීරණය වී ඇත. | |
| | | | | 2020.09.15 දින එන්.එස්.කෝ සිල්වා සමඟ නව ගිවිසුම් අත්සන් කර ඇත. | |
| | | | 2021.01. 01 සිට 2021.12. 31 දක්වා | 2021. වර්ෂය සඳහා ගිවිසුම පමණක් අළුත් කිරීමට තීරණය වී ඇත. ඉන් පසු 10.01 බදු මුදල වැඩි කර එක් වසරක් සඳහා මෙම වර්ෂයේ නව ගිවිසුම් අත්සන් කර ඇත. | |
| කවරක්කුලම කඩ කාමර | | | | | |
| **කඩ කාමර** අංක 01 | S.R.සුරවීර | 2016 වර්ෂය | 2016.01. 01 සිට 2016.12. 31 දක්වා | ❖ මෙම කඩකාමරය බදු පදනම මත S.R.සුරවීර යන අයහට ලබාදී ඇත.<br>❖ බදු මුදල රු.39900.00/= | බදු මුදල 2016 වර්ෂය තුලම ගෙවා අවසන් කර ඇත. |
| | නිහාල් අමරසිංහ | 2017 වර්ෂය | 2017.01. 01 සිට 2017.12. 31 දක්වා | ❖ මෙම කඩකාමරය මාසික බදු පදනම මත 2017 වර්ෂය සඳහා නිහාල් අමරසිංහ යන අයට ලබා දී ඇත.<br>❖ බදු මුදල රු.48000.00/= | බදු මුදල 2017 වර්ෂය තුලම ගෙවා අවසන් කර ඇත. |
| | නිහාල් අමරසිංහ | 2018 වර්ෂය | 2018.01. 01 සිට 2018.12. 31 දක්වා | ❖ 2018 වර්ෂයේදී ද නිහාල් අමරසිංහ යන අයට බදු පදනම මත මෙම කඩකාමරය ලබාදී ඇත.<br>❖ බදු මුදල රු.52160.00/= | 2018 වර්ෂයේ 17385/= හිගයක් ඇත.එම මුදල 2019.03.01 දින ගෙවා අවසන් කර ඇත. |
| | නිහාල් අමරසිංහ | 2019 වර්ෂය | 2019.01. 01 සිට 2019.12. 31 දක්වා | ❖ 2019 වර්ෂයේදී ද නිහාල් අමරසිංහ යන අය විසින් මෙම කඩකාමරය පවත්වාගෙන ගොස් ඇත.බදු මුදල රු.48000/=.<br>❖ 2019/12/10 දින නිහාල් අමරසිංහ යන අය විසින් එම කඩ කාමරය ගිවිසුම අහෝසි නොකර ඔහුටම ලබා දෙන ලෙස ඉල්ලීමක් හා එම ඉල්ලීම සභාපතිතුමන් විසින් අනුමැතිය ලබා දී ගිවිසුම්ගත කරන ලෙස දන්වා ඇත.ගරු ලේකම්තුමා විසින් ඔහුව අසාදු ලේඛණ ගත කර ඇති බව 12/16 දින සඳහන් කිරීම.<br>❖ 2019.09.22 දින තක්සේරු දෙපාර්තමේන්තුව මගින් මාසික කුලී තක්සේරුව වසර 03ක් සඳහා රු.48000.00/= ලෙස දක්වා ඇත.(මාසිකව රු.4000/=) | 2019 වර්ෂයේ බදු මුදල එම වස්ෂයේම ගෙවා අවසන් කර ඇත. |
| | G.L.D. නිහාල් අමරසිංහ | 2020 වර්ෂය | 2020.01. 01 සිට 2020.12. 31 දක්වා | ❖ 2019 වර්ෂයේදී ද G.L.D. නිහාල් අමරසිංහ යන අය විසින් මෙම කඩකාමරය පවත්වාගෙන ගොස් ඇත.<br>❖ බදු මුදල රු.48000.00/=. 2019.09.20 මහ සභා තීරණ අංක ඉ11 අනුව කවරක්කුලම 1 සිට06 දක්වා කඩ කාමර නව තක්සේරු මුදලට අනුව පවත්වාගෙන ගිය බදු පාර්ශ්ව සඳහාම වාර්ෂික ගිවිසුම්ගතව ලබා දීමට තීරණය කර ඇත.<br>❖ 2020.01.01 දින ගිවිසුම අත්සන් කර ඇත.<br>❖ 2020.11.06 දින පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් කවරක්කුලම 1,2,3 දරණ කඩකාමර සම්බන්ධව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා යොමුකිරීමේදී ප.පා.සහකාර කොමසාරිස්ගේ හා කොමසාරිස්ගේ නිර්දේශ සහිතව නිසි | බදු මුදල 2020 වර්ෂය තුලම ගෙවා අවසන් කර ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | ක්‍රමවේදය යටතේ ගරු ආණ්ඩුකාරතුමා වෙත යොමුකළ බව දන්වා ඇත.<br>❖ 2020.11.12 දින ගරු සභාපතිතුමන් විසින් කොමසාරිස්තුමා වෙත යවන ලද ලිපයක සදහන් වී ඇත්තේ මෙම කඩකාමර 1/2/3 එවකට හිටපු විෂයභාර අමාත්‍යවරයා විසින් වසර 03 කාලයක් සදහා පෙර ටෙන්ඩර්කරුවන්ට ලබා දෙන ලෙස නිර්දේශ කර ඇති බව සදහන් කර ඇත.එම ලිපිය අමුණා ඇත. | |
| අංක 01 | G.L.D. නිහාල් අමරසිංහ | 2021 වර්ෂය | 2021.01.01 සිට 2021.12.31 දක්වා | ❖ 2021.01.11 දින නව ගිවිසුම් අත්සන් කිරිමට හා 1/3 තැන්පත් මුදල් ගෙවිමට ලිඛිතව දන්වා ඇත.<br>❖ බදු මුදල රු.48000.00/=.<br>❖ 2021 වර්ෂය සදහා 2021.02.01 දින ගිවිසුම් අත්සන්කර ඇත.<br>❖ G.L.D. නිහාල් අමරසිංහ යන අය සදහාම මෙම කඩකාමරය ලබා දී ඇත.<br>❖ 2021 වර්ෂය සදහා ගිවිසුම පමණක් අලුත් කරන බව ඇස්තමේන්තු ප්‍රකාරව එම යෝජනාව ඒකමතිකව සභාසම්මත වී ඇත.<br>❖ 2021.03.17 දින ප.වා.සහකාර කොමසාරිස් විසින් එවා ඇති ලිපියක සදහන්ව ඇත්තේ ආණ්ඩුකාරතුමා වෙත අවශ්‍ය ඉදිරි කටයුතු සදහා ප.පා.සහකාර කොමසාරිස් මගින් ඉදිරිපත් කරන ලෙස දක්වා ඇත. | G.L.D. නිහාල් අමරසිංහ යන අය විසින්ම පවත්වාගෙන යයි. |
| අංක 02 | නිහාල් අමරසිංහ | 2016 වර්ෂය | 2016.01.01 සිට 2016.12.31 දක්වා | ❖ මෙම කඩ කාමරය බදු පදනම මත නිහාල් අමරසිංහ යන අයහට ලබා දී ඇත.<br>❖ බදු මුදල රු.48000.00/=. | බදු මුදල 2016 වර්ෂය තුලම ගෙවා අවසන් කර ඇත. |
| අංක 02 | S.R.සුරවීර | 2017 වර්ෂය | 2017.01.01 සිට 2017.12.31 දක්වා | ❖ මෙම කඩ කාමරය බදු පදනම මත S.R.සුරවීර යන අයහට ලබා දී ඇත.<br>❖ බදු මුදල රු.48000.00/=. | බදු මුදල 2017 වර්ෂය තුලම ගෙවා අවසන් කර ඇත. |
| අංක 02 | D.M.C.P දිසානායක | 2018 වර්ෂය | 2018.01.01 සිට 2018.12.31 දක්වා | ❖ මෙම කඩ කාමරය බදු පදනම මත D.M.C.P දිසානායක යන අයහට ලබා දී ඇත.<br>❖ බදු මුදල රු.52800.00/=. | 2018 වර්ෂයේ ඇප තැන්පත් මුදල පමණක් ගෙවා ඇති අතර ඉතිරි හිග මුදල් 2015 හා 2020 වර්ෂයේ ගෙවා අවසන් කර ඇත. |
| අංක 02 | S.R.සුරවීර | 2019 වර්ෂය | 2019.01.01 සිට 2019.12.31 දක්වා | ❖ මෙම කඩ කාමරය බදු පදනම මත S.R.සුරවීර යන අයහට ලබා දී ඇත.<br>❖ බදු මුදල රු.48000.00/=.<br>❖ 2019.09.22 තක්සේරු දෙපාර්තමේන්තුව මගින් මාසික කුලී තක්සේරුව වසර 03ක් සදහා රු.48000.00/= ලෙස දක්වා ඇත.(මාසිකව රු.4000/=) | බදු මුදල 2019 වර්ෂය තුලම ගෙවා අවසන් කර ඇත. |
| අංක 02 | S.R.සුරවීර | 2020 | 2020.01. | ❖ මෙම කඩ කාමරය බදු පදනම මත S.R.සුරවීර යන අයහට ලබා දී ඇත. | බදු මුදල 2020 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | වර්ෂය | 01 සිට 2020.12. 31 දක්වා | ❖ බදු මුදල රු.48000.00/=.<br>❖ 2019.09.20 මහ සභා තීරණ අංක ඉ11 අනුව කවරක්කුලම 1 සිට06 දක්වා කඩ කාමර නව තක්සේරු මුදලට අනුව පවත්වාගෙන ගිය බදු පාර්ශ්ව සඳහාම වාර්ෂික ගිවිසුම්ගතව ලබා දීමට තීරණය කර ඇත.<br>❖ 2020.06.26 දින 1/3ඇප තැන්පත් මුදල ගෙවා ඇත.<br>❖ 2020 වර්ෂය සඳහා ගිවිසුම් අත්සන්කර ඇත.<br>❖ 2020.11.06 දින පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් කොමසාරිස් හා සහකාර කොමසාරිස් මගින් ගරු ආණ්ඩුකාරතුමා වෙත අනුමැතිය සඳහා ලිපි යොමුකළ යුතු බව දන්වා ඇත.<br>❖ 2020.11.12 දින විශයභාර අමාත්‍යවරයා වසර 03 ක් කාලයක් සඳහා පෙර ටෙන්ඩර්කරුවන්ට ලබා දෙන ලෙස නිර්දේශ කර ඇත. | වර්ෂය තුලම ගෙවා අවසන් කර ඇත. |
| කඩ කාමර අංක 02 | එස්.ආර් සුරවීර | 2021 වර්ෂය | 2021.01. 01 සිට 2021.01 2.31 දක්වා | 2021.01.11 දින නව ගිවිසුම අත්සන් කිරීමට හා 1/3 තැම්පත් මුදල ගෙවීමට ලිඛිතව දන්වා ඇත. | එස්.ආර් සුරවීර යන අය විසින් පවත්වාගෙන යනු ලබයි. |
| | | | | බදු මුදල රු 48,000 කි. | |
| | | | | 2021 වර්ෂය සඳහා 2021.02.01 දින ගිවිසුම් ගත වී ඇත. එස්.ආර් සුරවීර හට ලබා දී ඇත. | |
| | | | | 2021 වර්ෂය සඳහා ගිවිසුම පමණක් අළුත් කරන බව ඇස්තමේන්තු ප්‍රකාරව එම යෝජනාව ඒකමතිකව ඒකමතිකව සහා සම්මත වී ඇත. | |
| | | | | 2021.03.17 දින පළාත් පාලන සහකාර කොමසාරිස් විසින් එවා ඇති ලිපියක සඳහන්ව ඇත්තේ ආණ්ඩුකාරතුමා වෙත අවශ්‍ය ඉදිරිකටයුතු සඳහා පළාත් පාලන සහකාර කොමසාරිස් මගින් ඉදිරිපත් කරන ලෙසයි. | |
| කඩ කාමර අංක 03 | එස්.ආර් සුරවීර | 2016 වර්ෂය | 2016.01. 01 සිට 2016.12. 31 දක්වා | බදු මුදල රු 40200.00<br>මෙම කඩ කාමරය බදු පදනම මත එස්.ආර් සුරවීර යන අයට ලබාදී ඇත<br>. | 2016 වර්ෂය තුලම මුදල් ගෙවා අවසන් කර ඇත. |
| | ආර්.එම්.කේ.බී රත්නායක | 2017 වර්ෂය | 2017.01. 01 සිට 2017. 12.31 දක්වා | බදු මුදල රු 48000.00<br>මෙම කඩ කාමරය බදු පදනම මත ආර්.එම්.කේ.බී රත්නායක යන අයට ලබාදී ඇත | 2017 වර්ෂය තුලම මුදල් ගෙවා අවසන් කර ඇත. |
| | එස්.එච්.ඒ.ආර් ද සිල්වා | 2018 වර්ෂය | 2018.01. 01 - 2018.12. 31 | බදු මුදල රු 54000.00<br>මෙම කඩ කාමරය බදු පදනම මත එස්.එච්.ඒ.ආර් ද සිල්වා යන අයට ලබාදී ඇත | 2018 වර්ෂය තුල 1/3 තැම්පත් මුදල පමණක් වො ඇත. ඉතිරි හිඟ මුදල් 2019 හා 2020 වර්ෂ තුලදී ගෙවා ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | එස් ලක්ෂ්මන් සුරවීර | 2019 වර්ෂය | 2019.01.01-2019.12.31 | බදු මුදල රු 48000.00<br><br>මෙම කඩ කාමරය බදු පදනම මත එස් ලක්ෂ්මන් සුරවීර යන අයට ලබාදී ඇත.<br><br>2019.09.22 දින තක්සේරු දෙපාර්තමේන්තුව මගින් මාසික කුලී තක්සේරුව වසර 03 සඳහා රු 48000 ලෙස දක්වා ඇත. (මාසිකව රු 4000) | 2019 වර්ෂයේ බදු මුදල එම වර්ෂයේම ගෙවා අවසන් කර ඇත. |
| | එස් ලක්ෂ්මන් සුරවීර | 2020 වර්ෂය | 2020.01.01-2020.012.31 | 2020 වර්ෂයේදී එස් ලක්ෂ්මන් සුරවීර යන අය විසින් මෙම කඩ කාමරය පවත්වාගෙන ගොස් ඇත.<br><br>බදු මුදල 48,000 කි. 2019.09.20 දින පැවති මහ සභා තීරණ අංක ඊ) 11 අනුව කවරක්කුලම 01 සිට 06 දක්වා කඩ කාමර නව තක්සේරු මුදලට අනුව පවත්වාගෙන ගිය බදු පාර්ශවය සඳහාම වාර්ෂික ගිවිසුම්ගතව ලබා දීමට තීරණය කර ඇත.<br><br>2020.06.24 දින 1/3 තැම්පත් මුදල ගෙවා ඇත.<br><br>2020 වර්ෂය සඳහා ගිවිසුම් අත්සන් කර ඇත.<br><br>2020.11.06 දින පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් කවරක්කුලම 1,2,3 දරණ කඩ කාමර සම්බන්ධව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා ලිපි ගොණු කිරීමේදී පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ හා කොමසාරිස්ගේ නිර්දේශය සහිතව නිසි ක්‍රමවේදය යටතේ ගරු ආණ්ඩුකාරතුමාගේ වෙත යොමු කල යුතු බව දන්වා ඇත.<br><br>2020.11.02 දින ගරු සභාපතිතුමා විසින් යවන ලද ලිපියක සඳහන් වී ඇත්තේ මෙම කඩ කාමර 1,2,23 එවකට හිටපු විෂය භාර අමාත්‍යවරයා වන පේෂල ජයරත්න මැතිතුමා විසින් වසර 03 කාලයක් සඳහා පෙර ටෙන්ඩර්කරුවයන්ට මෙම කඩ කාමර ලබා දෙන ලෙස නිර්දේශ කර ඇති බවයි. එම ලිපිය අමුණා ඇත. | |
| අංක 3 කඩ කාමරය | එස්.ලක්ෂ්මන් සුරවීර | 2021 වර්ෂය | 2021.01.01 සිට 2021.12.31 දක්වා | 2021.01.11 දින නව ගිවිසුම් අත්සන් කිරීමට හා 1/3 තැන්පත් මුදල් ගෙවීමට දක්වා ඇත. | එස්.ලක්ෂ්මන් සුරවීර විසින් මෙම වර්ෂයේ මෙම කඩ කාමරය පවත්වාගෙන යනු ලැබේ. |
| | | | | බදු මුදල රු.48000.00 | |
| | | | | 2021 වර්ෂය සඳහා 2021.02.01 දින ගිවිසුම් ගත වී ඇත. එස්.ආර්.සුරවීර හට ලබා දී ඇත. | |
| | | | | 2021 වර්ෂය සඳහා ගිවිසුම් පමණක් අළුත්කරන බව ඇස්තමේන්තු ප්‍රකාරව එම යෝජනාව ඒකමතිකව සම්මත වී ඇත. | |
| | | | | 2021.03.17 දින පලාත් පාලන සහකාර කොමසාරිස් විසින් එවා ඇති ලිපියේ සඳහන් කර ඇත්තේ ආණ්ඩුකාරතුමා වෙත අවහ්‍ය ඉදිරි කටයුතු සඳහා පලාත පාලන සහකාර කොමසාරිස් මඟින් ඉදිරිපත් | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | කරන ලෙස දන්වා ඇත. | |
| අංක 4 කඩ කාමර | එස්.ලක්ෂ්මන් සුරවීර | 2016 වර්ෂය | 2016.02.18 සිට 2016.02.31 දක්වා | බදු මුදල රු.16560.00 | 2016 වර්ෂය තුලම සියළුම බදු මුදල් ගෙවා අවසන් කර ඇත. |
| | | | | 2016.02.18 දින ටෙන්ඩරයෙන් එස්.ලක්ෂ්මන් සුරවීර යන අය විසින් මෙම කඩ කාමරය බදු පදනම මත ලබාගෙන ඇත. | |
| | | | | 2016.02.17 දින ගිවිසුම් අත්සන් කර ඇත. | |
| | අයිරාංගනී ගුණවර්ධන | 2017 වර්ෂය | 2017.01.01 සිට 2017.12.31 දක්වා | බදු මුදල රු.30,000.00 කි. | 2017 වර්ෂය තුලදී පැවති හිඟය 2018 වර්ෂයේ ගෙවා අවසන් කර ඇත. |
| | | | | 2016.11.30 දින රු.2500.00 ලෙස තක්සේරු දෙපාර්තමේන්තුව විසින් නව තක්සේරුවක් ලබා දී ඇත. | |
| | | | | 2016.12.03 දින ගිවිසුම් අත්සන් කර ඇත. | |
| | එස්.ආර්.ආර්. ස්වර්ණලතා | 2021 වර්ෂය | 2021.01.01 සිට 2021.12.31 දක්වා | බදු මුලද රු.36,000.00 කි. | ගිවිසුම් අත්සන් කර නොමැත. |
| | | | | 2021.12.15 දින පැවති ටෙන්ඩරය මඟින් එස්.ආර්.ආර්.ස්වර්ණලතා යන අය මෙම කඩ කාමරය බදු ගෙන ඇත. | |
| | | | | 2021.01.01 දින ගිවිසුම් අත්සන් කිරීමට පැමිණෙන ලෙස දැන්වීය. | |
| | | | | 2021.03.08 හා 2021.03.30 යන දිනයන්හි අවසන් නිවේදනය ගිවිසුම් අත්සන් කිරීමට පැමිණෙන ලෙස දැන්වීය. | |
| අංක 05 කඩ කාමරය | එම්.ඒ.අයි.ගුණ වර්ධන | 2016 වර්ෂය | 2016.02.18 සිට 2016.02.31 දක්වා | බදු මුදල රු.16550.00 කි. | 2016 වර්ෂය තුලම සියළුම බදු මුදල් ගෙවා අවසන් කර ඇත. |
| | | | | 2016.02.18 දින එම්.ඒ.අයිරාංගනී ගුණවර්ධන යන අය විසින් බදු පදනම මත ටෙන්ඩර් මඟින් ලබා ලෙන ඇත. | |
| | | | | 2016.02.16 දින ගිවිසුම් අත්සන් කර ඇත. | |

| | | | | | |
|---|---|---|---|---|---|
| අංක 05 කඩ කාමරය | එස් ලක්ෂ්මන් සුරවීර | 2017 වර්ෂය | 2017.01.01 සිට 2017.12.31 දක්වා | බදු මුදල් රු.30000.00 කි. | 2017 වර්ෂය තුලදී පැවති හිඟය 2018 වර්ෂයේ ගෙවා අවසන් කර ඇත. |
| | | | | 2016.11.30 දින රු.2500.00 ලෙස තක්සේරු දෙපාර්තමේන්තුව විසින් නව තක්සේරුවක් ලබා දී ඇත. | |
| | | | | 2016.12.31 ගිවිසුම් අත්සන් කර ඇත. | |
| අංක 05 කඩ කාමරය | එස්.ඒ.එස්.ප්‍රියංකර | 2021 වර්ෂය | 2021.01.01 සිට 2021.12.31 දක්වා | බදු මුලද රු.36,100.00 කි. | ගිවිසුම් අත්සන් කර නොමැත. |
| | | | | 2021.12.15 දින පැවති ටෙන්ඩරය මඟින් එස්.ඒ.එස්.ප්‍රියංකර යන අය මෙම කඩ කාමරය බදු ගෙන ඇත. | |
| | | | | 2021.01.01 / 2021.03.08 යන දිනයන් හි ගිවිසුම් අත්සන් කිරීමට පැමිණෙන ලෙස දන්වා ඇත. | |
| | | | | 2021.03.30 දින ගිවිසුම් අත්සන් කිරීමට පැමිණෙන ලෙස දන්වා අවසන් නිවේදනය යවා ඇත. | |
| අංක 06 කඩ කාමරය | බී.තෙන්නකෝන් | 2016 වර්ෂය | 2016.01.01 සිට 2016.12.31 දක්වා | බදු මුදල රු.16550.00 කි. | 2016 වර්ෂය තුලම සියළුම බදු මුදල් ගෙවා අවසන් කර ඇත. |
| | | | | 2020.12.15 දින පැවති ටෙන්ඩරය මඟින් බී.තෙන්නකෝන් නැමැති අය විසින් මෙම කඩ කාමරය බදු පදනම මත ලබාගෙන ඇත. | |
| | | | | 2016.02.18 දින ගිවිසුම් අත්සන් කර ඇත. | |
| අංක 06 කඩ කාමරය | බී.තෙන්නකෝන් | 2017 වර්ෂය | 2017.01.01 සිට 2017.12.31 දක්වා | බදු මුදල රු.30000.00 කි. | 2017 වර්ෂය තුලදී පැවති හිඟය 2018 වර්ෂයේ ගෙවා අවසන් කර ඇත. |
| | | | | 2016.11.30 දින රු.2500.00 ලෙස තක්සේරු දෙපාර්තමේන්තුව විසින් නව තක්සේරුවක් ලබා දී ඇත. | |
| | | | | 2016.12.31 දින ගිවිසුම් අත්සන් කර ඇත. | |
| අංක 06 කඩ කාමරය | එස්.ඒ.එස්.ප්‍රියංකර | 2021 වර්ෂය | 2021.01.01 සිට | බදු මුලද රු.36,100.00 කි. | ගිවිසුම් අත්සන් කර නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | 2021.12.31 දක්වා | | |
| | | | | 2021.12.15 දින පැවති ටෙන්ඩර් මගින් එස්.ඒ.එස්.ප්‍රියංකර මහතා මෙම කඩ කාමරය බදු ගෙන ඇත. | |
| | | | | 2021.01.01 / 2021.03.08 යන දිනයන් හි ගිවිසුම් අත්සන් කිරීමට පැමිණෙන ලෙස දන්වා ඇත. | |
| | | | | 2021.03.30 දින ගිවිසුම් අත්සන් කිරීමට පැමිණෙන ලෙස දන්වා අවසන් නිවේදනය යවා ඇත. | |

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා සභා ගත කල විස්තරය අනුව 7 ඇල කඩ කාමර හා ශ්‍රාවස්තිපුර කඩ කාමර බදු දීම සම්බන්ධයෙන් ඉතාමත් කණගාටුදායක තත්වයක් පවතින බවත්, ඔවුන් කැඳවා අවස්ථා කිහිපයකදී මෙම ගිවිසුම් යාවත්කාලීන හා විධිමත් කිරීමට උත්සහ දැරුවද ඒ කිසිදු අවස්ථාවක එය සාර්ථක නොවූ බවත්, හේතු සෙවීමේදී, පැහැදිළි වූයේ අළුතින් ගිවිසුම් අත්සන් කිරීමෙන් පසු අදාල කඩ කාමර නැති වේය යන සැකය ඔවුන් තුල පැවතීම බවත්, මේ තත්වයට වෙළඳසැල දියුණු කර පවත්වාගෙන ගියත් ගිවිසුමක් අළුත්කිරීම තුල ඒ අයිතිය අහිමි වී යයි යන බිය තුල සිට මෙලෙස ගිවිසුම් අත්සන් කිරීම පැහැර හරින බවට පැහැදිළි වූ බවත්, ඔවුන්ගේ ඉල්ලීම වූයේද මෙම කඩ කාමර දීර්ඝ කාලීන බදු පදනමින් ලබා දෙන ලෙස බවත්, ප්‍රකාශ කරන ලදී.

තවද මෙය සභාවක් ලෙස පොදු කාර්යයක් මත සිට ගත යුතු තීරණයක් බවත්, මෙය ක්‍රියාත්මක කිරීම සුදුසු නැතිනම් සුදුසු නැති ලෙසටත්, සුදුසු නම් ක්‍රියාත්මක කිරීමටත්, කිසිදු ගැටළුවක් නොවන බවත්, සභාවේ සුභ සිද්ධිය හා උන්නතිය වෙනුවෙන් මිස වෙනත් කිසිවකුගේ උන්නතියක් සඳහා සිදු කරන කාර්යය භාර්යයක් නොවන බැවින් මේ සම්බන්ධයෙන් අවධානය යොමු කර නිවැරදි තීරණයක් කරා යොමු වන ලෙසත්, ඉදිරිපත් කල කරුණු සැළකිල්ලට ගැනීමේදී ප්‍රාදේශීය සභාව සතු මේ වන විට බදු පදනමින් ලබා දී ඇති කඩ කාමර තුල කිසිදු නෛතික තාවයක් හෝ විනිවිධ භාවයක් හා විධිමත් වීමක් නොමැති බැවින් හා ප්‍රාදේශීය සභාව සතු අයිතියක් සම්බන්ධයෙන්ද තහවුරු කල නොහැකි බැවින් දැනට සිටින වෙළෙඳුන් තුල ද දීර්ඝ කාලීන බදු පදනමින් ලබා දෙන ලෙසට කරන ඉල්ලීම් ද සලකා බලා සෑම වර්ෂයකම අළුත් කරනු ලබන ගිවිසුමක් මගින් මෙම කඩ කාමර වෙනස්වන තක්සේරු වටිනාකම් අනුව සංශෝධනය කරමින් දීර්ඝ කාලීන බදු පදනමට යාම සුදුසු බවට යෝජනා කරන ලදී.

තවද ඉදිරියේදී බල ප්‍රදේශයේ ජනතාවට විධිමත්ව හා නීත්‍යානුකූලව කටයුතු කිරීම සඳහා හැකිවන පරිදී ඉඩ කඩ සලසා දීම සම්බන්ධයෙන් පැහැදිලි අවධානය යොමු කර යෝජනාව සඳහා සහයෝගය ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදී.

ගරු මන්ත්‍රී කේ.ඒ ශාන්ත මැතිතුමා ගරු සභාපතිතුමා විසින් දැක් වූ කරුණු හා යෝජනාව සැළකිල්ලට ගැනීමේදී පැහැදිලි වන්නේ , ශ්‍රාවස්තිපුර හා 7 ඇල කඩ කාමර වල අයිතිය මේ වන විට ප්‍රාදේශීය සභාව සතුව නොපවතින බවත්, සභාව සතුව අයිතය පැවතිම සඳහා නීත්‍යානුකූලව ගිවිසුම් ගතවූ ගිවිසුමක් පැවතිය යුතු බවත්, තවද ශ්‍රාවස්තිපුර කඩ කාමර පවරා දීම සිදු කරනු ලබන්නේ, පළාත් පාලන විශේෂ කොමසාරිස් ගේ පාලන කාලයේදී බවත්, ප්‍රාදේශීය සභාව පිහිටුවීමෙන් පසුවත් මෙම කඩ කාමර විධිමත් පරිදි ගිවිසුම්ගත වීමකට ගොස් නැති බවත් ඒ අනුව වසර ගණනාවක සිට මෙම කඩ කාමර අවිධිමත්ව ක්‍රියාත්මක වී ඇති බවත්, මේ නිසා ගැටළු රාශියකට ප්‍රාදේශීය සභාව මුහුණ දී ඇති බවත්, විශේෂයෙන් මෙම කඩ කාමර වල අයිතිය අහිමි වන විට සභාව නීත්‍යානුකූල අයිතිය තහවුරු කිරීමට යන අවස්ථාවේදී එම නඩු තීන්දු වලින් පරාජයට පත් වූ අවස්ථා ද පවතින බවත්, භූමියේ අයිතිය ප්‍රාදේශීය සභාව සතුව නොපැවතීමද ඒ සඳහා එක් සාධකයක් බවත්, දැනට වසර ගණනාවක් පුරා මෙම කඩ කාමර වල වෙළඳ කටයුතු සිදු කරනු ලබන

පුද්ගලයන් වෙත ඔවුන්ගේ අයිතිය තහවුරු කර ගැනීම වෙනුවෙන් හා විධිමත් ගිවිසුමකට එළබීම මත ප්‍රාදේශීය සභාවේ අයිතියද තහවුරු වන බැවින් මෙම නීත්‍යානුකූල ගිවිසුමක් යටතේ ගරු සභාපතිතුමා යෝජනා කල පරිදී දීර්ඝ කාලීන බදු පදනම යටතේ බදු පදනමින් ලබා දීම ගරු ආණ්ඩුකාර තුමාගේ අනුමැතියට යටත්ව සිදු කිරීම සුදුසු බවට ප්‍රකාශ කරමින් යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු මන්ත්‍රී කේ හැරිසෙන්ස් මැතිතු</u>මා ගරු සභිකවරුන් ලෙස වර්ථමානයේදී සිදු කල යුතු වන්නේ වර්ථමාන තත්වය නිවැරදිව පවත්වාගෙන යාම මිස අතීතයේ වැරදී සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම නොවන බව සඳහන් කරමින් පවතින තත්වයට විසඳුමක් ලෙසද මෙලෙස දීර්ඝ කාලීන බදු පදනමින් ලබා දෙන්නේද යන්න විමසන ලද අතර මෙම ඉඩම් වල අයිතියක් නොමැතිව තිබියදී, ගරු සභාපතිතුමා විටින් විට විවිධ ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීමේ ප්‍රයෝජනයක් පවතින්නේද යන්න විමසන ලදී.

<u>ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා</u> පසුගිය කාලය පුරා ගිවිසුම් ගත වීම් සම්බන්ධයෙන් විවිධ ගැටළු කතා කල බවත්, තමන් ගරු සභාපතිධූරය හොබවමින් සිට 2015 වර්ෂයේදී ගරු සභාවේ අනුමැතිය මත කවරක්කුලම කඩ කාමර අංක 01,02,03 ලෙස කඩ කාමර ඉදි කර 2016 වර්ෂය සඳහාත් ටෙන්ඩර් කර බදු පදනමින් ලබා දී ධූර කාලය අවසන් කල බවත්, 2017 වර්ෂයේදී තොරා ගනු ලැබූ පුද්ගලයින් නිසි පරිදී ගෙවීම් සිදු කර නොමැති අවස්ථාවේදී ඔවුන් අසාදු ලේඛන ගත කොට හිටපු ලේකම්වරයා විසින් නැවත ටෙන්ඩර් කර වෙනත් පුද්ගලයින් වෙත ලබා දී තිබුනත් ඒ සම්බන්ධයෙන් පෙර සිටි ටෙන්ඩර්කරුවන් විසින් නඩු පැවරීමක් සිදු කල බවත්, 2018 වර්ෂයේදී වර්ථමාන සභාව වැඩ භාරගැනීමෙන් පසු ගරු සභාපතිතුමා විසින් කලින් සිටි පුද්ගලයින් වෙත අසාධාරණයක් සිදු වී ඇති බවට ප්‍රකාශ කරමින් විධිමත් පරිදී බදු දී ඇති පුද්ගලයින්ගෙන් කඩ කාමර ඉවත් කර හිටපු පුද්ගලයින් වෙතම නැවත ලබා දීමට තීරණයක් ගත් බවත්, ඒ අනුව 2018 වර්ෂයේදී 2016 වර්ෂයේදී බදු කරුවන් ලෙස සිටී පුද්ගලයින් වෙත නැවත කඩ කාමර ලබා දුන් බවත්, සඳහන් කරන ලද අතර . කෙසේ වුවද 2018 වර්ෂයේදී ලක්ෂ්මන් සුරවීර යන පුද්ගලයා වෙත 2017 වර්ෂයේදී සිල්වා යන අය බදු ලබා ගත් කඩ කාමරය ලබා දෙන බවත්, 2021 වර්ෂය දක්වාම මෙම ලක්ෂ්මන් සුරවීර යන පුද්ගලයා මෙම කඩ කාමරය පවත්වාගෙන යන නමුත් එම පුද්ගලයා 2016 වර්ෂයෙද් කිසිදු කඩ කාමරයක් හිමි කර ගෙන නොසිටී බවත්, එසේ තිබියදී මේ අයුරින් මේ පුද්ගලයා වෙත වසර ගණනාවක් සඳහා බදු පදනමින් ලබා දුන්නේ කෙසේද යන්න විමසන ලද අතර මෙය කිසිදු ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටියකට යටත්ව සිදු කර නොමැති බවත්, මෙය නිවැරදිනම් අප කඩය පැවරිය යුතු වන්නේ, එන්.කේ.බී රත්නායක යන පුද්ගලයාට බව සඳහන් කරන ලදී.

තවද මේ සඳහා ගිවිසුමක් අත්සන් කල යුතුව තිබෙන බවත්, ඒ සම්බන්ධයෙන් කිසිදු සඳහනක් ගොණුව තුල නොමැති බවත්, ගිවිසුමක් අත්සන් කරන සෑම අවස්ථාවකම සභාපති, ලේකම් අත්සන් කර පොදු මුද්‍රාව තැබිය යුතුව පවතින නමුත්, මෙම ගිවිසුමේ ලේකම් විසින් අත්සන් තබා නොමැති බවත්, මේ අයුරින් වසර ගණනාවක් සභාවේ නිත්‍යානුකූල ගිවිසුම්ගත වීමකින් තොරව පවත්වාගෙන ගොස් ඇති බවත්, ගරු සභාපතිතුමා යම් ඉල්ලීමක් සභාව වෙත ඉදිරිපත් කිරීමේදී ගරු සභාව ලෙස අප විශ්වාස කරනු ලබන්නේ අප මේ තීරණය ගනු ලබන්නේ සභාවේ උන්නතිය සඳහාම පමණක් වන බවට බැවින් මේ වන විට විධිමත් පරිදී පවත්වාගෙන යා හැකි කවරක්කුලම කඩ කාමර හා ප්‍රාදේශීය සභා භූමියේ පිහිටී කඩ කාමර දීර්ඝ කාලීන බදු පදනමකට නොයවමින් ගැටළුකාරී තත්වයන් පවතින 7 ඇල කඩ කාමර හා ශ්‍රාවස්තිපුර කඩ කාමර සඳහා පමණක් මෙම දීර්ඝ කාලීන බදු පදනමට යාම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

තවද මෙලෙස කිසිදු සභා තීරණයකින් තොරව නීත්‍යානුකූල නොවන පරිදි කඩ කාමර පවරා දීම සම්බන්ධයෙන් ලේකම් වරයාද වගකිව යුතුව පවතින බවත්, කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත ගුණවර්ධන මැතිතු</u>මා මෙම ඉදිරිපත් කර ඇති යෝජනාව තුල ගැටළු ගණනාවක් පවතින බවත්. කඩ කාමර වල අයිතිය අප සතුව නොපවතින බව ප්‍රකාශ කරමින් වරින් වර මහ සභාවට

යෝජනා ඉදිරිපත් කරමින් එම කඩ කාමර ප්‍රතිසංස්කරණය කිරීම් සිදු කරන බවත් මෙලෙස අප සතුව අයිතියක් නොමැති දේපල වෙනුවෙන් මහජන මුදල් යෙදවීම සිදු කල නොහැකි කාර්යයක් වන බවත්. මේ යෝජනාව ගෙන ඒමට පෙර කඩ කාමර සභාවේ අයිතියට ගැනීම සිදු කල යුතු බවත්, එසේ නොමැතිව අපට මෙම ක්‍රියාමාර්ග ගැනීම සඳහා බලයක් හිමි නොවන බැවින් මේ සඳහා මෙම කඩ කාමර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සහය ඇතිව  භූමියේ අයිතිය තහවුරු කර ගැනීමට කටයුතු කල යුතු බවත්, පසුගිය කාලය තුල පළාත් පාලන ආයතන ක්‍රියාත්මක කරනු ලැබුවේ ඒ ඒ කාලයන් තුල සිටි අදාල පක්ෂ හා නායකයින් ඇතුලත් මහ සභාව බවත්,  මීට ඉහතදී නීත්‍යානුකූලව බදු දීම් සිදු නොකිරීමේ වගකීම භාර ගනු ලබන්නේ කවුරුන්ද යන්නත්, ඉදිරිපත් කල යෝජනාව තුල නඩු පැවරීම් සම්බන්ධ තොරතුරු හා අසාදු ලේඛන ගත කරවනු ලැබූ පුද්ගලයින් සම්බන්ධයෙන් තොරතුරු ඉදිරිපත් නොවූ බවත්,මෙවර ලබා දී ඇති ආදායම් වාර්ථාව තුල ලැබිය යුතු හිඟ දඩ මුල් වලින් සැළකිය යුතු මුදලක් මේ වන විටත් අය වී නොමැති බවත්,මෙය දිගින් දිගටම දක්නට ලැබුනු තත්වයක් බවත්, මෙලෙස වාරික මුදල් පැහැර හරිමින් සිටින පිරිසක් වෙත දීර්ඝ කාලීනව ලබා දීම සඳහා නිර්දේශයක් දිය නොහැකි බවත්, බදු  කාලය නිශ්චිතව දක්වා නොමැති වීම ගැටළු සහගත බවත්, මීට ඉහතදී ද සිදු කර තිබෙන්නේද මෙවැනිම වරදක් බවත්, දීර්ඝ කාලීන වූවත්, ඒ සඳහා ද කාලයක් ලබා දිය යුතු බවත්, මීට ඉහතදී නිවැරදි බදු ගිවිසුමක් නොමැතිව බදු අය කිරීම සිදු කලේ කෙසේද යන්නත්, විමසන ලද අතර මෙම කඩ කාමර අපට අයිති නැති බවට ප්‍රකාශයන් ඉදිරිපත් නොකරන ලෙසත්, පවතින්නේ භූමියේ අයිතිය තහවුරු කර ගැනීමට නොහැකි වීමක් පමණක් බව සඳහන් කරන ලදී.

ඒ අනුව දීර්ඝ කාලීන බදු පදනම යටතේ කඩ කාමර ලබා දීමේදී භූමියේ අයිතිය කහවුරු කර ගැනීම සඳහා මුලින්ම අවධානය යොමු කිරීමටත්, දින රහිත ගිවිසුම් සඳහා මෙන්ම බදු දීම් සඳහා නොයා යුතු බවත්, මේ තුලින් පොදු අයිතිය පුද්ගල අයිතියක් සඳහා යොමු වීමේ උත්සහයක් ක්‍රියාත්මක වන බවත්, ගිවිසුමක් අත්සන් කිරීමට ප්‍රථම අදාල ගිවිසුමේ කෙටුම්පතක් සකස් කර මහ සභාවට ඉදිරිපත් කරන ලෙසත්, ප්‍රකාශ කරමින් අවසාන වශයෙන් අසාදු ලේඛන ගත වී ඇති බදු පැහැර හැරී ඇති පුද්ගලයින් සඳහා ලබා නොදීමටත් කටයුතු කරන්නේද යන්න ආදිය යෝජනාව තුල ඇතුලත් විය යුතු වනවා සේම භූමියේ අයිතිය තහවුරු කර ගැනීමකින් තොරව කිසි ලෙසකින්වත් ගිවිසුම් ගත වීම කාලෝචිත නොමැති බව සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී සුභාෂිණී බණ්ඩාර මැතිණිය</u> මෙම කරුණු සියල්ල මීට ඉහතදී සිට සිදු වූ වරදක් අප මෙලෙස මැදදි නිවැරදි කිරීමකට යැමට උත්සහ කරන්නේ මන්ද යන්න විමසන ලදී.

<u>ගරු සභාපති තුමා</u> මෙම යෝජනාව එළබෙන වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීම සඳහා ආණ්ඩුකාර තුමාගේ අනුමැතියට යොමු කිරීමටත්, මේ වසරේ සැප්තැම්බර් මස සිට අදාල සියළු අනුමැතීන් ලබා ගෙන අවසන් කිරීමට හැකි වන බව සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී කේ හැරිසෙන්ස් මැතිතුමා</u> බල ප්‍රදේශයේ සුළු පරිමාණයේ ව්‍යාපාරිකයන් සඳහා ප්‍රාදේශීය සභා රීති අනුව යම් නීති රාමුවක් සකස් කර තිබෙන අතරම පනත් කිහිපයකම බලපෑමට ලක් වන නමුත් වරාය නගරය යනු විශාල භූමි ප්‍රමාණයකින් සමන්විත වනවා සේම ඔවුන් වෙත බදු බලපෑම් කිසිවක් නොමැති බවත්, යන්න ලෙස කරුණු දැක්වීමේදී ඇති වූ ගෝෂාකාරී තත්වය හමුවේ සිදු කල ප්‍රකාශ කිසිවක් පැහැදිළි නොවිණි.

තව දුරටත් අදහස් දැක්වූ ගරු මන්ත්‍රී කේ හැරිසෙන්ස් මැතිතුමා මහජන මුදල් වැය කරමින් වෙළඳ කටයුතු සිදු කිරීම සඳහා ගොඩනැගිළි ඉදි කර වෙළඳපල ඇති කර දීම සිදු කලා වූවත්, ඒ කිසිදු අවස්ථාවක භූමියේ අයිතිය තහවුරු කර ගැනීම සඳහා අවධානය යොමු නොකලේ මන්ද යන්න විමසමින් ඒ සඳහා පියවර ගැනීමට කටයුතු කරන ලෙස ප්‍රකාශ කරන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා </u>ඊට අදාල පියවර මේ වන විට සිදු කර ඇති බව කරුණු දක්වමින් සඳහන්  කරන ලදී.

ගරු මන්ත්‍රී පී.ටී සිරිසේන මැතිතුමා පසුගිය කාලය පුරා ප්‍රාදේශීය සභාවට බලයට පත් වූ සියළු දෙනා අතින් සිදු වූ වැරදි නිවැරදි කිරීමක් වෙනුවෙන් වර්ථමානයේ ගරු සභාපතිතුමා මෙවැනි යෝජනාවක් ඉදිරිපත් කර ඇති බැවින් ඒ සඳහා අප සහයෝගය ලබා දිය යුතු බවත්, මේ අවස්ථාව වන විට බල ප්‍රදේශයේ සෑම ව්‍යාපාරිකයෙකුම පාසා දැඩි පීඩාවෙන් තම ව්‍යාපාර කටයුතු සිදු කර ගෙන යන බැවත්, කෙසේ නමුත් ප්‍රාදේශිය සභාව මගින් බදු දී ඇති දේපල සඳහා වන බදු ගෙවීම් පැහැර හරිනු ලබන්නේ නම් ඊට අදාල පියවර පරිපාලනය විසින් ගනු ලබන බවත්, ඒ සම්බන්ධයෙන් කිසිදු වැරදි අවබෝධයක සිටිය යුතු නැති බවත්, කරුණු දක්වමින් සඳහන් කරන ලදී. ගරු මන්ත්‍රිතුමා තව දුරටත් අදහස් දැක්වීමේදී ඇති වූ ගොෂාකාරී තත්වය හමුවේ සිදු කල ප්‍රකාශ කිසිවක් පැහැදිලි නොවිණි.

ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා 2019.01.10 වන දින කවරක්කුලම කඩ කාමර අංක 03 හි බදු කරු ලෙස සිටි ආර්.ඒ.කේ.පී රත්නායක යන අය විසින් ලක්ෂ්මන් සුරවීර මහතාට ලබා දෙන ලෙස ඉල්ලීම් කර තිබූ බවත්, එය නිවැරදි ටෙන්ඩර් ක්‍රියාපටිපාටියට පරිබාහිර සිදු කල කාර්යයක් බවත්, එම ලිපියේ ගරු සභාපතිතුමා විසින් මෙය ලක්ෂ්මන් සුරවීර යන අයගේ නමින් ගිවිසුම් ගත වන ලෙසට සටහන් කර තිබූ බවත්, ඒ සඳහා ලේකම් විසින් මෙය මහ සභාවේ අනුමැතියන් යටතේ පමණක් සිදු කරන ලෙසට සටහන් කර ඇති නමුත් ඒ ලෙසින් මෙය ක්‍රියාත්මක වී නොමැති බවත්, මේ වන විට එම ලිපිගොණුව තුල මෙම ලිපිය නොමැති බවත්, එබැවින් මෙම ගොණු තුල ඇති ලිපි ගරු සභාපතිතුමා විසින් ඉවත් කර ඇති බවට සැකයක් පවතින බවත්, කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

තවද මේ සභාවට තමන් විසින් දිගින් දිගටම පළාත් පාලන ආයතන සතු සියළුම දේපල වල අයිතිය අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙතින් නිදහස් කර ගැනීමේ හා පවරා ගැනීමේ කටයුතු සිදු කරන ලෙසට ප්‍රකාශ කලත් ඒ සඳහා ප්‍රතිපාදන නොමැති බව ප්‍රකාශ කරමින් අදාල කාර්යය පැහැර හරින බවත්, ඒ සඳහා රාජ්‍ය මිනින්දෝරු දෙපාර්තමේන්තුව හරහා සිදු කර ගැනීමේ හැකියාව පවතින බවත්, එයද සැළකිල්ලට ගෙන නොමැති බවත්, කෙටි කාලීනව ලබා දී ඇති කඩ කාමර නීත්‍යානුකූල නොවන්නේනම් දීර්ඝ කාලීනව ලබා දෙන කඩ කාමර කිසි දිනෙක නීත්‍යානුකූල නොවන බවත්, දේපල වල අයිතිය තහවුරු කර ගැනීමකින් තොරවද මෙය කිසි සේත් ක්‍රියාත්මක කල නොහැකි බවත්, තවද මේ වන විට ඉදිරිපත් කල ස්ථාන වල පවතින කඩ කාමර වලින් වසා දමා ඇති කඩ කාමර මොනවාද යන්න ඉදිරිපත් කර නොමැති බවත්, මීට ඉහත කිහිප අවස්ථාවකදීම අනුරාධපුර කරුණෑගල මාර්ගයේ පිහිටි ආර්ථික මර්මස්ථානයක් වන ශ්‍රාවස්තිපුර කඩ කාමර වල බදු කරුවන් සමඟ සාකච්ඡා කර ආදායම් උත්පාදන ව්‍යාපෘතියක් වශයෙන් වෙළඳ සංකීර්ණයක් ලෙස අළුත්වැඩියා කිරීමට යෝජනා කලා වුවත්, එයද ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බවත්, කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

අවසාන වශයෙන් පනත ප්‍රකාරව ප්‍රාදේශිය සභාව සතු භූමින් වල අයිතිය තහවුරු කර ගැනීමකට පසුව නිවැරදි ප්‍රසම්පාදන ක්‍රියාවලියකට යටත්ව නිවැරදිව හා අනාගත පරපුරට බාධාවක් හෝ හානියක් නොවන පරිදී බදු දීමකට යාම සුදුසු බවත්, ගරු සභාපතිතුමා මේ සම්බන්ධයෙන් වන ගිවිසුම සකස් කර මහ සභාවට ඉදිරිපත් කරන ලෙසත්, සඳහන් කරමින් කරුණු දැක්වීම අවසන් කරන ලදී.

ගරු මන්ත්‍රී කේ.ඒ සංජීව මැතිතුමා ගරු සභාපතිතුමා විසින් වර්ථමානය වන විට ප්‍රාදේශීය සභාවට අයත් කඩ කාමර වල ගිවිසුම් හි පවතින තත්වය පැහැදිලි කරමින් ගෙනා ආ යෝජනාව කාලෝචිත යෝජනාවක් බව ඇති වී ඇති අඩුපාඩු සම්බන්ධයෙන් කරන ලද සාකච්ජා කිරීම් වලින් පැහැදිලි වන බවත්, මේ සම්බන්ධයෙන් මීට පෙර සිටි ගරු මහ සභාවන් වගකිව යුතු බවත්, ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා ද පාලන පක්ෂයේදී මෙම කාර්යයන් ඉටු වන අවස්ථාවන් වලදී සිට ඇති නමුත් ඒ සම්බන්ධයෙන් සැළකිල්ලක් නොදක්වා කරුණු දක්වීම තුල තමන් කණගාටු වන බවත්, මේ වන විට භූමියේ අයිතිය අප සතුව නොපවතින බැවින් දීර්ඝ කාලීන බදු පදනමකට ගොස් වසරින් වසර ගිවිසුම් අළුත් කිරීමකට යාම සුදුසු බවට ප්‍රකාශ කරන ලදී. ඒ තුල දැනට සිටින කඩ හිමියන් ඔවුන්ගේ කඩ කාමර සුරක්ෂිත වන බවට තහවුරු වීම සිදු වන්නා සේම ඔවුන් දැඩි විස්වාසයකින් කටයුතු කරමින් නිවැරදිව අදාල මුදල් බැදීමේ කාර්යය පවා සිදු කරනු ඇති බව සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී ජේ.ඒ.ඩී විමලසිරි මැතිතුමා සියළු දෙනා ම අදහස් දක්වානු ලබන්නේ ප්‍රාදේශීය සභාව නිවැරදි තැනකට ගෙන ඒම සඳහා වන බවත්, කරන ලද අදහස් දැක්වීම තුල ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා හා ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා වඩා හොඳ අදහස් ඉදිරිපත් කල බවත්, මෙතෙක් කාලයක් මෙම කඩ කාමර බදු දීම් සම්බන්ධයෙන් පවතින අඩුපාඩු නිවැරදි කිරීමක් උදෙසා මෙම යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන බවත්, කඩ හිමියන් බොහෝ පිරිසක් කිසිම ආදායම් තත්වයක් නොපවතිද්දීත්, එම වෙළඳාම සදා ගත් පසු එය වෙනත් පුද්ලගයෙකු වත ලබා දීමේ දි තමන් වෙත මහත් පාඩුවක් වන බවට පවතින් සිතුවිල්ල තුල වර්ථමානය වන තුරු මේ අඩුපාඩු සිදු ඇති වී ඇති බවත්, මෙම යෝජනාව තුලින් ඒ සඳහා විසදුම් හිමි වන බැවින් ගරු සභාපතිතුමා ගෙනා ආ යෝජනාව වඩා සුදුසු බව, සඳහන් කරන ලදී.

තවද මෙහිදී දීර්ඝ කාලීනව බදු ලබා දීම සිදු කරනවා සේම වාර්ෂිකව ගිවිසුම් ගත වී ඇතැම් කොන්දේසි ඇතුලත් කිරීම් හා සංශෝධන ඇතුලත් කිරීම සිදු කරන බවත්, ඒ තුල වාර්ෂිකව සෑම ගිවිසුමක් ම කාලීනව යාවත්කාලීන වන බව සඳහන් කරමින් පවතින්නා වූ වැරදි නිවැරදි කිරීමකට ගොස් අපගේ අයිතිය තහවුරු කර ගනිමින් මෙම කඩ කාමර දීර්ඝ කාලීනව බදු පදනමින් ලබා දීම සුදුසු බවට ප්‍රකාශ කරන ලදී.

ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා ගරු සභාපති තුමා විසින් ඉදිරිපත් කල කරුණු සැළකිල්ලට ගැනීමේදී පැහැදිලි වන්නේ, ගම් සභා කාලය තුල සේම ප්‍රාදේශීය සභාව ස්ථාපිත කිරීමෙන් පසු පත් වී ආ නායකයින් හා ගරු මහජන නියෝජිතයින් කාලයට සුදුසු පරිදි අවශ්‍ය තීරණ ලබා ගෙන නොමැති බවට යන්නත්, මේ තත්වය තුල ශ්‍රාවස්තිපුර කඩ කාමර හා 7 ඇල කඩ කාමර තුල මෙම කාරණය වඩාත් පැහැදිලි වන බවත්, ඒ අනුව ඔවුන්ගේ අණසක පරිදී කටයුතු කල නමුත් සභාවක් ලෙස අප මෙ සඳහා වගකීම දැරිය යුතු වන බවත්, වර්ථමානයේ මෙය නිවැරදි කිරීමක් වෙනුවෙන් සභාවේ නීතිරීතින්ට අදාලව නෛතික පසුබිම සකස් කරගනිමින් ඒ බදු මුදල් අය කර ගැනීමට කටයුතු කල යුතු බවත්, ඒ සඳහා මෙම කඩ කාමර බදු දීම සඳහා ස්ථාන පවරා ගැනීම තුල නෛතික භාවය තහවුරු වන බවත්, දීර්ඝ කාලීන බදු පදනමට යටත්ව බදු දිම සිදු කල යුතුව පවතින්නේ, මෙම ව්‍යාපාර ස්ථාන දියුණු කල හැකි සාර්ථක ව්‍යාපාරිකයන් සඳහා පමණක් වන බවත්, කරුණු දක්වමින් සඳහන් කරන ලද අතර මේ සම්බන්ධයෙන් වන යෝජනාව ගරු සභාපතිතුමා මීට ඉහතදී ඉදිරිපත් කර තිබුනානම් මීට වඩා සුදුසු බවත්, කරුණු දක්වමින් සඳහන් කරන ලද අතර ඉදිරිපත් කල යෝජනාව තුල අසාදු ලේකනය ද ප්‍රකාශයට පත් කරා නම් සුදුසු බවත්, බදු දීම තුල වාර්ෂිකව ගිවිසුම් ගත වීම අනිවාර්යෙන් සිදු කල යුතු වන බවත්, දීර්ඝ කාලීන බදු දීමට ප්‍රථම මේ වන විට ප්‍රාදේශීය සභාව සම්බන්ධයෙන් කිසිදු හැගිමක් නොමැති පුද්ගලයන් වෙත ලබා දීම සුදුසු නැති බවත්, ප්‍රාදේශිය සභාවේ සෑම නීතිමය තත්වයක් සඳහාම එකඟතාවය ලබා ගැනීමේ හැකියාවද පැවිතිය යුතු බවද සඳහන් කරන ලදී.

මෙම යෝජනාව තවදුරටත් අධ්‍යානය කිරීමකින් පසුව මනා අවබෝධයකින් සහා සම්මත කර ගන්නේ නම් වඩා සුදුසු බව සඳහන් කරමින් ඒ තුල අපේක්ෂා කල අරමුණු ඉටු කර ගත හැකි බව ප්‍රාශ කරමින් සිය අදහස් දැක්වීම අවසන් කරන ලදී.

ගරු සභාපති එස්.බි කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් ගරු සභිකවරු දැක්වූ අදහස් සම්බන්ධයෙන් ස්තූති වන්ත වන බවත්, මෙම යෝජනාව ප්‍රාදේශිය සභාව ඉදිරියේ වඩා නිවැරදි ඉසව්වක් කරා ගෙන යාම සඳහා ගෙනා ආ බවත්, එහිදී ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා නෛතික අයිතිය තහවුරු කර ගැනීම සඳහා කටයුතු කල යුතු බවට සඳහන් කලා වුවත්, මෙම භූමි පවරා ගැනීමට සුළු සුළු ගැටළු මතු වී ඇති නමුත් ඒ සඳහා මේ වන විට කටයුතු සූදානම් කරමින් පවතින බවත්, තමන් විසින් ගෙනා ආ යෝජනාව තුලට නෛතික අයිතිය තහවුරු කර ගැනීමටත්, ගරු මන්ත්‍රීතුමා සඳහන් කල පරිදී කාලය නිශ්චිතව සඳහන් කල යුතු බවට කල ප්‍රකාශය කෙරේද අවධානය යොමු කර මෙම සංශෝධන සියල්ල ඇතුලත් කර ඊළඟ මහ සභාවේදී මේ වෙනුවෙන් සකස් කරනු ලබන ගිවිසුමේ කෙටුම්පත ගරු සභිකයින් වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව සඳහන් කරන ලදී.

තව දුරටත් කරුණු දැක්වූ ගරු සභාපතිතුමා ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා කවරක්කුලම කඩ කාමර සම්බන්ධයෙන් ඉදිරිපත් කල තොරතුරු සත්‍ය නොවන බවත්, එහිදි නීත්‍යානුකූලව නැවත පැවරීම සිදු කර ඇති බවත්, අදාල ලිපි හා දිවුරුම් ප්‍රකාශ ලබා ගෙන ගිවිසුම් අතරමැද පවරාදීමකින් තොරව ගිවිසුම් කාලය අවසන් වීමකින් පසුව පමණක් අදාල පැවරීම් සිදු කල බව සඳහන් කරන ලදී.

තවද ප්‍රාදේශීය සභාවට අයත් භූමි ප්‍රාදේශීය සභාව වෙත පවරා ගැනීම සඳහා වූ අවශ්‍ය ලිපි ලේඛන හා ඉල්ලීම් පළාත් පාලන කොමසාරිස් හරහා ගරු ආණ්ඩුකාර තුමාට ඉදිරිපත් කර ඇති බවත්, එතුමා ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කර ඉදිරි කටයුතු සිදු කරනු ලබන බවත්, මේ සභාවේ හෙට දවස ගැන සිතමින් හා වර්ථමානයේ නීත්‍යානුකූල නොවන තත්වයන් නීත්‍යානුකූල කිරීම සඳහා අද දින ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් හොඳ අදහස් දැක්වීම වෙනුවෙන් ස්තූති වන්ත වන බව සඳහන් කරමින් ඉදිරිපත් කල සංශෝධනද ඇතුලත් කර මෙම යෝජනාව වෙනත් දිනයක් සඳහා කල් තැබීම සිදු කරන බවට ප්‍රකාශ කරන ලදී.

<u>ගරු මන්ත්‍රී බී.එම් කේ.ජී.ජී කුමාරිහාමි මැතිණිය</u> මහ සභා වාර්තාව, අයවැය වාර්තාව සහ වරින් වර වරින් වර නිවැරදි නොවන වාර්තා සම්බන්ධයෙන් නිවැරදි කිරීමකට යාම සඳහා තමන් අදහස් ප්‍රකාශ කිරීමකට සූදානම් වූ බවත්, මෙම ගැටළු සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සමඟ සාකච්ඡා කල යුතු බවත්, මෙය ගරු සභාපතිතුමා හෝ රජය හෝ මහ සභාව අපහසුතාවයට ලක් කිරීම සඳහා ගෙන එන අදහස් දැක්වීමක් නොවන බවත්, මේ තුලින් අපේක්ෂා කරනු ලැබුවේ ඉක්මනින් නිවැරදි ඉසව්වක් කරා මහ සභාව ගෙන යාම බවත්, ඒ සඳහා වූ පියවර කඩිනමින් ගන්නා ලෙස ප්‍රකාශ කරන ලදී.

<u>ගරු මන්ත්‍රී පී.එස්.බී සිරිවර්ධන මැතිතුමා</u> අතුරු මාර්ගයක් පිළිසකර කිරීම සම්බන්ධයෙන් ජනතාවගේ අත්සන් සහිතව ලිපියක් ගිය වර මහ සභාවට ඉදිරිපත් කල අවස්ථාවේදී එළඹෙන මහ සභාවට ඉදිරිපත් කරනු ලබන බව ප්‍රකාශ කරමින් ලිපිය භාර ගත් නමුත් මෙවර සභාවට ඉදිරිපත් කර නොමැති වී ඇත්තේ මන්ද යන්න විමසන ලද අතර වර්ථමානය වන විට එම ලිපියේ තත්වය කුමක්ද යන්න විමසන ලදී.

තවද කොට්ඨාශ මට්ටමින් වැසිකිළි ආධාර 06 ක් ඉල්ලීම් කර ඇතත්, තමන් වෙත එක් වැසිකිළි වලක් සඳහා පමණක් අදාල කට්ටල හිම වී ඇති බවත්, කිහිප සැරයක්ම එම ආධාර ඉල්ලීම් කරත් මේ වන තෙක් ලබා දීමට නොහැකි වී ඇති බවත්, සිය කොට්ඨාශයේ ජනතාව ඒ වෙනුවෙන් තව දුරටත් බලා සිටින බවත්, මේ සම්බන්ධයෙන් තමන් දැඩි ලෙස කණගාටු වන බව සඳහන් කරන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> ගරු මන්ත්‍රී තුමන් ලා විසින් ඉදිරිපත් කරනු ලබන සෑම ඉල්ලීමක්ම ඉටු කිරීමේ හැකියාවක් නොමැති නිසා මෙලෙස සභාවට ඉදිරිපත් කල නොහැකි වූවත්, බොහොමයක් ලිපි සංදේශ පෙත්සම් යටතේ හෝ ඉදිරිපත් කිරීමට කටයුතු කරන නමුත් එලෙසද ඉදිරිපත් කිරීමේ හැකියාවක් ප්‍රාදේශීය සභා රීතීන් වලට අනුව නොමැති බවත්, ප්‍රතිපාදනයක් හිමි වූ පසු අදාල ඉල්ලීම් ලිපිය සභා යෝජනාවක් ලෙස ඉදිරිපත් කර ඉටු කර දීමට කටයුතු කරන බවත්, වැසිකිළි වළලු පිරිනැමීමේ වැඩසටහන තුල අදාල ටෙන්ඩර්කරුගේ පවතින අඩුපාඩුවක් නිසා මේ වන විට සැපයීමේ හැකියාවක් නොමැති වී ගොස් ඇති බැවින් ඉදිරියේදී, නැවත අදාල කට්ටල ලබා දීමට කටයුතු කරන බවත් එහි අඩුපාඩුවක් පවතින බව පිළිගන්නා බවත්, සඳහන් කරන ලදී

**02. මුදල් කමිටු නිර්දේශ ක්‍රියාත්මක කිරීම.**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> 2021.04.15 වන දින පැවති මුදල් කමිටුව මගින් ලබා ගත් පහත සඳහන් නිර්දේශ සඳහා මහ සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරන ලද අතර මුදල් කමිටු වාර්ථාවේ බතික් වැඩසටහන සම්බන්ධයෙන් ඉදිරිපත් කල ඇස්තමේන්තුවේ ඇස්තමේන්තු ගත මුදල රු 45,400.00 ලෙස සටහන් වුවත්, අවසාන තීරණය සටහන් කිරීමේදී එය රු 39,400.00 ලෙස දක්වා තිබීම සංශෝධනය වී 45,400.00 ලෙස නිවැරදි විය යුතු බව සඳහන් කරන ලදී.

**I. බතික් පුහුණු වැඩසටහන සඳහා වූ වියදම් ඇස්තමේන්තුව**

ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ පදිංචි කාන්තාවන් ස්වයං රැකියා සඳහා යොමු කිරීමේ අපේක්ෂාව පෙරදැරි කර ගනිමින් තෝරා ගත් කාන්තාවන් 04 දෙනා බැගින් වූ කණ්ඩායම් 05 ක් සහභාගීකරවා ගනිමින් දින 05 ක් තුල විද්‍යා හා තාක්ෂණ නිළධාරී එස්.සී.ඩී එස්.ඩබ් සිරිවර්ධන යන අයගේ සම්පත් දායකත්වය සහිතව පැවැත්වීමට නියමිත බතික් පුහුණු වැඩසටහන සඳහා වූ රු 45,400.00 වියදම් ඇස්තමේන්තුව මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද අතර අදාල පුහුණු වැඩසටහන ක්‍රියාත්මක කිරීම අත්‍යාවශ්‍ය කරුණක් වන බැවින් ඉදිරිපත් කල ඇස්තමේන්තුව ප්‍රකාරව බතික් පුහුණු වැඩසටහන සම්පූර්ණ ඇස්තමේන්තු ගත මුදල වන රු 45,400.00 සිදු කිරීම සුදුසු බවට මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

**II. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වීථි පහන් සකස් කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිල දී ගැනීම.**

ප්‍රාදේශීය සභා බල ප්‍රෙදේශයේ වීථි පහන් සකස් කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිල දී ගැනීම වෙනුවෙන් කැඳවන ලද මිල ගණන් මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද අතර ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් විථි පහන් සවි කිරීම සඳහා අවශ්‍ය බන්ඩල් ටැප් 250 වෙනුවෙන් රු 250.00 අවම මිල ඉදිරිපත් කර ඇති විජයපුර හංදිය, විජයපුර ලිපිනයේ පිහිටි රණසිංහ හාඩ්වෙයාර් වෙතින් සම්පූර්ණ වටිනාකම රු 62,500.00 යටතේ බන්ඩල් ටැප් මිල දී ගැනීමට මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

**III. ප්‍රාදේශීය සභාවට අයත් ZA 5033 දරණ බැකෝ ලෝඩරය සඳහා අවශ්‍ය මෝටරය මිල දී ගැනීම.**

ප්‍රාදේශීය සභාවට අයත් ZA 5033 දරණ බැකෝ ලෝඩරය සඳහා අවශ්‍ය ස්ටාටර් මෝටරය මිල දී ගැනීම වෙනුවෙන් කැඳවන ලද මිල ගණන් මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද අතර අදාල ස්ටාටර් මෝටරය සවි කිරීම අත්‍යාවශ්‍ය කරුණක් බවට යාන්ත්‍රික ඉංජිනේරු විසින් අනුමත කර ඇති බැවින් කැඳවන ලද මිල ගණන් අතරින් වගකීම් කාලය මාස 03 ක් සහිතව රු 48,000.00 අවම මිල ඉදිරිපත් කර ඇති අංක 133/21/ඒ, ඉසුරුපුර, විජයමාවත, අනුරාධපුර ලිපිනයේ පිහිටි කැළුම් ඔටෝ ඉලෙක්ට්‍රිකල්ස් වෙතින් ජපන් වර්ගයේ වොට් 12 ස්ටාටර් මෝටරය සපයා සවි කිරීම සුදුසු බවට මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

**IV. ප්‍රාදේශීය සභාවට අයත්බ්ලොග් ගල් වැඩපල සඳහා අවශ්‍ය සිමෙන්ති මිල දී ගැනීම.**

ප්‍රාදේශීය සභාවට අයත් බ්ලොග් ගල් වැඩපල සඳහා අවශ්‍ය සිමෙන්ති මිල දී ගැනීම වෙනුවෙන් කැඳවන ලද මිල ගණන් මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද අතර කැඳවන ලද මිල ගණන් අතරින් කැකිරාව තත්ව පාලන ඒකකයේ අනුමැතිය සහිත, මාර්ග සංවර්ධන අධිකාරියේ තත්ත්ව පාලනය සහිත හා SLS තත්ත්ව සහතිකය හිමි සිමෙන්ති සඳහා රු 930.00 ක අවම මිල ඉදිරිපත් කර ඇති අංක 184, ඩී.එස් සේනානායක මාවත, අනුරාධපුර ලිපිනයේ පිහිටි නන්දන රොඩ්‍රිගෝ කන්ස්ට්‍රක්ෂන් වෙතින් බ්ලොග් ගල් නිෂ්පාදන මධ්‍යස්ථානය සඳහා අවශ්‍ය හස්ති සිමෙන්ති කොට්ට 50 ක් සම්පූර්ණ වටිනාකම රු 465,000.00 මිල දී ගැනීම සුදුසු බවට මුදල් කමිටුවේදී නිර්දේශ විය.

V. **සරසවි සංහිඳ කලා මංගල්‍ය 2021**

32 වන වරටත් පවත්වනු ලබන උතුරු මැද කළා උළෙලට සමගාමීව පවත්වන සරසවි කළා උළෙල මෙවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය මූලික කරගෙන පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇති අතර ඒ සඳහා අපේක්ෂිත රු 150,000.00 වියදම් ඇස්තමේන්තුව මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද අතර ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තුව ප්‍රකාරව ප්‍රාදේශීය සරසවි සංහිඳ කලා උළෙල නැ.නු.ප ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පැවැත්වීම සුදුසු බවට මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

<u>ගරු මන්ත්‍රී කේ.ඒ සංජීව මැතිතුමා</u> 2021.04.15 වන දින මුදල් කමිටුව මගින් ලබා ගත් නිර්දේශ සඳහා මහ සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී එම්.ඒ විමලසුරේන්ද්‍ර මැතිතුමා ප.ව 12.45 මහ සභා ගර්භයෙන් පිටව යන ලදී.

<u>ගරු මන්ත්‍රී කේ. හැරිසෙන්ස් මැතිතුමා</u> බ්ලොග් ගල් නිෂ්පාදන වැඩපල සඳහා වූ ආදායම් වියදම් සම්බන්ධ වාර්ථාවක් ලබා දීමට කටයුතු කරන්නේ නම් වඩා සුදුසු බවට සඳහන් කරන ලදී

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> ඊළඟ මහ සභාවේ දී බ්ලෝග් ගල් නිෂ්පාදන වැඩපල ආරම්භ කල දින සිට මේ දක්වා වන ආදායම් වියදම් හා ලාභාංශ පිළිබඳ වාර්ථාවක් ලබා දීමට කටයුතු කරන බව දන්වා සිටී අතර , මුදල් කමිටු නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් විරෝධතා පවතින්නේ ද යන්න විමසන ලදී. ඒ අනුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් 2021 අප්‍රේල් මස මුදල් කමිටු නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**03. 2021 මැයි මස සේවකයින්ගේ අතිකාල තක්සේරු වාර්ථා අනුමත කිරීම.**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> 2021 මැයි මසට අදාලව කාර්යය මණ්ඩලය විසින් අතිකාල ඉල්ලීම් කර ඇති අතිකාල තක්සේරු වාර්ථා සභාවට ඉදිරිපත් කරමින් අතිකාල ඉල්ලුම් කර ඇති සේවකයින් වෙත අතිකාල තක්සේරු වාර්තා අනුමත කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

**<u>2021 මැයි</u>**

| | | පැය ගණන |
|---|---|---|
| 01. එච්.එම්.එස්.ඩී චන්ද්‍රසිරි මිය | (කළ.සේවා නිළධාරී) | 60 |
| 02. එස්.එම් මහරගෙදර මිය | (සහකාර ගිණුම් නිළධාරී) | 40 |
| 03. අයි.ජී.සී.එන් වීරකෝන් මිය | (කළ.සේවා නිළධාරී) | 60 |
| 04. එස්.පී.එම් පුෂ්පකුමාරි මිය | (පුස්තකාල සහයක) | 40 |
| 05. කේ.ජී.ජී.ඩී ගමගේ මිය | (පුස්තකාල සහයක) | 40 |
| 06. ඩබ් තිලකරත්න මයා | (කා.කා.ස) | 40 |
| 07. කුමුදු වාසනා වීරසිංහ මිය | (කළ සහකාර (ආවරණ) | 40 |
| 08. ඒ.ඒ පියතිස්ස මයා | (මුරකරු) | 75 |
| 09. ටී.එච්.ඩී.ඩී පෙරේරා මයා | (මුරකරු(ආවරණ) | 75 |
| 10. එම් ආර්.පෙරේරා මයා | (මුරකරු) | 75 |
| 11. ජේ.එම්.ජේ.ආර්.කේ ජයසුන්දර | (විදුලි කාර්මික) | 40 |

| | | |
|---|---|---|
| 12. එස් අන්තෝනි මයා | (මාර්ග කම්කරු) | 40 |
| 13. ඩී.එම් ගුණරත්න බංඩා මයා | (කා.කා සහයක) | 75 |
| 14. සුභාෂ් ගයාෂාන් මයා | (අනියම් රියදුරු) | 40 |
| 15. පියල් බුද්ධික මයා | (අනියම් මාර්ග කම්කරු) | 40 |
| 16. බන්දුල දිසානායක | (මුරකරු ආවරණ) | 40 |

ගරු මන්ත්‍රී කේ.ඒ ශාන්ත මැතිතුමා 2021 මැයි මසට අදාල අතිකාල ඉල්ලුම් කර ඇති සේවකයින්ගේ අතිකාල තක්සේරු වාර්ථා අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපති තුමා කල යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා අතිකාල තක්සේරු වාර්තා අනුමත කිරීම සම්බන්ධව යම් විරෝධතාවයන් පවතීද යන්න විමසූ අතර කිසිදු විරෝධතාවයක් ඉදිරිපත් නොවූ බැවින් 2021 මැයි මස අතිකාල ඉල්ලුම්කල සේවකයින් වෙත අතිකාල තක්සේරු වාර්ථා අනුමත කිරීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**04. බැකෝ ලෝඩරය සඳහා ගෙවූ මුදල් එම කාර්යය ඉටු නොකිරීම මත නැවත ගෙවීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා 2021.03.08 වන දින ලදුපත් අංක 3224 මගින් නව නුවර පාර, නෙළුම්කන්නිය ලිපිනයේ පදිංචි ඩබ්.එම් මධුවන්ත යන අය විසින් ප්‍රාදේශීය සභාවේ බැකෝ ලෝඩරය ලබා ගැනීම වෙනුවෙන් රු 3300.00 මුදලක් ගෙවීම් කර ඇති අතර, බැකෝ ලෝඩරය අක්‍රිය වීම හේතුවෙන් එම කාර්යය ඉටු කිරීමට නොහැකි වූ බව ප්‍රකාශ කරමින්, සභා ආදායමින් ආපසු ගෙවීම සඳහා වන එල්.ජී 32 ආකෘති පත්‍රය මහ සභාවට ඉදිරිපත් කරමින් අදාල මුදල නැවත ගෙවීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී ජේ.ඒ.ඩී විමලසිරි මැතිතුමා අදාල කාර්යය ඉටු නොකිරීම ප්‍රාදේශීය සභාවේ අඩුපාඩුවක් වන බැවින් අදාල නැවත ගෙවීම සඳහා ගරු සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් නව නුවර පාර, නෙළුම්කන්නිය ලිපිනයේ පදිංචි ඩබ්.එම් මධුවන්ත යන අය බැකෝ ලෝඩරය කුලියට ගැනීම වෙනුවෙන් ගෙවන ලද මුදල නැවත ගෙවීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**05. අභිනවයෙන් ඉදි වන නාච්චාදූව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ බෞද්ධ කටයුතු අංශ ගොඩනැගිල්ල සඳහා බ්ලොග් ගල් ලබා දීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා නාච්චාදූව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ බෞද්ධ කටයුතු අංශය සඳහා සුදුසු පරිදී සැකසූ නිශ්චිත ස්ථානයක් නොමැති නිසා කොට්ඨාශයේ ස්වාමීන් වහන්සේලා රාජකාරි කටයුතු සඳහා පැමිණීමේදී ස්වාමීන් වහන්සේලාට මෙන්ම කාර්යාලීය නිළධාරීන්ටද දැඩි අපහසුතාවට ලක් වීමට සිදු වී ඇති බවටත්, මේ හේතුව නිසා ශාසනාරක්ෂක බල මණ්ඩලයේ සහය ලබා ගනිමින් බෞද්ධ කටයුතු අංශය සඳහා සුදුසු ගොඩනැගිල්ලක් ඉදි කර ගැනීමට කටයුතු කලද ඉදිරි ඉදි කිරීම් කටයුතු වන ගොඩනැගිල්ලේ බිත්ති බැදීම සඳහා බ්ලොග් ගල් 500 ක් පමණ අවශ්‍ය වී ඇති බවට ප්‍රාදේශීය ලේකම්තුමා විසින් ඉල්ලීම් කර ඇති බැවින් එම බ්ලොග් ගල් 500 ලබා දීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී කේ.ඒ ශාන්ත මැතිතුමා අදාල ගොඩනැගිල්ල ඉදි කිරීම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අත්‍යාවශ්‍ය කාර්යයක් වන බැවින් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව අදාල බ්ලොග් ගල් 500 ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා ගෙන ආ යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්. බී. කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් අභිනවයෙන් ඉදි වන නාච්චාදූව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ බෞද්ධ කටයුතු අංශ ගොඩනැගිල්ල සඳහා බ්ලොග් ගල් ලබා දීම ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව සිදු කිරීමේ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**06. විජයපුර මංසන්දියේ වැව් මාළු ලැල්ල නැවත සභාවට පවරා ගැනීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා අංක 195/1, තිස්ස මාවත, විජයපුර ලිපිනයේ පදිංචි ඩබ්.ඩබ් අසංක සංජීව යන අය විසින්, විජයපුර මංසන්ධියේ මාළු ලැල්ල 2021 වර්ෂය වෙනුවෙන් ටෙන්ඩර් කර ලබා ගත්තද වැව් මාළු ලැල්ල පවත්වාගෙවන යාමේදී මාළු විකිණීම සඳහා මාළු නොමැති වීම මත මහත්සේ අසීරුතාවයන්ට පත් ව ඇති බවටත්, මාළු ලැල්ල ලබා ගැනීමේදී ඉතා විශාල මුදලකට ලබා ගත් බැවින් සභාව වෙත ගෙවිය යුතු වාරික මුදල් ගෙවීමටද නොහැකි තත්වයකට පත් වී ඇති බැවින් මෙම මාළු ලැල්ල නැවත සභාවට පවරා ගන්නා ලෙස කර ඇති ඉල්ලීම සභාවට ඉදිරිපත් කරමින් මෙහි නැවත නොගෙවන තැම්පත් මුදල සභා සතු කර ගනිමින් විවෘත ටෙන්ඩර් මගින් ටෙන්ඩර් කර සුදුසු පුද්ගලයෙකු සඳහා නැවත ලබා දීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී කේ.ඒ ශාන්ත මැතිතුමා ගරු සභාපතිතුමා සඳහන් කල පරිදී මාළු ලැල්ල ඉදිරියට කර ගෙන යාමේ අපහසුතාවයක් පවතින බවට සඳහන් කර ඇති බැවින් අදාල මාළු ලැල්ල සභාවට පවරා ගෙන නැවත ටෙන්ඩර් කර වෙනත් සුදුසු පුද්ගලයෙකු වෙත ලබා දීමටත් දැනට ඔහු විසින් ගෙවා ඇති මුදල් සභාව සතු කර ගැනීමට කටයුතු කිරීම සුදුසු බවටත් ගරු සභාපතිතුමා ඉදිරිපත් කල යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා සභාව සතු ආදායම් අහිමි කර ගැනීම සිදු කල හැකි කාර්යයක් නොවන බැවින් තමන් මෙම යෝජනාව සඳහා විරුද්ධ වන බව සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී කේ හැරිසෙන්ස් මැතිතුමා සම්පූර්ණ අය කල යුතු මුදල් වලින් කොපමණ මුදලක් මේ වන විට හිමි වී ඇත්ද යන්නත්, මෙම ස්ථානයෙන් මෙම මාළු ලැල්ල ඉවත් කිරීමෙන් පසු අදාල ස්ථානයේ එම ව්‍යාපාරයම ඔහු විසින් පවත්වාගෙන යනවානම් පනත ප්‍රකාරව එය වැළැක්වීමේ හැකියාවක් පවතින බවද කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

තවද මේ සිදුවීමම කවරක්කුලම ආර්ථික මධ්‍යස්ථානයටද සිදු වී ඇති බවත්, අදාල වෙළඳාම ඇති කර ගැනීමෙන් පසුව ඒ ආසන්නයේ එම වෙළඳ කටයුතුම සිදු කිරීමට කටයුතු කිරීම තුල ප්‍රාදේශීය සභාව නීතිමය කටයුතු සිදු කල යුතු බව සඳහන් කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා මෙය රු 615,000.00 ක සම්පූර්ණ ටෙන්ඩර් මුදලකට ගිය මෙම මාළු ලැල්ලේ තැම්පත් මුදලින් 1/3 වන රු 205,000 මේ වන විට ගෙවා ඇති බවත්, කඩ කාමරය සභාවට සභාවට පවරා ගෙන අදාල පුද්ගලයා අසාදු ලේඛන ගත කර නැවත ස්ථානීය බදු දීම් ලෙස ටෙන්ඩර් කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලද අතර අදාල ස්ථානය බදු දීම සම්බන්ධයෙන් හා ඔහු ඒ ආසන්නයේ වෙළඳාම් කටයුතු කිරීම සඳහා පවතින නෛතික තත්වය මත සිදු කරන බව සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී පී.එස්.බී සිරිවර්ධන මැතිතුමා මීට ඉහතදී, කවරක්කුලම පොඩි ඇල ආසන්නයේ මාළු ලැල්ල සඳහාද සිදු වූයේ එවැනිම සිදුවීමක් බවත්, රු 80,000 හා රු 60,000 මාළු ලැලි දෙකම ටෙන්ඩර් මගින් එක් පුද්ගලයෙකු ලබා ගෙන ව්‍යාපාරය සිදු කිරීමට යන අවස්ථාවේදී මීට ඉහතදී ව්‍යාපාරය කරගෙන ගොස් ටෙන්ඩර් මගින් ලබා ගැනීමට කටයුතු නොකල පුද්ගලයා කිසිදු බදු මුදලක් ගෙවීමකින් තොරව වෙළඳ කටයුතු සිදු කල බවත්, අවසානයේදී මුදල් ගෙවූ පුද්ගලයා වෙත සිය වෙළඳ කටයුතු සිදු කර ගෙන යාමට නොහැකි වූ සේම, මාසික වාරික නොගෙවීම මත අසාදු ලේඛන ගත වීමටද සිදු වූ බවත්, අනතුරුව කිසිදු

ටෙන්ඩර් මගින් ලබා ගැනීමකින් තොරව වෙනත් පුද්ගලයින් දෙදෙනෙකු ව්‍යාපාර කටයුතු සිදු කරගෙන ගිය බවත්, මෙය ටෙන්ඩර් මගින් ලබා ගන්නා පිරිසට හා ප්‍රාදේශීය සභාවට වන විශාල පාඩුවක් බව කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී කේ හැරිසෙන්ස් මැතිතුමා</u> මේ සියළු තත්වයන් මත පවතින්නේ ප්‍රාදේශීය සභාව සතු බලය ප්‍රාදේශීය සභාව මගින් ක්‍රියාත්මක කරනවා වෙනුවට වෙළඳුන් භාවිතා කිරීමට දරනු ලබන උත්සහය බව ප්‍රකාශ කරන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> පොඩි ඇල ආසන්නයේ පවතින වෙළඳස්ථානයේ වාරික මුදල් නොගෙවීම සම්බන්ධව එහි බදු කරු අසාදු ලේඛන ගත කර මේ වන විට නඩු පවරා ඇති අතරම මේ වන විට අළුතින් වෙනත් පාර්ශවයක් වෙත නැවත ටෙන්ඩර් කර ලබා දී ඇති බව ද සඳහන් කරන ලදී.

අනතුරුව ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් විරෝධතා පවතින්නේද යන්න විමසූ අතර ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමාගේ පමණක් විරුද්ධත්වය හිමි වී ඇති බැවින් විජයපුර මංසන්දියේ මාළු ලැල්ල සභාවට පවරාගෙන නැවත ටෙන්ඩර් කර සුදුසු පුද්ගලයෙකු වෙත ලබා දීමේ යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

**07. ශ්‍රාවස්තිපුර ආතර්ද සිල්වා ක්‍රීඩා පිටිය අසලින් දිවෙන අතුරු මාර්ගය සම්බන්ධව නිර්දේශ ලබා දීම වෙනුවෙන් පත් කල කමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම.**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> 2021.02.19 දිනැති මහ සභාවේ තීරණ අංක 08 අනුව ශ්‍රාවස්තිපුර ආතර්ද සිල්වා ක්‍රීඩා පිටිය අසලින් දිවෙන අතුරු මාර්ගය සම්බන්ධව නිර්දේශ ලබා දීම සම්බන්ධයෙන් කමිටුවක් පත් කල නමුත්,2021.03.19 මහ සභාවේදී ඇතිවූ මත භේදයන් හමුවේ 2021.03.19 මහ සභාවේ තීරණ අංක 37 ට අනුව නැවත කමිටුවක් නම් කර 2021.03.26 දින සවස 2.00 රැස් වූ අතර එහිදීද පහත සඳහන් නිර්දේශ වලට එළඹුණු අතර එම නිර්දේශ සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරන ලදී.

එහිදී තහවුරු වූයේ, මෙම මාර්ගය දීර්ඝ කාලයක් පරිහරණය කර ඇති බවයි.

මෙම මාර්ගය පරිහරණය කරන, මාර්ගයේ එක් පසක පදිංචි කරුවන් සඳහාත්, ක්‍රීඩා පිටියේ වේදිකාව වෙත පිවිසීමටත් වෙනත් විකල්ප මාර්ගයක් නොමැති බැවින් මෙම මාර්ගය ඉදිරියටත් පරිහරණය කිරීම සඳහා නිදහස් කර දිය යුතු බවට නිර්දේශ විය.

දැනට ක්‍රීඩාංගනය දෙසින් සීමා මායිම් ලකුණු කර නොමැති නිසා එම සීමා මායිම් ලකුණු කිරීමටත්, ක්‍රීඩාංගනය වැඩි දියුණු කිරීමට කටයුතු කල යුතු බවත් තීරණය කරන ලදී.

මේ අනුව අනුරාධපුර කුරුණෑගල ප්‍රධාන මාර්ගයේ මාර්ග රක්ෂිතයේ සිට මාර්ගය ආරම්භ කල යුතු බවත්, පිට්ටනියේ කෙළවර දක්වාම මාර්ගය සංවර්ධනය කල යුතු බවත් තීරණය කරන ලදී.

ඒ අනුව අදාල අතුරු මාර්ගය දිග මීටර් 106 ද පළල මීටර් 04 කින් ද යුතුව භාවිතය සඳහා වෙන් කිරීම සුදුසු බවට කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

<u>ගරු මන්ත්‍රී කේ.ඒ සංජීව මැතිතුමා</u> ශ්‍රාවස්තිපුර ආතර්ද සිල්වා ක්‍රීඩාපිටිය අසලින් දිවෙන අතුරු මාර්ගය ගරු සභාපතිතුමා ඉදිරිපත් කල නිර්දේශ යටතේ සිදු කිරීම සුදුසු බව ප්‍රකාශ කරමින් ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා මෙම යෝජනාව තුල අතුරු මාර්ගය යන ප්‍රකාශය වැරදි සහගත බවත්, මෙම කමිටුවේදී ක්‍රීඩාංගනය දෙසින් සීමා මායිම් ලකුණු කිරීම සඳහා නිර්දේශයකට නොපැමිණි බවත්, සඳහන් කරමින් තමා විසින් මෙම යෝජනාව මේ අයුරින් විය යුතුයි යන්න ප්‍රකාශ කරමින් ක්‍රීඩාපිටිය සම්බන්ධයෙන් සිය යෝජනා ඉදිරිපත් කරන ලදී.

1. ක්‍රීඩාංගනයේ වේදිකාව දක්වා ප්‍රවේශ මාර්ගයක් ඉදි කිරීම සිදු කල යුතු අතර එය ක්‍රීඩාංගනයට අයත් පාරක් මිස පෞද්ගලික හෝ පාරක් නොවේ.
2. පාරට සමාන්තරව ප්‍රශ්නගත ඉඩම මායිමෙන් අඩි 1 ½ පළලින් හා අඩියක පමණ ගැඹුරින් යුක්ත කොන්ක්‍රීට් කණුවක් ඉදි කිරීම
3. නිවැසියන්ට  මෙම මර්ගය භාවිතා කල හැකිය.
4. මෙම මාර්ගය අනාගතයේදී ආතර්ද සිල්වා ක්‍රීඩාංගනය වටා ඉදි වන ඇවිදින මංතීරුවක කොටසක් ලෙස සැළකිය යුතු අතර එය වේදිකාව දක්වා ප්‍රවේශ මාර්ගය ලෙසද සැළකිය යුතුය.
5. නීත්‍යානුකූලව පෞද්ගලික පාරක් ලබා ගැනීම ඔවුන්ට අවශ්‍ය වන්නේ නම් එය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සමඟ සාකච්ඡා කර සුදුසු පියවරක් ගන්න යයි සඳහන් කල යුතුවේ.

ගරු මන්ත්‍රී සුභාෂිණී බණ්ඩාර මැතිණිය ප.ව 1.05 සභ ගර්භයෙන් පිටව යන ලදී.

ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා ආතර්ද සිල්වා ක්‍රීඩා පිටියේ ගැටළුව සම්බන්ධයෙන් ගිය සභා වාරයේදීම ඉදිරිපත් කල නිර්දේශ මෙවර මහ සභාවටද ඉදිරිපත් කරමින්  ඒ සඳහා නෛතික තහවුරුවක් දීමට ගත් උත්සහයක් බවට පෙනී යන බවත්, මේ නිසා පැහැදිළිවම එදත්, අදත්, හෙටත් ක්‍රීඩා පිටිය ආරක්ෂා කල යුතුයි යන මතයේ සිට ඉඩම් හිමියන්ටත් සාධාරණය ඉෂ්ඨ කරමින් ක්‍රීඩා පිටියේ වේදිකාව  පිටුපසින් ඇති කොටසින් මාර්ගය සකස් කර දිය යුතු බවත්, එමගින් ක්‍රීඩා පිටියේ භූමියට හානියක් නොවන බැවින් අප අනාගත දරු පරපුර පිළිබඳ සිතනවා වෙනුවට ව්‍යාපාරිකයින්ගේ සුභ සිද්ධිය ගැන සිතිය යුතු නැති බවත්, තමන් මෙම මාර්ගය ක්‍රීඩා පිටිය තුලින් ලබා දීමට තරයේ විරුද්ධ වන බව සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත ගුණවර්ධන මැතිතුමා ප.ව 1.10 මහ සභාවෙන් පිටව යන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් වූ යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේද යන්න විමසූ අතර, විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා ඉදිරිපත් කල සංශෝධනද ඇතුලත්ව ආතර්ද සිල්වා ක්‍රීඩා පිටියේ ක්‍රීඩාංගනයේ වේදිකාව දක්වා ප්‍රවේශ මාර්ගයක් ලෙස වූ මෙම මාර්ගය, මාර්ගයේ එක් පසක පදිංචි කරුවන් සඳහාත් භාවිතා කල හැකි බවට වූ යෝජනාව දැනට ක්‍රීඩාංගනය දෙසින් සීමා මායිම් ලකුණු කර නොමැති නිසා එම සීමා මායිම් ලකුණු කිරීමටත්, යන ප්‍රකාශය රහිතව ඒකමතිකව සභා සම්මත විය

ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා නෙළුබැව ශ්‍රී පද්මගිරි පුරාණ රජමහ විහාරයේ විහාරාධිපති ස්වාමීන් වහන්සේ  පරලෝසැපත් වී ඇති බවත් හෙට දිනයේ දී ආදාහන කටයුතු සිදු කිරීමට නියමිත බවත්, සභාවට ප්‍රකාශ කරමින් මහ සභාව වෙනුවෙන් අතිශය කණගාටුව ප්‍රකාශ කරන ලද අතර ප.ව 1.15 මහ සභාවෙන් පිටව යන ලදී.

ගරු මන්ත්‍රී කේ හැරිසෙන්ස් මැතිතුමා සෞභාග්‍ය යේ මංපෙත් මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ ඉදිරිපත් කර ඇති මාර්ග සඳහා පළල මීටර් 03 ක් ලෙස දක්වා ඇතත්, එය ප්‍රමාණවත් නොවන බවත්, මෙම මාර්ග වල පළල මීට වඩා වැඩි විය යුතු බවත්, එසේ නොමැතිව ඉදි කිරීම තුල මාර්ගය භාවිතා කරන්නන් දැඩි අපහසුතාවයන්ට ලක් වන බවත්, මේ සම්බන්ධයෙන් තමන් උපදේශක කාරක සභා රැස්වීමකදීද සඳහන් කල බවත්. ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ගරු මන්ත්‍රී තුමා ඉදිරිපත් කල කරුණු සත්‍ය වුවත්, එක් මාර්ගයක් පිළිසකර කිරීම වෙනුවෙන් රු 2,000,000 පමණක් හිමි වන බැවින් මෙය ඉදි කිරීමේදී මීටර් 100 ක්වත් සකස් කිරීමේ හැකියාව නොපවතින නමුත් එසේ මාර්ගය පළල සකස් කිරීමේ අවශ්‍යතාවය සහිත හා මාර්ගයේ පළල පවතින තත්වය අනුව එය ඉදිරියේදී සිදු කරන සංවර්ධන කටයුතු වලදී සැළකිල්ලට ගනු ලබන බව සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා මාර්ග වලට අදාල නිශ්චිත භූමි ප්‍රමාණය ලබා දීමට මාර්ගය දෙපස ජීවත් වන්නන්ට නොහැකි වන්නේනම් හා එවා අත්පත් කර ගැනීමේ හැකියාවක් සභාවට නොමැතිනම්, අදාල මාර්ගය කාණු රහිතව වැටටම සම්බන්ධ කරන ලෙසත්, ඒ අනුව මාර්ගය උස් වන බැවින් ජලය ඉඩම් හරහා හෝ ගලා බසිනු ඇති බවත්, සඳහන් කරන ලද අතර ලැබෙන ප්‍රතිපාදන වලින් 10% ප්‍රමාණයක් හෝ ඉඩම් මැනීම සඳහා භාවිතා කිරීම සිදු කල යුතු බවත්, වසර ගණනාවක් පුරා මේ සඳහා ඉඩ කඩ තිබූ මුත් එය සිදු නොකිරීම ගැටළු සහගත බව සඳහන් කරන ලද අතර හැකි සෑම අවස්ථාවකදීම මාර්ගය සඳහා අවශ්‍ය හා මාර්ගයට නියමිත පළල ස්ථාපිත කර ගනිමින් සංවර්ධන කටයුතු සිදු කිරීමට කටයුතු කරන ලෙස ගෞරවයෙන් ඉල්ලා සිටිමින් අදහස් දැක්වීම අවසන් කරන ලදී.

ගරු මන්ත්‍රී පී.එස්.බී සිරිවර්ධන මැතිතුමා ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා මාර්ගයේ පළල නිසි පරිදි සකස් කල යුතු බවට ප්‍රකාශ කලත් 278 නෙළුම්කන්නිය තුලානේ, අක්කර 50 සේමසිංහ මාවත ගම්පෙරළිය ව්‍යාපෘතිය යටතේ මීටර් 50 ක ප්‍රමාණයක් කොන්ක්‍රීට් කර ඇතත්, බොරළු දමා මාර්ගයේ දෙපස උරහිස සකස් කරන ලෙසට තමන්ද කිහිපවිටක්ම පැවැසුවද මෙතෙක් සකස් කර නොමැති බවත්, එය එසේ තිබියදී ගරු මන්ත්‍රීතුමා සිදු කරනු ලබන ප්‍රකාශ සම්බන්ධයෙන් කණගාටු වන බව සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා 2006 වසරේ තමන් ගරු සභාපති ලෙස පත් වී පැමිණි පසු ජනතාව විසින් කරනු ලැබූ එකම ඉල්ලීම වූයේ මාර්ගයට බොරළු අතුරා දෙන ලෙසට කල ඉල්ලීම් වූ නමුත්, මහින්ද රාජපක්ෂ මැතිතුමා පත් වූ රජය මගින් ගම් මට්ටමේ මාර්ග කොන්ක්‍රීට් කිරීම, කොන්ක්‍රීට් ගල් ඇල්ලීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ආරම්භ කල බවත්, වර්ථමානය වන විට මෙය කාපට් කිරීම දක්වා දියුණු තත්වයකට පත් වී ඇති බවත්, එය රටේද දියුණුව බවත්, කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

**08. සමස්ත දිවයිනම ආවරණය වන පරිදී ග්‍රාමීය ක්‍රීඩා පිටි 335 ක් සංවර්ධනය කිරීමේ ජාතික වැඩසටහන ක්‍රියාත්මක කිරීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා සමස්ත දිවයිනම ආවරණය වන පරිදී ග්‍රාමීය ක්‍රීඩා පිටි 335 ක් සංවර්ධනය කිරීමේ ජාතික වැඩසටහන යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපාදන නිදහස් කිරීම. යටතේ ප්‍රදේශයේ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ සභාපති විසින් යෝජනා කරන ලද සුචරිත ගම පොදු ක්‍රීඩා පිටිය (1,500,000) හා අතුරුවැල්ල ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීම යන ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම්ගේ ලිපියක් මගින් දිස්ත්‍රික් ලේකම් වෙත මේ වන විට එවා ඇති බවත්, එම ව්‍යාපෘති පළාත් පාලන ආයතන හරහා ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය හිමි වී ඇති බැවින් මෙම ව්‍යාපෘති කඩිනමින් නිම කිරීමට කටයුතු කිරීම සඳහා බල ප්‍රදේශයේ ලියාපදිංචි ස්වෙච්ඡා සංවිධානයක් හරහා ගිවිසුම් අත්සන් කර කොන්ත්‍රාත් පදනමින් සංවර්ධනය කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී ජේ.ඒ ජයවර්ධන මැතිතුමා ගරු සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් සුචරිතගම පොදු ක්‍රීඩා පිටිය (1,500,000) හා අතුරුවැල්ල ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීම බල ප්‍රදේශයේ ලියාපදිංචි ස්වෙච්ඡා සංවිධාන හරහා ගිවිසුම් අත්සන් කර කොන්ත්‍රාත් පදනමින් සිදු කිරීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**09.** **කවරක්කුලම කඩ කාමර අංක 04.05.06 කඩ කාමර සභාවට පවරා ගැනීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා කවරක්කුලම කඩ කාමර අංක 04,05,06 2021 වර්ෂය වෙනුවෙන් ටෙන්ඩර් කර බදු පදනමින් ලබා දී ඇතත්, මේ වන තෙක් නැවත නොගෙවන ඇප තැම්පත් මුදල හා 1/3 ක තැම්පතු මුදල පමණක් ගෙවා ඇති අතර ගිවිසුම් අත්සන් කිරීම සඳහා කිහිපවරක් දන්වා ඇති නමුත් මෙතෙක් ගිවිසුම් ගත වීම සඳහා පැමිණ නොමැති බවත්, මේ සම්බන්ධයෙන් අදාල බදුකරුවන් අසාදු ලේඛන ගත වන බවටත්, තැම්පත් මුදල සභා සතු කර ගන්නා බවටත් අවසන් නිවේදන වශයෙන් ලිඛිතව දන්වා ඇති අතර වෙළඳසැල ඉදිරියට ක්‍රියාත්මක කරගෙන යාමට නොහැකි බව බදු කරුවන් වාචිකව දන්වා ඇත.

ඒ අනුව මෙම කඩ කාමර නැවත ප්‍රාදේශීය සභාවට පවරාගැනීමටත්, මෙම කඩ කාමර නැවත ටෙන්ඩර් කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවන බැවින් එය සුදුසු තත්වයට අළුත්වැඩියා කරන තෙක් නැවත ටෙන්ඩර් නොකර සිටීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී පී.ටී සිරිසේන මැතිතුමා ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා මෙම කඩ කාමර අවම ලංසුවක් යටතේ හෝ ව්‍යාපාරයක් ආරම්භ කර යම් තත්වයකට පත් කර ගැනීම වෙනුවෙන් නොමිලේ වර්ෂයක් සඳහා හෝ ලබා දීමට කටයුතු කරන්නේ නම් එළබෙන වර්ෂයේ සිට එම ව්‍යාපාරිකයා ටෙන්ඩර් මගින් තක්සේරු මුදලට කඩ කාමරය ලබා ගනු ඇති බව සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා කවරක්කුලම කඩ කාමර 04,05,06 ප්‍රදේශය වෙත පැමිණෙන වන්දනාකරුවන් සඳහා කාමර පහසුකම් ලබා දිම සඳහා යොදා ගැනීම වෙනුවෙන් තාක්ෂණ නිලධාරී මහතා මගින් වර්ථමානයට ගැලපෙන පරිදී සකස් කර කාමර කුලියට දෙන අයුරින් ලබා දීමට කටයුතු කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා තමන් ගෙන ආ අදහසම ගෙන ඒම සම්බන්ධයෙන් සතුටු වන බව ප්‍රකාශ කරමින් කවරක්කුලම කඩ කාමර අංක 04.05,06 ප්‍රාදේශීය සභාවට පවරාගෙන කාමර පහසුකම් ලබා දීමේ හැකියාව සහිතව අළුත්වැඩියා කිරීමේ යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**10.** **ප්‍රාදේශීය සභාවට අයත්, දේපල බදු දී එහි මුදල් අය කර ගැනීමේදී ප්‍රමාද ගාස්තු ලෙස අය කරනු ලබන 10% ප්‍රතිශතය 3% දක්වා අඩු කිරීම**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ප්‍රාදේශීය සභාවට අයත් දේපල බදු දී එහි මුදල් අය කර ගැනීමේදී ප්‍රමාද ගාස්තු ලෙස මෙතෙක් ගිවිසුම් ගත වී අය කරනු ලබන්නේ 10% ප්‍රතිශතය වුවත්, එය බදු කරුවන් වෙත මහත් අපහසුතාවයක් වන බැවින් එම ප්‍රතිශතය 3% දක්වා අඩු කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

තවද ගිවිසුම් ගත වීමේදී 10% ලෙස සටහන් කර ඇති බවත්, මේ තුල ව්‍යාපාරිකයින් දැඩි අපහසුතාවයකට පත් වන බවත්, එක් වාරිකයක් හෝ ගෙවීම් පැහැර හැරීමක් සිදු කල හොත් එහි දඩ මුදලද විශාල ප්‍රමාණයකින් වැඩි වන බවත් සඳහන් කරමින් ආණ්ඩුකාර තුමාගේ අනුමැතියකින් මෙහි බදු ප්‍රතිශතය සංශෝධනය කිරීම සුදුසු බවට ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී කේ. ඒ සංජීව මැතිතුමා නැවත ගිවිසුම් ගත වන අවස්ථාවේදී ප්‍රාදේශීය සභාවට අයත් දේපල බදු දී එහි මුදල් අය කර ගැනීමේදී ප්‍රමාද ගාස්තු ලෙස මෙතෙක් ගිවිසුම් ගත වී අය කරනු ලබන්නේ 10% ප්‍රතිශතය වුවත්, එය බදු කරුවන් වෙත මහත් අපහසුතාවයක් වන බැවින් එම ප්‍රතිශතය 3% දක්වා අඩු කිරීම ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව සිදු කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් නැවත ගිවිසුම් ගත වන අවස්ථාවේදී ප්‍රාදේශීය සභාවට අයත් දේපල බදු දී එහි මුදල් අය කර ගැනීමේදී ප්‍රමාද ගාස්තු ලෙස මෙතෙක් ගිවිසුම් ගත වී අය කරනු ලබන්නේ 10% ප්‍රතිශතය වුවත්, එය බදු කරුවන් වෙත මහත් අපහසුතාවයක් වන බැවින් එම ප්‍රතිශතය 3% දක්වා අඩු කිරීම ආණ්ඩුකාර තුමාගේ අනුමැතියට යටත්ව සිදු කිරීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**11. ZA 5033 බැකෝ ලෝඩරය රක්ෂණය කිරීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ප්‍රාදේශීය සභාවට අයත්, ZA 5033 බැකෝ ලෝඩරය රක්ෂණය කිරීම වෙනුවෙන් ජාතික රක්ෂණ භාර අරමුදල විසින් ඉදිරිපත් කර ඇති රු 44,236 .36 ඇස්තමේන්තුව මහ සභාවට ඉදිරිපත් කරන ලද අතර ඉදිරිපත් කර ඇති ඇස්තමේන්තුව ප්‍රකාරව අදාල බැකෝ ලෝඩරය රක්ෂණය කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී කේ.ඒ ශාන්ත මැතිතුමා ප්‍රාදේශීය සභාවට අයත්, ZA 5033 බැකෝ ලෝඩරය රක්ෂණය කිරීම ජාතික රක්ෂණ භාර අරමුදල මගින් ඉදිරිපත් කර ඇති රු 44,236.00 ඇස්තමේන්තුව ප්‍රකාරව සිදු කිරීම සුදුස බවට ගරු සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් ජාතික රක්ෂණ භාර අරමුදල වෙතින් ඉදිරිපත් කර ඇති රු 44,236 ක ඇස්තමේන්තුව ප්‍රකාරව ZA 5033 දරණ බැකෝ ලෝඩරය රක්ෂණය කිරීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත වීය.

**12. තරියන්කුලම සුසාන භූමියේ ඉදිවන ගොඩනැගිල්ල සඳහා වහලය ඉදි කිරීමට අවශ්‍ය ඇස්බැස්ටෝස් ශීට් ලබා දීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා මේ වන විට සිය බිරිඳ අකාලයේ මිල යාම හේතු කොට ගෙන පුද්ලගයෙකු විසින් තරියන්කුලම පොදු සුසාන භූමියේ සොහොන් ගෙයක් සකස් කිරීම සඳහා කටයුතු සිදු කරමින් යන බැවින් ඒ සඳහා අවශ්‍ය ඇස්බැස්ටෝ ශීට් ලබා දෙන ලෙසට ඉල්ලීම් කර ඇති බව ප්‍රකාශ කරමින් ඒ සඳහා ඇස්බැස්ටෝ ශීට් අඩි 10 ප්‍රමාණයෙන් 16 ක් ලබා දීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා අදාල ගොඩනැගිල්ල සඳහා අවශ්‍ය ඇස්බැස්ටෝ ශීට් සම්පූර්ණ ප්‍රමාණයම ලබා දීමට කටයුතු කරන ලෙස ප්‍රකාශ කරමින් ගරු සභාපතිතුමා ගෙන ආ යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් තරියන්කුලම පොදු සුසාන භූමියේ ඉදිවන ගොඩනැගිල්ල සඳහා වහලය ඉදි කිරීමට අවශ්‍ය ඇස්බැස්ටෝස් ශීට් අඩි 10 ප්‍රමාණයෙන් 16 ලබා දීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**13.** **ඥාණික්කුලම 03 කණුව වංගුව අසල වැව් මාළු ලැල්ල නැවත ටෙන්ඩර් කිරීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා 236 තුලානේ යහලේගම පදිංචි ජී ධර්මසිරි යන අය විසින් ඥාණික්කුලම 03 කණුව අසල වැව් මාළු ලැල්ල සඳහා නැවත නොගෙවන තැම්පතු මුදල වන රු 5000 හා බදු මුදල් වලින් රු 5666 ක් ගෙවා ඇති මුත් මේ වන විට තමා අසනීප තත්වයේ පසුවන බැවින් ව්‍යාපාරය කරගෙන යාමට නොහැකි බවට දන්වා ලිපියක් ඉදිරිපත් කර ඇති බැවින් ඔහුගේ ගිවිසුම අවලංගු කර මාළු ලැල්ල ප්‍රාදේශීය සභාවට පවරාගෙන නැවත ටෙන්ඩර් කිරීම සුදුස බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී ගයාන් චාමර මැතිතුමා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් ඥාණික්කුලම 03 කණුව අසල වැව් මාළු ලැල්ල ප්‍රාදේශිය සභාවට පවරා ගෙන නැවත ටෙන්ඩර් කිරීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**14.** **කාර්යය මණ්ඩල නිළධාරීන් වෙත නිළ හැඳුනුම්පත සකස් කර ලබා දීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ප්‍රාදේශීය සභාවේ සේවය කරනු ලබන සේවකයින් විසින් ඔවුගේ රාජකාරි හැඳුනුම්පත් නිසි පරිද නොවන බැවින් කොරෝනා වසංගත තත්වය හේතු කර ගෙන මෙන්ම ක්ෂේත්‍ර රාජකාරි සිදු කිරීමේදී විවිධ අපහසුතාවයන්ට ලක් වන බව ප්‍රකාශ කර ඇති හෙයින් ඔවුන් වෙනුවෙන් සම්පූර්ණ රාජකාරි හැඳුනුම්පත් 49 සකස් කර දීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී ගයාන් චාමර මැතිතුමා ගරු සභිකවරුන් සඳහාද හැඳුනුම්පත් සකස් කර දෙන ඉල්ලා සිටිමින් අදාල යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් ගරු සභිකවරුන් සඳහා මෙන්ම සභා සේවකයින් සඳහා රාජකාරි හැඳුනුම්පත් සකස් කිරීමේ යෝජනාව ඒකමතිකව සභා සමම්ත විය.

**15.** **නාච්චාදූව සති පොල සංවර්ධනය කිරීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා නාච්චාදූව අතුරුවැල්ල සතිපොල සංවර්ධනය කිරීම සඳහා සකස් කල ව්‍යාපෘති යෝජනා හා විස්තරාත්මක ඇස්තමේන්තු නිවැරදිව සකස් කර සහකාර පළාත් පාලන කෙමසාරිස්ගේ නිර්දේශය සහිතව පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය වෙත යොමු කරන ලෙසට දන්වා යොමු කර ඇති ලිපිය මහ සභාවට ඉදිරිපත් කරමින් එම ව්‍යාපෘතිය අනුමත වී පැමිණි පසු ක්‍රියාත්මක කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී පී.ටී සිරිසේන මැතිතුමා ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් නාච්චාදූව අතුරුවැල්ල සතිපොල සංවර්ධනය කිරීම වෙනුවෙන් ව්‍යාපෘති වාර්තාව හා ඇස්තමේන්තුව අනුමැතිය සඳහා යොමු කිරීමටත්

යෝජනාව අනුමත වී පැමිණි පසු බල ප්‍රදේශයේ ස්වෙච්ඡා සංවිධානයක් හරහා ගිවිසුම් අත්සන් කර කොන්ත්‍රාත් පදනමින් සිදු කිරීමේ යෝජනාව ඒකමතිකව සභාසම්මත විය.

**16. පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන 2021 ක්‍රියාත්මක කිරීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන 2021 වැඩසටහන යටතේ,ක්‍රියාත්මක කල යුතු ව්‍යාපෘති මහ සභාවට ඉදිරිපත් කරමින් එම ව්‍යාපෘති බල ප්‍රෙද්ශයේ ලියාපදිංචි ස්වෙච්ඡා සංවිධාන හරහා ගිවිසුම් අත්සන් කර කොන්ත්‍රාත් පදනමින් සිදු කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

| අනු අංකය | ව්‍යාපෘතිය/ක්‍රියාකාරකම | අනුමත මුදල රු |
|---|---|---|
| 01 | නිදන්ගල මාර්ගය මීටර් 700 ක් අළුත්වැඩියා කිරීම හා සංවර්ධනය කිරීම | 1,000,000.00 |
| 02 | 5 ඇල අතුරු මාර්ගය ප්‍රභාත් මහතාගේ නිවස අසල සිට මීටර් 100 ක් කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීම | 1,000,000.00 |
| 03 | කුඩා කවරක්කුලම පාර නුවර පාරේ සිට මීටර් 700 ක් බොරළු දමා සංවර්ධනය කිරීම | 550,000.00 |
| 04 | තරියන්කුලම නළ ළිඳ පාර මීටර් 150 ක් කුට්ටි ගල් ඇතිරීම | 1,500,000.00 |
| 05 | කීරික්කුලම ජල පෙරණ පද්ධතියක් ස්ථාපනය කිරීම | 2,000,000.00 |
| 06 | ශ්‍රාවස්තිපුර පිහිටි පොදු වැසිකිළිය සඳහා ජල පහසුකම් ලබා දීම. | 350,000.00 |

ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා මේ වන විට නිදන්ගල මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම ආරම්භ කර ඇති බවත්, මීට ඉහතදී මෙය මහ සභාවට ඉදිරිපත් කර ගිවිසුම් අත්සන් කර නොමැතිනම් මාර්ගය පළුදු කිරීම වෙනුවෙන් අදාල කොන්ත්‍රාත්කරුවන්ට හෝ පුද්ගලයින්ට විරුද්ධව පොලිසියේ පැමිණිල්ලක් දැමිය යුතු බවත්, මෙය සුළු කොට සැළකිය යුතු නොවන බවත් සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා හොඳට තිබුණු මාර්ගය කි.මී 1.5 පමණ මේ වන විට පළුදු කර ඇති හෙයින් සම්පූර්ණ මාර්ගය සඳහා වැස්මක් යෙදිය යුතු ම වන බව සඳහනක් කරන ලද අතර ශ්‍රාවස්තිපුර පිහිටි පොදු වැසිකිළිය වෙත ප්‍රවිශ්ඨ වීම සඳහා කාණුව හරහා කොන්ක්‍රීට් කැට කිහිපයක් අතුරන ලෙසද ප්‍රකාශ කරන ලදී.

තවදුරටත් අදහස් දැක්වූ ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා 5 ඇල අතුරු මාර්ගය ප්‍රභාත් මහතාගේ නිවස අසල සිට මීටර් 100 ක් කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීම ව්‍යාපෘතිය හා නිදන්ගල මාර්ගය මීටර් 700 ක් අළුත්වැඩියා කිරීම හා සංවර්ධනය කිරීම ව්‍යාපෘතිය එකම කොට්ඨාශයක ක්‍රියාත්මක වන ව්‍යාපෘති වන බැවින් 5 ඇල අතුරු මාර්ගයේ ප්‍රතිපාදනද නිදන්ගල මාර්ගය වෙනුවෙන් භාවිතා කර නිදන්ගල මාර්ගය හැකි ප්‍රමාණයෙන් හෝ සංවර්ධනය කිරීම සුදුසු බව ප්‍රකාශ කරමින් නිදන්ගල මාර්ගය මීටර් 700 ක් අළුත්වැඩියා කිරීම හා සංවර්ධනය කිරීම සඳහා 5 ඇල අතුරු මාර්ගය ප්‍රභාත් මහතාගේ නිවස අසල සිට මීටර් 100 ක් කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීම ව්‍යාපෘතියේ ප්‍රතිපාදනද යොදා ගැනීම සුදුසු බවට යෝජනා කරන ලදි.

ගරු මන්ත්‍රී කේ.ඒ සංජීව මැතිතුමා 5 ඇල අතුරු මාර්ගය ප්‍රභාත් මහතාගේ නිවස අසල සිට මීටර් 100 ක් කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීම ව්‍යාපෘතිය හා නිදන්ගල මාර්ගය මීටර් 700 ක් අළුත්වැඩියා කිරීම හා සංවර්ධනය කිරීම ව්‍යාපෘතිය එකම කොට්ඨාශයක ක්‍රියාත්මක වන ව්‍යාපෘති වන බැවින් 5 ඇල අතුරු

මාර්ගයේ ප්‍රතිපාදනද නිදන්ගල මාර්ගය වෙනුවෙන් භාවිතා කර නිදන්ගල මාර්ගය හැකි ප්‍රමාණයෙන් හෝ සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු මන්ත්‍රී ආර්. එම් කුමාරසිංහ මැතිතුමා ගෙනා යෝජනාව හා ප්‍රතිපාදන හිමි වී ඇති ව්‍යාපෘති බල ප්‍රදේශයේ ලියාපදිංචි ස්වෙච්ඡා සංවිධාන හරහා ගිවිසුම් අත්සන් කර කොන්ත්‍රාත් පදනමින් සිදු කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ගයාන් චාමර මැතිතුමා</u> සෑම වර්ෂයක් පසාම හිමි වන පළාත් නිශ්චිත වැඩසටහන යටතේ බල ප්‍රදේශයටම සමාන වන සේ අදාල ප්‍රතිපාදන වෙන් කර දීම සිදු කල මුත් මේ වර්ෂය තුල කොට්ඨාශ කිහිපයක් ආවරණය වන පරිදී පමණක් ප්‍රතිපාදන වෙන්වී යෝජනා අනුමත වී ඇති බැවින් මෙවර එසේ සිදු වීමට යෝජනා ඉදිරිපත් කල ක්‍රමවේදය කුමක්ද යන්න විමසන ලද අතර අදාල ඉල්ලීම් සඳහන් කරමින් යොමු කර ලිපි ඇත්නම් එම ලිපිය සභා ගත කරන ලෙස ප්‍රකාශ කරන ලදී.

තවද ගරු සභාපතිතුමා විසින් ලැබී ඇති ප්‍රතිපාදන සෑම කොට්ඨාශයක්ම ආවරණය වන පරිදී බෙදා ව්‍යාපෘති ක්‍රියාත්මක කරන බවට ප්‍රකාශයක් මීට පෙර ප්‍රකාශ කර තිබෙන බැවින් හා ව්‍යාපෘති සංශෝධනය කිරීමේ හැකියාව පවතින බැවින් පළාත් නිශ්චිත වැඩසටහන යටතේ හෝ සභා අරමුදලින් හෝ කොට්ඨාශ සියල්ල ආවරණය වන පරිදි සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලෙස ප්‍රකාශ කරන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> සෑම කොට්ඨාශයක්ම නියෝජනය වන පරිදි ගරු මන්ත්‍රීවරුන් හරහාම ලබා ගත් යෝජනා තමන් විසින් ඉදිරිපත් කර ඇති බවත්, ලැබී ඇති ප්‍රතිපාදන සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීවරුන්ගේ යෝජනාද සමඟින් ගරු ආණ්ඩුකාරතුමා හමුවීමට ගිය අවස්ථාවේදී, මෙම ක්‍රියාදාමය සෑම ප්‍රාදේශීය සභාවක් වෙතම සිදු වී ඇති බවටත්, සිදු වී ඇති අසාධාරණය වෙනුවෙන් කොට්ඨාශයන් සඳහා නැවත වෙනම යෝජනා අනුමත කර දීමට පොරොන්දුවක් ලබා දුන් බවත්, ඒ අනුව මේ වන විට නැවත එම යෝජනා ඉදිරිපත් කර ඇති බවත්, ඒ සඳහා ඉදිරියේදී ප්‍රතිපාදන හිමි වන බවත් සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ජේ.ඒ.ඩී විමලසිරි මැතිතුමා</u> කොට්ඨාශ මට්ටමින් අඩුවෙන්ම ප්‍රතිපාදන හිමි වන්නේ තම කොට්ඨශයට බවත් එහි එක් තුලානක් පමණක් තිබුණු මුත් අනෙක් කොට්ඨාශ වලට සාපේක්ෂව ජනගහණය ඉතාම කුඩා ප්‍රමාණයක අඩුවීමක් පමණක් තිබෙන බවත්, මාර්ග පද්ධතිය ඇතුළු සංවර්ධනය කල යුතු ස්ථාන හා වැඩ විශාල ප්‍රමාණයක් සිය කොට්ඨාශය තුල පවතින බවත්, ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කර ලැබී ඇති ප්‍රතිපාදන වලින් හෝ ගරු ආණ්ඩුකාරතුමා ලබා දෙන ප්‍රතිපාදන වලින් හෝ සෑම කොට්ඨාශයක්ම ආවරණය වන පරිදී ප්‍රතිපාදන සංශෝධනය කර දෙන ලෙස ප්‍රකාශ කරන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් යෝජනාව සභා සම්මත වූ අතර ගරු ආණ්ඩුකාරතුමා විසින් මේ වන විට ප්‍රතිපාදන ලබා දී නොමැති කොට්ඨාශ සඳහා ප්‍රතිපාදන ලබා දෙන තුරු ඉදිරිපත් කල ව්‍යාපෘති සඳහා ගිවිසුම් අත්සන් කිරීම තාවකාලිකව නතර කරන බව සඳහන් කරන ලදී.

**ඊ) කාරක සභාවල වාර්තා**

- 2021 අප්‍රේල් මස 05 වන දින මුදල් කමිටු වාර්තාව

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා 2021.03.05 වන දින මුදල් කමිටු වාර්ථාවේ බතික් පුහුණු වැඩසටහන වෙනුවෙන් වූ ඇස්තමේන්තුව සඳහා නිර්දේශය ලබා දුන් බවට සඳහන් සටහනේ රු 39,400.00 ලෙස සටහන් වූවත් එය රු 45,400.00 ලෙසට සංශෝධනය විය යුතු බව සඳහන් කරන ලදී.

**සභා ගත කරන ලදී.**

**එ) ලැබීම් ගෙවීම් මාසික වාර්තා**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> මාර්තු මස ආදායම් වාර්ථාවේ 4109 ආදායම් ශීර්ෂයෙහි තව දුරටත් ලැබිය යුත ආදායම ලෙස රු 2,308,720 ලෙසට දක්වා ඇතත් එය 1,547,400 ලෙසට සංශෝධනය විය යුතු බව සඳහන් කරන ලද අතර 2021 පෙබරවාරි සහ මාර්තු මාස වල ආදායම් වාර්ථාවෙහි ........... දක්වා ලැබීම් තීරුව තුල 2020.02.28 හා 2020.03.31 ලෙසට දක්වා ඇතත් එය 2021.02.28 හා 2021.03.31 ලෙසට සංශෝධනය විය යුතු බව සඳහන කරන ලදී.

2021 ජනවාරි මස සිට මාර්තු මස දක්වා ආදායම් හා වියදම් වාර්ථා මහ සභාවේ සලකා බැලීම සිදු කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා</u> වියදම් වාර්ථාවේ පරිපාලන වියදම්, සේවක වැටුප් , මන්ත්‍රී දීමනා හැර අනෙකුත් ගෙවීම් සඳහා විරුද්ධ වන බව සඳහන් කරන ලදී.

**ඒ) රැස්වීම් කැඳවීමේ දැන්වීම් හා වෙනත් කාරණා ඉදිරිපත් කිරීම.**

<u>ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා</u> තමන් මීට ඉහතදී හියුම් පයිප්ප ස්ථානගත කිරීම සම්බන්ධව විස්තර වාර්තාවක් ලබා දෙන ලෙසට ඉල්ලීම් කලත් එය ලබා දීමට කටයුතු නොකල බවත්. අයවැය සභා සම්මත කිරීම සිදු කලා වුවත්, එහි යම් යම් වැරදි හා අඩුපාඩු පැවති බැවින් එය නැවත නිවැරදි කර ලබා දෙන බවට ප්‍රකාශ කලත් එය මෙතෙක් නිවැරදි නොකල බවත්, විථි ලාම්පු අළුත්වැඩියා කිරීමේදී සෑම විදුලි පහනක්ම ආවරණය වන පරිදි සිදු කිරීමට වග බලා ගන්නා ලෙස ප්‍රකාශ කරන ලදී.

<u>ගරු මන්ත්‍රී පී.එස්.බී සිරිවර්ධන මැතිතුමා</u> ගරු මන්ත්‍රීතුමා විථි පහන් සම්බන්ධයෙන් ප්‍රකාශ කලත් කවරක්කුලම කුඩා වැව ගම්මානයේ විථි පමන් සවි කිරීමේදී එක් වයරයක් තුවාල කර බල්බ 05 ක් සඳහා සම්බන්ධතාවය ලබා දී ඇති බවත්, ඒ සම්බන්ධයෙන් එම ආණ්ඩුව වගකීම භාර ගත යුතු බව සඳහන් කරන ලද අතර මේ හේතුව නිසා තමන්ද දැඩි ලෙස අපහසුතාවයට ලක් වන බව සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී බී.ඒ.ජී.එම්.කේ.ජී.ජී කුමාරිහාමි මැතිණිය</u> සභා බල ප්‍රදේශයේ මාර්ග ප්‍රතිසංස්කරණය වෙනුවෙන් බොරළු මිල දී ගැනීම සිදු කල සැපයුම්කාරිණිය වෙත අසාධාරණයක් සිදු වී ඇති බව ප්‍රකාශ කරමින්, ගරු සභාපතිතුමාගේ අනුමැතිය යටතේ, යෝධ ඇල පාර සඳහා බොරළු ලෝඩ් දෙකක් ලබා දෙන ලෙස කරන ලද ඉල්ලීමට අනුව සභාවේ ලොරි රථයෙන් බොරළු රැගෙන පැමිණි පසු වරා ගස අසල සිට වලවල් සඳහා බෙරළු කොටස් වශයෙන් බාන ලෙසට රියදුරු දැනුවත් කලත් තාක්ෂණ නිළධාරී විසින් නැවත පැමිණෙන ලෙසට කල ඉල්ලීම අනුව රියදුරු විසින් එකවරම බොරළු මාර්ගය මත බිම හෙලා නැවත පැමිණි බවත්, පසුව ප්‍රදේශ වාසීන්ගේ සහයෙන් මාර්ගයේ වලවල් වසාගත් නමුත් එම බොරළු සඳහා ගෙවීමේ හැකියාවක් නොමැති බව ප්‍රකාශ කරමින් සැපයුම්කරුගේ බිල්පතින් කපා හැර ඇති බවත්, මෙවැනිම වරදක් ගරු උප සභාපතිතුගේ කෝට්ඨාශය සඳහා ලබා දුන් බොරළු වලින්ද වාර්තා වී ඇති බවත්, මේ සම්බන්ධයෙන් ගරු සභාපතිතුමාගේ අවධානය යොමු කරන ලෙස ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා මේ සම්බන්ධයෙන් වන ගැටළු සහිත මාර්ග ලැයිස්තුව තමා වෙත ලබා දීමට කටයුතු කරන ලෙසත් ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන බවත් ප්‍රකාශ කරමින්, බල ප්‍රදේශයේ ජනතාවගේ සුභ සිද්ධිය උදෙසා තීන්දු තීරණ ගැනීම වෙනුවෙන් ගෞරවයෙන් සහයෝගය දැක්වූ දන්නා හා නොදන්නා කරුණ සම්බන්ධයෙන් විවිධ අදහස් සියළු දෙනාම එක්වී යහපත් චේතනාවෙන් යුතුව ඉදිරිපත් කල ගරු මන්ත්‍රිතුමන්ලා වෙත හා ගරු මන්ත්‍රිතුමියන්ලා වෙත ස්තුතිය ප්‍රකාශ කරමින් 2021.04.27 වන දින පැවැත්වූ මහ සභා රැස්වීම ප.ව 02.15 ට අවසන් කරන ලද අතර එළඹෙන මහ සභාව 2021.05.21 වන දින පෙ.ව 10.00 පැවැත්වෙන බව සඳහන් කරන ලදී.

....................................

යූ.ඒ ධම්මික,
ලේකම්,
නැ.නු.ප ප්‍රාදේශීය සභාව,
විජයපුර.

..........................................

එස්.බී කුමාරදාස මැතිතුමා
සභාපති ,
නැ.නු.ප්‍රාදේශීය සභාව,
විජයපුර.